# 2018/06/12 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2018.06.12 වන දින පෙ.ව. 09.00 ට නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය -**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම් කේ ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ එච් වී අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ් ජී නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී වි සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 7. | එච් ජී තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච් කේ ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන් ජී ගයාන් මදුසංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි  ගණේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රී |
| 14. | එඩේර ආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපේ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රී |
| 19. | එම්. එම්. දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන් ඩබ් පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ කේ අයි නේරංජලී මහත්මිය | ගරු මන්ත්‍රී |
| 23. | කේ ඒ සී  දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රී |
| 24. | එච් එච් ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රී |
| 25. | ඩබ් කේ නෙලී මහත්මිය | ගරු මන්ත්‍රී |
| 26. | වී ජී අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී ජී රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

ආගම සිහිකිරීමෙන් අනතුරුව රට දැය වෙනුවෙන් ජීවිතය පූජා කරමින් අපේ භෞතික අඛණ්ඩතාවය ආරක්ෂා කල රණවිරුවන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ඥාතී හිතයිෂීන්

තමන්ගේ මියගිය දේශපාලන නායකයින් ඒ වගේම සභාව නියෝජනය කරමින් අප හැර ගිය සභාපතිතුමන්ලා සහ සභා නියොජිතයින් සිහිපත් කිරීමට විනාඩියක නිශ්ශබ්දතාවයක් මම අපේක්ෂා කරනවා.

**02. ගරු සභාපතිතුමාගේ පිළිගැනීමේ කතාව**

ගරු නියෝජ්‍ය සභාපති ගාමිනී සුසන්ත මැතිතුමන් ඇතළු ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. අද දින නාගොඩ ප්‍රාදේශීය සභාවේ තුන්වන සභා වාරය ආරම්භ කරන අතර අපේ දැනුම්දීම මත මෙම අවස්ථාවට පැමිනි නියෝජ්‍ය සභාපතිතුමන් ඇතුළු සියළුම ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් පිළිගනු ලබනවා. වෙනදා මෙන්ම අපේ ගරු මන්ත්‍රීවරුන් සභාවේ ඉදිරි කටයුතු කර ගෙන යාමට සාමූහිකව ඒකරාශි වී අවශය සහයෝගය ලබා දෙතැයි මා බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ප්‍රදේශයේ දියුණුව උදෙසා තම අදහස් යෝජනා ඉදිරිපත් කරන්නැයි ඉල්ලා සිටිමින් නැවත වරක් ඔබ සියළු දෙනා ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමින් මා නිහඬ වෙනවා.

**03. 2018.05.08 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇතිනම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම,**

ඒ අනුව 2018-05-08 දින පැවති සංශෝධිත මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගත හැකි බවට ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝෂනා කල අතර ගරු මන්ත්‍රිනි නෙලී වක්වැල්ල මහත්මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී. ඉන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**04. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම.**

I. ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ආවරණ අනුමැතියට යටත්ව සිදු කරනු ලබන ගණුදෙනුවල සීමාව පනවා ගැනීමේ යෝජනාව හා සම්බන්ධව කරුණු ඉදිරිපත් කර ඇති අතර පසුගිය වාර්ථාවේ සඳහන්ව ඇති ආවරණ අනුමැතියට අනුව මසකට සිදු කල හැකි ගණුදෙනුවල සීමාවක් නැත යන කරුණ සංශෝධනය කරන  අතර ආවරණ අනුමැතියට යටත්ව අවශ්‍යතාවය පරිදි මසකට ගණුදෙනු සීමාසහිතව සිදු කල හැකි බව එතුමා විසින් යෝජනා කල අතර චන්ද්‍රා සහබන්දු මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී. ඒ අනුව එකී කරුණ මත ආවරණ අනුමැතියට යටත්ව අවශ්‍යතාවය අනුව මසකට ගණුදෙනු සීමාසහිතව සිදු කල හැකි ලෙස සංශෝධනය විය.

II. 2018.05.08 දින වාර්තාවේ මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය යටතේ නම් සදහන් කර ඇති අතර ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මියගේ නම අරුණ ශාන්ත මහතා ලෙස දක්වා ඇති බැවින් ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය ලෙස එම නම සංශෝධනය විය.

III. ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා පරණතානායම්ගොඩ පඹගොඩ වතුරාව මාර්ගය සංවර්ධනයට රු. 1000000.00 ක් වෙන්වීම සම්බන්ධව 2018.05.08 දින පැවති සභා වාර්තාවේ එතුමන් විසින් ඒ පිළිබදව විපක්ෂව කරුණු දක්වන බව ප්‍රකාශ කර තිබූ අතර ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා පඹගොඩවතුරාව මාර්ග සංවර්ධනය පිළිබදව විපක්ෂව කරුණු දැක්වීමක් නොකල අතර ඒ සම්බන්ධව

පැහැදිලි කර ගැනීම සඳහා අදහස් විමසීමක් කළ බවට 2018.05.08 දින සභාවාර්තාව සංශෝධනය විය.

IV. ගරු මන්ත්‍රී එන්. වී. සමන් මහතාද 65 මාර්ගයට රු. 2000000.00 ක් වෙන්වීම සම්බන්ධව එම මාර්ගය සෑදීම සම්බන්ධව විපක්ෂව කරුණු ඉදිරිපත් කර ඇති ලෙස 2018.05.08 දින වාර්තාවේ සඳහන්ව තිබුනද ගරු මන්ත්‍රී එන්. වී. සමන් මහතා 65 මාර්ගය සංවර්ධනය පිළිබඳව විපක්ෂව කරුණු දැක්වීමක් නොකල අතර ඒ සම්බන්ධව පැහැදිලි කර ගැනීම සඳහා අදහස් විමසීමක් කල බවට 2018.05.08 දින සභාවාර්තාව සංශෝධනය විය.

**05. විශේෂ නිවේදන**

1. මාපලගම මහජන පුස්තකාලයට අඩුපාඩුවක්ව පැවති බිත්ති ඔරලෝසුව 2018.05.30 වන දින එක්සත් ජාතික නිදහස් පෙරමුණේ නාගොඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බෝදරගමගේ අරුණා ශාන්ති මහත්මිය විසින් මාපලගම මහජන පුස්තකාලයට පරිත්‍යාග බරන ලද අතර ඒ වෙනුවෙන් එතුමියට පුස්තකාලයාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් හා පුස්තකාල පාඨක සාමාජික, සාමාජිකාවන්ගේ ගෞරවණීය ස්තූතිය ප්‍රකාශ කර ඇති බව 2018.05.31 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපියට අනුව දැනුම් දෙමි.

2. පළාත් පාලන කොමසාරිස්ගේ අංක 4/05/06 හා 2018.05.08 දිනැති ලිපියට අනුව 1988 අංක 74 දරණ පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව 2018.03.31 වන දිනයට අදාළව ස්වකීය වත්කම් හා බැරකම් ප්‍රකාශ විධිමත්ව සම්පූර්ණ කර කවරයක බහා මුද්‍රා තබා 2018.06.30 වන දිනට පෙර ගරු සභාපති විසින් අමාත්‍යාංශ ලේකම් (පළාත් පාලන කොමසාරිස්තුමන් වෙත එකී ආවරණ ලිපියේ පිටපතක් සහිතව) වෙතද, ගරු උප සභාපති ඇතුළු මන්ත්‍රී මණ්ඩලය පළාත් පාලන කොමසාරිස් වෙතත් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමි.

3. ප්‍රාදේශීය සභාවේ වෙබ් අඩවියක් විවෘතව පවතින අතර ඒ හරහා ඉදිරියේදී සභිකයන් වෙත තොරතුරු සැපයීම පහසුවන බැවින් කමිටු රැස්වීම්, කැඳවීම් පිළිබඳ දැනුවත් කිරීම වෙබ් අඩවිය හරහා සිදු කිරීමට බලාපොරොත්තු වන බව දන්වා සිටිමි.
මෙහිදී මන්ත්‍රීවරුන්ට ඊට අවශ්‍ය පහසුකම් නොමැති බවත්, ඊට අවශ්‍ය පහසුකම් සැපයිය යුතු බව පිළිබඳවත්, ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විසින් තම අදහස් ප්‍රකාශ කරන ලදී.
විද්‍යුත් ක්‍රමයට කමිටු රැස්වීම් කැඳවීම් දැනුම් දීමේදී ලිඛිත තහවුරුවක් නොමැති නිසා ආයතනවලින් රාජකාරි නිවාඩු අනුමත කරවා ගැනීමේ ගැටළුවක් පැන නගින බවට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතාද තම අදහස් ප්‍රකාශ කරන ලදී.

**06. සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම.**

**01. ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය සදහා යොදා ගෙන ඇති ඉඩම් කොටස ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම සම්බන්ධයෙන් නාගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය මගින් අංක NAG/LAND/5/1/48111 හා 2018.06.01 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රාදේශීය ලේකම් අමතන ලද අංක 13/99/VE/128 හා 2018.01.17 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති පරිදි ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය සදහා අවශ්‍ය ඉඩම් ප්‍රමාණය සදහා ඉඩම් අත්පත් කර ගැනීමේ අයදුම්පත්‍රයක් පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස දැනුම් දී ඇත. තවද එම අයදුම්පත්‍රය අනුව අදාළ අත්කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන පැවරුම් සහතිකයක් මගින් ඉඩමෙහි අයිතිය නීත්‍යානුකූලව ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු කල හැකි බවටද දැනුම් දී ඇත.

ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ සදහා  යොදා ගෙන ඇති ඉඩම් කොටස අක්කර 5 ක් පමණ වන අතර එම අක්කර 5 පමණක් පවරා නොගෙන එම ඇප්තොප්වත්ත ඉඩමෙහි පැවති මුළු අක්කර 25 ම ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමග සාකච්ඡා කරන ලෙස සභාවේ ගරු මන්ත්‍රීවරුන් වන අජිත් එඩේරආරච්චි මහතාත්, නියෝජ්‍ය සභාපති ගාමිණී සුසන්ත මහතාත්, ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාත් ප්‍රකාශ කරන ලදී.

එම අක්කර 25 ඉඩම අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමන්ගේ කාලයේ වෙනත් සමාගමකට පවරා දුන් බවත් අජිත් මහතා වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේය.

මෙම අක්කර 25 ඉඩමෙහි කොටස් එවකට සිටි දේශපාලඥයින් විසින් ගම්වල හිතවත් මිනිසුන්ට භුක්ති විදීමට ලබා දුන් අතර ප්‍රාදේශීය සභාව සතුව එහි පාලනය පවතින විටදී පොල් ඉඩමෙහි බොහෝ අක්‍රමිකතා සිදු වී ඇති බවත්, එම ඉඩම සම්බන්ධ විධිමත් පාලනයක් සිදු නොවීමත් හේතුවෙන් ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවකට එම ඉඩම පවරා ගැනීමට කටයුතු කල බවත්, ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

**02. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තවලම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය සදහා ගොඩනැගිල්ලක් ලබා ගැනීම සම්බන්ධයෙන් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තවලම ප්‍රාදේශීය ඉංජිනේරුතුමන් විසින් අංක දප/මාසඅ/තව/02/01/08 හා 2018.06.01 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව තවලම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය මගින් නෙළුව, තවලම , නාගොඩ, නියාගම හා යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි මාර්ග නඩත්තු කිරීම් සහ වැඩිදියුණු කිරීම් කටයුතු සිදු කරන අතර දැනට ඔවුන්ගේ කාර්යාලය පවතින ස්ථානය ගංවතුරට

යට වන බැවින් අප ආයතනය සතු උඩුගම උප කාර්යාලය ලෙස පවත්වා ගෙන යන ලද ගොඩනැගිල්ල හා පරිශ්‍රයේ කොටසක් අවම වශයෙන් අවුරුදු 10 ක බදු පදනම මත ඔවුන්ට ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා ඇත.

වෙළඳ සංකීර්ණය සෑදීම පිළිබඳව යෝජනාවක් පවතින නමුත් එම කටයුත්ත දැන්ම සිදු නොවන නිසා එය ක්‍රියාත්මක වන තෙක් බදු දීමට හැකි ගොඩනැගිල්ලක් අප සතුව පවතින නිසා එම ගොඩනැගිල්ල බදු පදනම මත ලබා දෙන ලෙසත්, ඔවුන් විසින්ම ගොඩනැගිල්ල අළුත්වැඩියා කරන නිසා ඒ වාසියත් අපට ඒ තුළින්ම ලබා ගත හැකි බවත්, ඔවුන් අවුරුදු 10 කට ඉල්ලුම් කලත්, අපි විසින් ගිවිසුමකට අනුව අවුරුදු 02 කට හෝ 03 කට පමණක් ගොඩනැගිල්ල ලබා දීමට කටයුතු කල යුතු බවත්, ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ඒ සම්බන්ධව අදහස් ප්‍රකාශ කරන ලදී.

කොටපොල ප්‍රාදේශීය සභාවෙත් එලෙස බදු පදනම මත ගොඩනැගිල්ලක් ලබා දී ඇති බව ඔවුන් ප්‍රකාශ කර ඇති අතර එසේ සිදු කරන ලද ක්‍රමවේදය පිළිබඳව සොයා ගත යුතු බවත්, ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

ගොඩනැගිල්ල බදු දීම හොඳ කටයුත්තක්, අපට ආදායමක් ලබා ගන්න පුළුවන් නමුත් ඒ සම්බන්ධව යම් අධීක්ෂණයක් සිදු කල යුතු බවත්, බදු දුන් පසු විශාල වාහන ප්‍රමාණයක් පැමිණෙන අතර ඉඩ පහසුකම් ප්‍රමාණවත්ද, ශාලාව ප්‍රමාණවත්ද, බදු දීම මත අපේ පුස්තකාලයට යම් බාධාවක් සිදු වේද, මුරකරුවන් දැමීම සම්බන්ධවත් යන කරුණු පිළිබඳව යම් කමිටුවක් පත් කර දින 02 ක් හෝ 03 ක් ඇතුලත ඒ සම්බන්ධව අධීක්ෂණ වාර්තාවක් ලබා ගෙන බදු දීම සුදුසුද නැද්ද යන වග නිර්දේශ කල යුතු බව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා තම අදහස් ලෙස ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ලේකම්තුමිය සහ තාක්ෂණික නිලධාරින් ඇතුළුව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මන්ත්‍රීතුමියගේ හා ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමාගේ යෝජනා පරිදි ගරු මන්ත්‍රීන් වන අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමා, තරංග සුදර්ශන මන්ත්‍රීතුමා, ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා, වෙරංග ලක්මාල් මන්ත්‍රීතුමා සහ එන්. වී. සමන් මන්ත්‍රීතුමා කමිටු සාමාජිකයින් ලෙස පත් කර ගන්නා ලදී.

ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා විසින් එම ගොඩනැගිල්ල බදු පදනම මත ලබා දීමේ හැකියාව පවතින බවත්, ආයතන දෙකකින් වෙන වෙනම මුරකරුවන් දෙදෙනෙක් යෙදවීම මගින් ගැටළු ඇති විය හැකි බැවින් ඒ පිළිබඳව සළකා බැලිය යුතු බව ප්‍රකාශ කරන ලදී. උප සභාපතිතුමන්ගේ යෝජනාවට එතුමන්ද එකගතාව පළ කරන ලදී.

**03. ශාලා පහසුකම් ලබා ගැනීම සම්බන්ධව නාගොඩ. ටී. පී. හාඩ්වෙයාර් හි ටී. පී. සුමනසිරි මහතා විසින් 2018.06.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

ඒ අනුව ගොඩනැගිලි ද්‍රව්‍ය, තොග බඩු, බඩා කිරීම සදහා අප ආයතනයට අයත් පැරණි සමෘද්ධි බැංකුව අසල ඇති ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

ගොඩනැගිල්ල බදු පදනම මත ලබා දීම සම්බන්ධව පත් කරන ලද කමිටුවේ වාර්තාවක් ලබා ගෙන එම කමිටු වාර්තාවේ නිර්දේශය පරිදි බදු පදනම මත ලබා දීම සුදුසු යැයි නිර්දේශ කල හොත් එම ගොඩනැගිල්ල බදු පදනම මත ලබා දීමට සභාවේ එකගතාවය පළ විය.

**04. පොසොන් බැති ගී සරණිය 2018 සදහා අනුග්‍රහය ලබා ගැනීම සම්බන්ධයෙන් නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරි සුභසාධක සංගමය සමගින් 2018/06/12 දිනැතිව එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව නාගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරින්ගේ සුභසාධක සංගමය විසින් සංවිධානය කරනු ලබන පොසොන් බැති ගී සරණිය 2018/06/28 දින පැවැත්වීමට නියමිත අතර ඒ සදහා සමස්ථ වියදම වශයෙන් රු. 75000.00 ක මුදලක් වැය වෙතැයි ඇස්තමේන්තු කර ඇති බැවින් ඒ සදහා යම් මූල්‍ය ප්‍රතිපාදනයක් ලබා දෙන ලෙස අප ආයතනයෙන් ඉල්ලීම් කර ඇත.

එම පොසොන් බැති ගී සරණිය සදහා අප ආයතනයෙන් ඒ සදහා අවශ්‍ය වේදිකාව නිර්මාණය කර දීමෙන් අනුග්‍රාහකත්වයක් ලබා දිය යුතු බව තීරණය කල අතර ඒ සදහා රු. 7000.00 ක මුදලක් සභා අරමුදලින් වැය කිරීමට සභාව විසින් ඒකමතිකව එකගතාවය පළ කරන ලදී.

**05. දකුණු පළාතට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ප්‍රජා සහභාගීත්ව, පරිසර පවිත්‍රතා සහ පරිසර අලංකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක NAG/DEV/8/Enviro/02 හා 2018/05/24 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

ඒ අනුව ප්‍රාදේශීය සභාව මගින් කැලි කසල ඉවත් කිරීම, පවිත්‍රතා සහ අලංකරණය සම්බන්ධව ක්‍රියාත්මක වැඩසටහන් හා ඒ සදහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන අවශ්‍ය වන්නේ නම් එම වැඩසටහන්වල විස්තර හා ඇස්තමේන්තුව ලබා දෙන ලෙස ඉල්ලා ඇති අතර අදාළ ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට කටයුතු කල හැකි බැවින් අවශ්‍ය තොරතුරු ඉතා කඩිනමින් ඉදිරිපත් කරන ලෙසද ලිපිය මගින් දක්වා ඇත.

ඒ අනුව නගර අලංකරණය සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන යෝජනා ඉතා කඩිනමින් සභාව වෙත ලබා දීමට කටයුතු කරන ලෙස සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

නගරවල කුණු බාස්කට් තැබීමේදී කසල වෙන් කර නොදැමීම ප්‍රශ්නයක් වන අතර බාස්කට් බෙදීමට පෙර කසල වෙන් කිරීමට මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කල යුතු බව උප සභාපති ගාමිණී සුසන්ත මහතා ප්‍රකාශ කරන ලදී.

වර්තමානයේ එළිමහනේ කුණු බාස්කට් 01 ක් තබාගැනීමට අපහසු අතර කුණු ගන්නා අය හා කුණු නොගන්නා අය අතර ගැටුම් නිර්මාණය වූ බවත් අජිත් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

**06. මාර්ග ආලොකන පද්ධති (වීථි පහන්) සදහා විදුලි උපාංග නිර්දේශ කිරීම් 2018 සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ගේ අංක 05/02/පොදු/වීථි පහන් හා 2018/05/19 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

ඒ අනුව ජාතික බලශක්ති ප්‍රතිපත්තියට අනුකූල වන ලෙස මාර්ග ආලෝකන පද්ධති (වීථි පහන්) සදහා බලශක්ති කාර්යක්‍ෂම, පරිසර හිතකාමී විදුලි පහන් භාවිතයට පළාත් පාලන ආයතන දිරි ගැන්වීමේ වැඩසටහන යටතේ නිර්දේශිත LED බල්බයන්හි පිරිවිතර සදහන් කර ඇත. අතුරු මාර්ග සදහා 12W – 12.5W පරාසයේ LED Daylight E 27 පහන්ද, ප්‍රධාන මාර්ග, රෝහල්/ රජයේ ගොඩනැගිලි සහ පොදු ස්ථානවල ඇති මාර්ග ආලෝකකරණයට 20 W LED Daylight E 27 පහන්ද ප්‍රධාන මාර්ග හා සම්බන්ධ වන අතුරු මාර්ග ආරම්භ වන (මංසන්ධිවල) ප්‍රධාන මාර්ගයේ ඇති පහන් කණු 20W E 27 WARM White (කහ පැහැති ආලෝකය) LED පහන් සවි කරන ලෙස එම ලිපිය මගින් නිර්දේශයන් දක්වා ඇත.

වීථි ආලෝක පද්ධතිවල ප්‍රමිති පිළිබද ගැටළු පවතින බව මුදල් කමිටුවේදී සාකච්ඡා වූ අතර වෙනත් සභාවකින් ඒ පිළිබදව ඔවුන් කටයුතු කරන ආකාරය පිළිබදව දැනුවත් විය යුතු අතර උදාහරණයක් ලෙස අක්මීමණ ප්‍රාදේශීය සභාවේ මහ සභාව මගින් සම්මත කර අඩු මුදලට බල්බ් විශාල ප්‍රමාණයක් මිළදී ගෙන සියළු වැඩකටයුතු ඔවුන් විසින් අවසාන කල බවත්, එහි ප්‍රමිතිය පිළිබද ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල හැකි ක්‍රමවේදයක් සභාව මගින් තීරණය කර ගත යුතු බවත්, ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා ප්‍රකාශ කරන ලදී. අක්මීමන සභාවටත් උසාවි දඩ ලැබුණු අවස්ථාවේදීත් ඔවුන් එක් මන්ත්‍රීකෙනෙකුට ලක්ෂ 3 බැගින් උසාවි දඩ බෙදා දී තිබුණු බවත්, ඒ නිසා අපේ මන්ත්‍රීවරුන්ටත් අඩුම තරමින් පක්ෂයේ 15 දෙනාටවත් ලක්ෂ 2 බැගින් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ප්‍රකාශ කන ලදී. සල්ලි මෙතන නැතිවෙයි. සල්ලි පරිස්සම් කර ගෙන ඉදලා වැඩ නොකර වැඩක් නැති බවත් එතුමන් ප්‍රකාශ කරන ලදී.

විපක්ෂ මන්ත්‍රීවරුන් දුකට සැපට අත උස්සන්න පමණක් යොදා නොගන්නා ලෙසත්, සභාවට ඉදිරිපත් වන යෝජනා සම්බන්ධව අප සියළු දෙනාම ඉතාම සාමුහිකව කටයුතු කරන බවත්, මෙහි පැමිණි සියළු දෙනාම ජන්දයෙන් මේ තැනට පත්ව ඇති බවත්, විපක්ෂය හැටියට

සභාපතිතුමන්ගේ පාලනයට බාධාවක් නොවන අයුරින් කටයුතු කරන බවත් පක්ෂ මන්ත්‍රීවරයෙකුට රු. ලක්ෂ 02 ක් දෙනවනම් විපක්ෂ මන්ත්‍රීවරයෙකුට අවම වශයෙන් එක් ලක්ෂයක්වත් දීමට කටයුතු කරන ලෙසත්, ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් යෝජනා කරන ලදී. ගම්වල අනිත් මන්ත්‍රීවරුන් විසින් වීථි ලාම්පු සවි කරන කොට අපට ගමේ මිනිසුන්ට මුහුණදෙන්න බැරි වන බවත්, ඒ නිසා මහජන නියෝජිතයන් ලෙස අප පත්වීමේ ප්‍රතිඵලයක් නැතිවන බවද එතුමන් ප්‍රකාශ කරන ලදී.

සභාවේ වර්ථමාන ආදායම් තත්වය 262000 පවතින විට වියදම රු. 700000.00 වන බවත්, රු. 500000.00 ක හිගයක් පවතින බවත් ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී. ලක්ෂ 70 ක් ලද අවස්ථාවේ මන්ත්‍රීවරුන්ට ලක්ෂය බැගින් බෙදුවත් ලක්ෂ 27 ක් යන බවද එතුමන් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**07. පළාත් පාලන ආයතන සතු අරමුදල් යොදා ගෙන සිදු කරනු ලබන සංවර්ධන කටයුතු සම්බන්ධව ප්‍රධාන ලේකම්ගේ අංක දපස/ප්‍රඅ/පපා/2/5 හා 2018/05/19 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

ඒ අනුව පළාත් පාලන ආයතනය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන සංවර්ධන යෝජනා අනුමැතිය සදහා පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමේදී එහි ප්‍රගමන පිටපතක් ප්‍රධාන අමාත්‍යාංශය වෙත ලැබීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.

**08. නාගොඩ ප්‍රාදේශීය සභාව සදහා ආදාහනාගාරයක් ලබා ගැනීම සම්බන්ධව පළාත් සභා හා පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය අමාත්‍ය සම්බන්ධීකරණ ලේකම්ගේ අංක PCLG/M/15/08 හා 2018/06/06 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

ලිපියට අනුව නාගොඩ බල ප්‍රදේශය තුළ ආදාහනාගාරයක් නොමැති වීම හේතුවෙන් මහජනතාවට අපහසුතාවලට මුහුණ දීමට සිදුව ඇති බැවින් නාගොඩ බල ප්‍රදේශය සදහා ආදාහනාගාරයක් ඉදි කර දෙන ලෙස ගරු සභාපතිතුමන් කරන ලද ඉල්ලීමට අනුව දේශීය ණය සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂතුමන්ගේ අවධානය ඒ සදහා යොමු කර නාගොඩ ප්‍රාදේශීය සභා සභාපති සමග සාකච්ඡාවක් පවත්වා එහි වාර්තාවක් ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කිරීමට කටයුතු කරන ලෙස දක්වා ඇත.

එම යෝජනාව සදහා සභාවේ එකගතාවය පළ විය.

**09. ප්‍රධාන කාර්යාලය සඳහා අලුතින් ගොඩනැගිල්ලක් ඉදි කර ගැනීම සම්බන්ධව පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශ ගරු අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්ගේ අංක PCLG/M/15/13/08 හා 2018/06/08 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව නාගොඩ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල අබලන් තත්වයේ පවතින බවත් අපහසුතා රැසකට මුහුණ දීමට සිදුව ඇති බවත්, ඒ හේතුවෙන් නව ගොඩනැගිල්ලක් සඳහා සැළසුම් නිර්මාණය කර ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කල බවත්, එම කටයුතු කඩිනමින් කර දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, දන්වා ගරු සභාපතිතුමන් විසින් ගරු අමාත්‍යතුමන් වෙත කරන ලද ඉල්ලීමකට අනුව පසුගාමී ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම යටතේ මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශ අතිරේක ලේකම් (සංවර්ධන හා පුහුණු) වෙත දැණුම් දී ඇත.

කළින් නිර්මාණය කරන ලද ඇස්තමේන්තුව වෙනස් කර පහළම කොටසට වාහන අංගනයක් සහිතව ඉදිරියටත් අදාළ ගොඩනැගිල්ල ගැලපෙන ආකාරය නැවතත් ඇස්තමේන්තු සකස් කර යවන ලෙස ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා තම අදහස් ඉදිරිපත් කරන ලදී. සභාවේ මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධව බලාපොරොත්තු වන ආකාරයට ඉදිරි ඇස්තමේන්තුව නිර්මාණය විය යුතු බවද එතුමා වැඩිදුරටත් පැවසීය. අඩි 10 ක් පමණ කොන්ක්‍රීට් කණු මත දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට ගරු මන්ත්‍රීවරුන් සාකච්ඡා කල බවද එතුමන් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

අඩි 50 සීමාව තුල එම වාහන අංගනය සහිතව ගොඩනැගිල්ල ඉදිකිරීම අපහසු බව ගරු සභාපතිතුමන් පවසන ලදී.

ගොඩනැගිල්ල පිටුපසට කර ඉදිකිරීම තුළින් අඩි 50 සීමාව ගත හැකි බවත් ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතාගේ යෝජනාවට එකග වන බවත්, ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා ප්‍රකාශ කරන ලදී. අපේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද උඩුගම පොළ, තල්ගස්වල පොළ වැනි විවිධ ස්ථාන අපට අවශ්‍ය පරිදි නිර්මාණය නොවූ අතර ඒ තුලින් අපට ප්‍රායෝගිකව ඇතිවන ගැටළුවලට විසඳුම් නොලැබුනු බවත් වර්ථමානයේ අපේ තැනින් තැන තිබෙන වාහන ගාල් කිරීමට රථගාලක් අවශ්‍ය බවත්, එම නිසා එම ඇස්තමේන්තුව ඊට ගැලපෙන ලෙස නිර්මාණය කළ යුතු බවත් පිළිබඳව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

පසුව ඒ පිළිබඳව තාක්ෂණික නිලධාරීන් සමග සාකච්ඡා කර නව ගොඩනැගිල්ලකට නව ඇස්තමේන්තු සෑදීමට සභාවේ එකගතාවය පළ විය.

**10. මාපලගම නගරයේ පැරණි කඩ කාමර අංක 01 සඳහා විදුලිබලය, ජල පහසුකම් ලබා ගැනීම සම්බන්ධව 70/1 ඌරල පහළ, වදුරඹ පදිංචි පී. පී. සදුන් චතුරංග මහතා 2018/06/11 දිනැතිව එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව මාපලගම නගරයේ පැරණි කඩ කාමර අංක 01 ඔහු විසින් 2018/05/23 වන දින ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව මාසික බදු පදනම මත ලබා ගත් නමුත් එහි විදුලිබලය සහ ජල පහසුකම් නොමැති බැවින් ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇති බැවින් එම කඩ කාමරය සඳහා විදුලිබලය සහ ජල පහසුකම් ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

අපි යම් කඩ කාමරයක් බදු පදනම මත ලබා දීමේදී බදු දීමට ප්‍රථමව එම කඩ කාමරයට ජල පහසුකම් හා විදුලිබල පහසුකම් ලබා දීම අනිවාර්යයෙන් සිදු කල යුතු බවත්, අපි බදු ලබා ගන්නා බැවින් එම පහසුකම් සැපයීමට අපි මැදිහත් විය යුතු බවත්, ඔහුට විදුලිය ගැනීමට දුන්හොත් ඔහුට එහි අයිතියක් ලබා ගැනීමට හැකි බවත්, එලෙස සිදු වීමට ඉඩ නොතබා සභාව විසින් ජල විදුලිබලය සැපයිය යුතු බවට ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

විදුලිය ලබා ගැනීමට සභාවේ මුදල් වැය නොකර බදුකරුගේ මුදලින් ජල විදුලිය ලබා ගත යුතු අතර තමන් පෙරදී කඩකාමරය නිරීක්ෂණය කල විට එහි ජල විදුලිය නොමැතිකම නිසා එම කඩකාමරය ගැනීම අතහැර දැමූ බවත්, නැතිනම් එම මුදලට තමනුත් එම කඩකාමරය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන බවත් ගරු මන්ත්‍රී ධර්මසිරි ගණේවත්ත මහතා තම අදහස් ප්‍රකාශ කර සිටියේය. එම අවස්ථාවේදී ජල විදුලිය ලබා දෙන බවට ඔහු දැනුවත් කර නොමැති බවත්, එම නිසා ඔහුගෙන් මුදල් ලබා ගෙන සභාවෙන් වියදම් නොකර සභාවේ නමට ජල විදුලිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

අපි නිවසක් බදු පදනම මත ලබා දුන්නත් සියළු පහසුකම් සැපයිය යුතු අතර රටේ එය පවතින පොදු නීතියක් වන බවත්, ඔහුගෙන් ජල විදුලිය ගත හොත් බදු මුදලින් එම වියදම අඩු කල යුතු බවත් ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා නැවත වරක් ප්‍රකාශ කරන ලදී. තාක්ෂණ නිලධාරී මහතකු යොදවා යන වියදම ඇස්තමේන්තු කර යන වියදම බදුකරුට දැරීමට දී පසුව ඔහු ගෙවන බදු මුදලින් එය වාරිකව හෝ අඩු කරන්න කටයුතු කරන ලෙස එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

බදුකරු කවුරු වුවත් සභාවේ යම් දේපලක් බදු පදනම මත ලබා දී ඇත්නම් ඊට අවශ්‍ය පහසුකම් සභාව විසින් ලබා දිය යුතු බවත් මෙහි නීතිමය තත්වය එය බවත්, පහසුකම් නොමැතිව අපට ටෙන්ඩර් කිරීමට අයිතියක් නොමැතිබවත්, ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා ප්‍රකාශ කරන ලදී. මේ රටේ පවතින නීතිමය තත්වය අනුව බදු දීමේදී ජල විදුලිය ඇතුළු සියළු පහසුකම් සැපයිය යුතුයි. පෙර කාලවලදී අපේ පිට්ටනිය බදු දුන් අවස්ථාවේදී සභාව විරුද්ධ වෙද්දීත් අපේ ගරු

අජිත් එඩේරආරච්චි මැතිතුමන් පිට්ටනිය සඳහා විදුලිය ලබා දුන් බවට ගරු නිශාන්ත නන්දන මහතා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව සභාව විසින් ජල විදුලිය අරගෙන දීම හෝ අපිට මුදල් නැතිනම් බදුකරුගේ මුදල් ගෙවා ජල විදුලිය ගත් පසු ඒ සඳහා දරන ලද මුදල සභාවට ඔහු ගෙවන බදු මුදලින් අඩු කර ගැනීමට කටයුතු කරන ලෙස තීරණය වූ අතර ඒ සඳහා සභාවේ එකගතාවය පළ විය.

**11. එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායම් නායක ධූරය සම්බන්ධව එක්සත් ජාතික පක්ෂ මහ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී නීතීඥ අකිල විරාජ් කාරියවසම් මැතිතුමන් විසින් අංක UNP/GL/LG/2018/NG- PS හා 2018/05/11 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

ලිපියට අනුව නාගොඩ ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ කටයුතු ශක්තිමත්ව ඉදිරියට මෙහෙයවීම සඳහා එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායම් නායක ධූරය සඳහා ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රා වීරගුණරත්න සහබන්දු මහතා පත් කර එවා ඇති බව දන්වා සිටිමි.

**12. එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායම් සංවිධායක ධූරය සම්බන්ධව එක්සත් ජාතික පක්ෂ මහ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී නීතීඥ අකිල විරාජ් කාරියවසම් මැතිතුමන් විසින් අංක UNP/GL/LG/2018/NG- PS හා 2018/05/11 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

ලිපියට අනුව නාගොඩ ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ කටයුතු ශක්තිමත්ව ඉදිරියට මෙහෙයවීම සඳහා එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායම් සංවිධායක ධූරය සඳහා ප්‍රාදේශීය සභා මන්ත්‍රී වැලිකඩ ගමගේ නිශාන්ත නන්දන මහතා පත් කර එවා ඇති බව දන්වා සිටිමි.

**13. බැංකු කාර්යාලයට ප්‍රවේශ වන මාර්ගය අවහිර කිරීම සම්බන්ධව මාපලගම වෙළද සංකීර්ණයෙහි කඩ කාමර අංක 02 හි පවත්වා ගෙන යනු ලබන නාගොඩ සණස කාර්යාලයේ කළමනාකරු විසින් 2018/04/27 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව එම කාර්යාලයට ප්‍රවේශ මාර්ගය අසල දිනපතා වාහන යතුරු පැදි විශාල ප්‍රමාණයක් නවතා තැබීම නිසා බැංකුවට පැමිණෙන ගණුදෙනුකරුවන් මහත් අපහසුතාවයකට පත් වන බැවින් එම වාහන නවතා තැබීමෙන් සිදු වන අවහිරතාව ඉවත් කිරීමට පියවර ගන්නා මෙන් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

වාහන ඉවත් කිරීම සම්බන්ධව “වාහන නවතා තැබීම තහනම්” යනුවෙන් ප්‍රකාශ කර බෝඩ් එකක් ගැසීමට සභාවේ එකගත්වය පළ විය.

මාපලගම වෙළඳ සංකීර්ණයේ දවස කඩය පවත්වා ගෙන යන කඩ කාමරයේ දොර කැඩී ඇති බවද සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී. අවුරුදු ගණනාවටම ලක්ෂ 3 කට කඩය ලබා දී ඇති අතර එහි දොර සෑදීමට පමණක් ලක්ෂ 1 1/2 ක් පමණ යන බවත් ගරු සභාපතිතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

**14. බුද්පනාගම, දෙල්ගහවත්ත පදිංචි එම්. කේ. රංග ගයාන් ප්‍රසංග මහතා විසින් 211 A බුද්පනාගම ග්‍රාම නිලධාරී වසමට අයත් බුද්පනාගම දෙල්ගහදූව වත්ත පාර කොන්ක්‍රීට් කිරීම සම්බන්ධව 2018/04/25 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව බුද්පනාගම දෙල්ගහදූව වත්ත මාර්ගය නිවාස 6 කට යන මාර්ගයක් වන අතර වැසි දිනවලදී වෙල පිටාර ගැලීම තුළින් පාර යටවීමට ලක් වේ. ප්‍රධාන මාර්ගයේ සිට කර මතින්, මුදල් ගෙවා නිවෙස් ඉදි කිරීමට අවශ්‍ය ගල්, වැලි, ගඩොල් ආදිය ගෙන ඒමට සිදු වන අතර වර්ෂා දිනවලදී පාසල් ළමුන්ද දැඩි දුෂ්කරතාවයට පත් වන බව දැනුම් දී ඇත. එබැවින් එම මාර්ගය කොන්ක්‍රීට් අතුරා පිළිසකර කර දෙන මෙන් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

ඉහත බුද්පනාගම දෙල්ගහදූව වත්ත පාර කොන්ක්‍රීට් කිරීම මන්ත්‍රී යෝජනා මගින් ඉදිරිපත් කරන ලෙස සභාව විසින් ප්‍රකාශ කරන ලදී.

**15. නාකියාදෙණිය, අලුත්වත්ත පදිංචි යූ. එල්. සී. උපාලි මහතා විසින් 2018/04/10 දිනැතිව ගාල්ල උඩුගම ප්‍රධාන මාර්ග සීමාවේ අනවසර ඉදිකිරීම් සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යවන ලද ලිපියෙහි පිටපතක් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.**

ඒ අනුව ගාල්ල උඩුගම ප්‍රධාන මාර්ගයේ අලුත්වත්ත මංසන්ධියේ පවතින අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියේ අවධානය යොමු කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සම්බන්ධව ලිපියක් අදාළ ආයතනයට යවන ලෙසත්, ඒ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කල යුතු බවටත්, සභාව විසින් තීරණය කරන ලදී.

**16. ප්‍රජා ශාලාවේ වහල අළුත්වැඩියා කර ගැනීම සම්බන්ධව හෙලෝ කිඩ්ස් පෙර පාසල් ආචාර්ය තුමිය විසින් 2018/06/05 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව නාගොඩ කැප්පිටියාගොඩ 212 ග්‍රාම නිලධාරී වසමෙහි වලකුඹුර සමගි ප්‍රජා ශාලාවේ ළමුන් 19 දෙනෙකු ඉගෙනුම ලබන හෙලෝ කිඩ්ස් පෙර පාසල පවත්වා ගෙන යනු ලබන අතර එම ප්‍රජා ශාලාවේ වහල දිරාපත් වී ඇති අතර එම වහල අළුත්වැඩියා කර ගැනීම සම්බන්ධව ඉල්ලීම ඉදිරිපත් කර ඇත.

ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය එම කටයුත්ත සම්බන්ධව අධීක්ෂණය කර ඇති අතර වර්තමානයේ එම පෙර පාසලේ ගොඩනැගිල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් පාලනය කරන බවත්, නැවතත් එම ගොඩනැගිල්ල සභාවට පවරා ගෙන එහි ඉදිරි කටයුතු සිදු කිරීමට මැදිහත් වන ලෙසත් එතුමිය ප්‍රකාශ කරන ලදී. ලිපිය මගින් දක්වා ඇති අවධානම් තත්වය එම ශාලාව තුල සත්‍ය වශයෙන්ම පවතින බවත්, ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමිය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියාය.

එම ප්‍රජා ශාලාවේ යතුර මීට ඉහත කාලවලදී ප්‍රාදේශිය සභාව භාරයේ පැවති බවත්, ප්‍රාදේශීය සභාවෙන් යතුර ලබා ගෙන සමිතියකට යතුර ලබා දී තිබෙන බවත්, මෑතකදී සමෘද්ධි සංවර්ධන නිලධාරී මැදිහත් වී පෙර පාසල ආරම්භ කල බවත් එහි අයිතිය පිළිබඳ තවදුරටත් සොයා බලා කටයුතු කරන ලෙස ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

ප්‍රජා ශාලාවේ යතුර ප්‍රාදේශීය සභාව භාරයේ පැවති බවත්, පෙර පාසලේ සෑම උත්සවයකටම සෑම කටයුත්තකටම ප්‍රාදේශීය සභාව සම්බන්ධ කර ගත් බවත්, වර්තමානයේ මෙය අපේ භාරයෙන් ගිලිහී ඇති බවත් ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය සභාව මගින් සමිති ශාලාව පිළිබඳව සොයා නොබැලීම නිසා ශාලාව ගරා වැටෙමින් පැවති අවස්ථාවන්හිදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමෘද්ධි සමිති පැවැත්වීමට අවශ්‍ය නිසා ඊට මැදිහත් වී එය අළුත්වැඩියා කර සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ පරිපාලනය යටතේ එම ශාලාව පවත්වා ගෙන ගිය බවත්, ගරු මන්ත්‍රී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය ඒ පිළිබඳව නැවත වරක් ප්‍රකාශ කර සිටියාය

අපට අයිති ගොඩනැගිල්ලක් සොයා නොබැලීම නිසා වර්තමානයේ අපෙන් ගිලිහිලා තියෙනවා. ඒක බරපතල වැරුද්දක් නමුත් මෙහි නීත්‍යානුකූල අයිතිය අප සතුයි. උඩුගම උප කාර්යාලයේත් වළකුඹුර ප්‍රජා ශාලාවෙත් එක හා සමාන අයිතියක් අපට පවතින බව ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා නැවත වරක් ප්‍රකාශ කරන ලදී. සභා අරමුදල් ඒ සඳහා වියදම් කර ඇති බැවින් දැන් පවතින තත්වය නීත්‍යානුකූල නොවන අතර ප්‍රජා ශාලාව සභාවට පවරා ගන්නා ලෙස එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

අපේ පෙර පාසලක් වන ගම්මැද්දේගොඩ සුහද පෙර පාසලේත් වහලය කැඩී ඇති අතර එහි අයිතිය අප සතු නොවන නිසා එම පෙර පාසලවත් සාදා ගත නොහැකි බව සභාපතිතුමන් ප්‍රකාශ කරන ලද අතර මෙම වලකුඹුර සමගි ප්‍රජා ශාලාවේ අයිතිය පවරා ගැනීම සම්බන්ධ කටයුතු සිදු කරන බවද ප්‍රකාශ කරන ලදී.

**07 යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ**

**01. උනන්විටිය පොළ බදුකරු වන සිරිවර්ධන විජේසේකර මහතා උනන්විටිය සති පොළ සම්බන්ධව 2018/05/22 දිනැතිව හා 2018/05/29 දිනැතිව ඉදිරිපත් කල ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව 2018/05/22 වන දින උනන්විටිය ප්‍රදේශයේ පැවති ගංවතුර නිසාත්, 2018.05.29 වන දින පොසොන් පොහොය පැවතීම නිසාත් පොළ පැවැත්වීමට නොහැකි වූබවත්, එබැවින් ඒ සම්බන්ධව යම් සාධාරණයක් කරන ලෙස ඉල්ලා ඇත.

2018/05/22 වන දිනයේ ගංවතුර තත්වය නිසා ජනතාවට පොළට පමිණීමට නොහැකි බැවින් ඒදිනට බදු නිදහස් කරන ලෙස ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා තම අදහස් ප්‍රකාශ කරන ලදී.

පොළ බදු කරු විසින් පොළ දිනට අතිරේකව පොළ පවත්වන දිනයන්හිදී ලබන ආදායමින් අමතර ආදායමක් සභාවට ලබා නොදෙන නිසාත් ටෙන්ඩරයක් ලබා ගත් විටදී එය ව්‍යාපාරයක් වන බැවින් එහිදී ඇතිවන ලාභ පාඩු ඔහු විසින් දරා ගත යුතු බවත් ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා තම අදහස් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ඉදිරිපත් කල එම අදහස සදහා ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා තම එකගතාවය පළ කරන ලදී.

ඒ අනුව අදාළ දිනයන්හිදී පොළ පැවැත්වීමට නොහැකි වීමෙන් ඇති වූ පාඩුව බදු කරු විසින්ම දරා ගත යුතු බවත්, එම දිනයන් බද්දෙන් නිදහස් නොකිරීමටත්, සභාව තීරණය කරන ලදී.

**02. ඌරල, කොතේගොඩකන්ද පදිංචි ප්‍රියංගිකා දීප්තිකා නල්ලපෙරුම මහත්මිය විසින් කාණු පද්ධතියක් සකස් කර ගැනීම සම්බන්ධව 2018/05/28 දිනැතිව ඉදිරිපත් කල ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව වතුර බැස යන ප්‍රධාන දොළ කාණුවට පිවිසීම අවහිර වී ඇති බැවින් කොතේගොඩකන්ද පහළ පාරේ කෙලවර දීර්ඝ කාලයක් තිස්සේ මඩ වගුරක් බවට පත්ව ඇති අතර වැසි කාලවලදී මඩවල ආසන්නයේ ජීවත් වන ගම්වාසීන් හා පාසල් ළමුන් දුෂ්කරතා රාශියකට මුහුණ දෙයි. මීට පෙර අවස්ථාවලදී මේ ප්‍රශ්නය සළකා බලා ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික නිලධාරීන් විසින් ඊට විසදුමක් ලෙස ප්‍රධාන දොළ කාණුව වෙත කාණුවක් කපා ස්ථාන දෙකකට අවශ්‍ය පරිදි බෝක්කු දෙකක් දමන ලෙස නිර්දේශ කර ඒ සදහා සිලින්ඩර් දෙකක්ද ලබා දීමට අනුමත වූ නමුත් එවකට මැතිවරණ කටයුතු පැවතීමෙන් කාණුව සකස් කර දීම නවතා ඇත. ඒ අනුව එලෙස සකස් කිරීම නතර වූ කාණු පද්ධතිය නැවත සකසා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

මෙහිදී සිලින්ඩර් දෙක ලබා දීමට අනුමත වී ඇතත් එය මේ වන තෙක්ම ලබාදීමට කටයුතු කර නොමැති බවත් එය කඩිනමින් ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මැතිවරණ කටයුතු නිසා එම සිලින්ඩර් දෙක ලබාදීමට නොහැකි වූ අතර ඉදිරියේදී එම සිලින්ඩර් දැමීම පිළිබදව සභා එකගතාවය පළ විය.

**03. වදුරඹ, තලාව පාර, බී. ඩී. 5 සිරිසෙවන පදිංචි වසන්ත දොඩංගොඩ මහතා විසින් බීඩී 05 හංදිය අසළ වැහි වතුර හා දොළ දියෙන් යටවීම වළක්වා ගැනීම සම්බන්ධව 2018/06/01 දිනැතිව ඉදිරිපත් කල ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව බෝවිටියමුල්ල තලාව මාර්ගයේ බී. ඩී. 05 හන්දිය අසල විනාඩි 45 ක 50 ක කාලයක් තුලදී වර්ෂා අවස්ථාවලදී වැහි වතුර පිරීම හේතුවෙන් අඩි 04 – 05 ක ප්‍රමාණයක් යටවන අතර නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් සකස් කරන ලද බී. ඩී. 05 ක්‍රීඩාංගණය අඩි 04, 05 ක් පස් දමා ගොඩ කිරීම එසේ යටවීමට හේතු වශයෙන් ඉදිරිපත් කර ඇත. වැසි තත්වයකදී ජනතාවට මහත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වන අතර පිට්ටනිය ගොඩ වීම මත සීතල දොළ හා තලාව ඇළ මාමනදොල ඇළ වතුර බැස යාම අඩාල වී ඇත. ඒ අනුව ඊට විසදුමක් ලෙස අඩි 05 ක පමණ සිලින්ඩර් එළා හිරවන වැසි ජලය ඉවත් කර දෙන මෙන් ලිපිය මගින් ඉල්ලීම් කර ඇත.

තාක්ෂණික නිලධාරීන්ගේ පරික්ෂාවට ලක් කර තාක්‍ෂණික නිලධාරී වාර්තාව අනුව ඉදිරි කටයුතු කිරීමට සභාව තීරණය කරන ලදී.

**04. උඩවැලිවිටිතලාව, 158/A පදිංචි පී. කේ. සෝමලතා මහත්මිය කොන්ත්‍රාත් පදනම යටතේ සේවයට අනුයුක්ත කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

ශ්‍රී රාහුල පෙර පාසලේ සහාය පාලිකාව වශයෙන් 2013 වර්ෂයේ සිට සේවය කරන අතර මාසික දීමනාව ලෙස දෙමව්පියන්ගෙන් සුළු මුදලක් ලබා දෙන බැවින් කොන්ත්‍රාත් පදනම මත සේවයට බදවා ගන්නා ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

අප ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන පෙර පාසල් 15 අතරින් සේවයේ යෙදී සිටින සහාය පාලිකාවන් සියළු දෙනාම කොන්ත්‍රාත් පදනම මත සේවයට බදවා ගන්නා ලෙස ඉල්ලා ලිපි ඉදිරිපත් කර ඇති අතර සභාවේ පවතින අඩු ආදායම් තත්වය අනුව දැනට ඔවුන් කොන්ත්‍රාත් පදනම මත බදවා ගෙන සභා අරමුදලින් වැටුප් ගෙවීමට අපහසු බවත් ඉදිරියේදී ඒ පිළිබදව සළකා බලන බවත් සභාව විසින් තීරණය කරන ලදී.

**05. නාගොඩ ප්‍රාදේශීය සභා පෙර පාසලක් ලෙස පාලනය වන උදාර පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ පෙර පාසල් සංවර්ධන කමිටුවේ දෙමව්පියන් විසින් විශ්‍රාම යාමට නියමිත එහි ප්‍රධාන ආචාර්ය එස්. ඒ. එම්. විමලලතා මහත්මිය විශ්‍රාම යන දිනෙන් පසුවත් සේවයේ යොදවන ලෙස ඉල්ලා 2018/06/11 දිනැතිව ඉදිරිපත් කල ලිපිය හා එස්. ඒ. එම්. විමලලතා මහත්මිය විසින් විශ්‍රාමික රජයේ නිලධාරීන් සේවයේ යෙදවීම පිළිබඳව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2017 චක්‍රලේඛය පරිදි තම සේවා කාලය අවුරුදු 20 සම්පූර්ණ වන තෙක් හෝ එසේ සිදු කිරීම අපහසු නම් අවම වශයෙන් තවත් මාස 6 කටවත් තම සේවා කාලය දීර්ඝ කර දෙන ලෙස 2018/05/22 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපි සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව 03/2017 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය පරිදි කටයුතු කරන විට එසේ සේවය දීර්ඝ කල හැක්කේ එම සේවාව වෙනත් කෙනෙකුගෙන් ලබා ගත නොහැකි නම් හා විධායක ශ්‍රේණියේ තනතුරු සඳහා වන බැවින් එම චක්‍රලේඛනය මත පදනම්ව සැබෑවටම සේවා දිගුවක් ලබාදීමට හැකිද, නැද්ද පිළිබඳව චක්‍රලේඛනයේ පවතින බවත් ඒ පිළිබඳව ලේකම්තුමිය දැනුවත්ව ඇති බවත්, රාජ්‍ය නිලධාරීන් ලෙස අදාළ චක්‍රලේඛනය අනුව කටයුතු කිරීමට සුදුසු බවත් එම ලිපිය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය එම ගුරු මහත්මියට ලිඛිතව දැනුම් දිය යුතු බවත්, පිළිබඳව ගරු මන්ත්‍රීතුමන් වන අජිත් එඩේරආරච්චි මහතා සහ චන්ද්‍රසිරි වනිගරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එම චක්‍රලේඛනය අනුව එස්. ඒ. එම්. විමලලතා ගුරුමහත්මියට සේවා දිගුවක් ලබා දිය නොහැකි බවට තීරණය කල අතර ඒ පිළිබඳව ලිඛිතව එතුමිය දැනුවත් කිරීම කල යුතු බවටද සභාව තීරණය කරන ලදී.

**06. මාපලගම බස් නැවතුම්පොලේ ඉවත් කර ඇති සිමෙන්ති කැටගල් ලබා ගැනීම සඳහා ගා/ මාපලගම සිරිසුනන්ද(නවෝද්‍යා) මහා විද්‍යාලයේ විදුහල්පතිතුමන් විසින් 2018/06/06 දිනැතිව ඉදිරිපත් කල ලිපිය සභාගත කරන ලදී.**

ලිපියට අනුව සිසුන් 2000 කට ආසන්න ප්‍රමාණයක් අධ්‍යාපනය ලබන මෙම විද්‍යාලයේ සියළුම අංශවලින් උසස් ප්‍රතිඵල ලබා ගන්නා සිසුන් සිටින නමුත් මෙම පාසල භෞතික පහසුකම් අතින් ඉතා අඩු පහසුකම් සහිත තත්වයක් පවතින බවත්, නිතර සෝදාපාළුවට ලක්වන මැටි සහිත පරිසරයක් පවතින බැවින් පාසල් භූමිය සිසු දරුවන්ගේ කායික හා මානසික සෞඛ්‍යයට සුදුසු පරිදි පවත්වාගෙන යාමේ ගැටළුවට විසඳුමක් ලෙස ප්‍රාථමික අංශයේ ප්‍රවේශ මාර්ගය හා අවට සකස් කර ගැනීමට ප්‍රාදේශීය සභාව සතුව පවතින මාපලගම බස් නැවතුම්පොලේ ඉවත් කර ඇති සිමෙන්ති කැටගල් පාසලට ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

එම කැටගල් ප්‍රාදේශීය සභාවට අයිති නොවන අතර පළාත් සභාවට එහි අයිතිය පවතින බැවින් පළාත් සභාවෙන් එය ඉල්ලුම් කලත් ලබා ගත නොහැකි වූ බව ගරු මන්ත්‍රී බන්දුල හිරිමුතුගොඩ මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

කැටගල් යම් තැනකට දෙනවානම් පාසලකට හෝ පන්සලකට ලබා දීම සුදුසු බවත්, මෙහිදී පනත අනුව බස් නැවතුම්පල අපට අයිති නම් එහි පවතින කැටගල් ඉබේටම සභාව සතු වත්කමක් වන අතර අපට අයිති එම කැටගල් ගෙදර නොගිහින් තවත් පොදු ආයතනයකට ලබා දීම සුදුසු බවත් ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

පසුගිය කාලය තුල කැටගල් ප්‍රවාහනය අක්‍රමිකවත්ව සිදු වී ඇති බැවින් වර්තමානයේ සිරිසුනන්ද පාසලට එය ලබා දුන්නට ගැටළුවක් නොවන බවත් එය ලබාදීම වැදගත් වන බවත්, ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී කැටගල් සම්බන්ධව අපට අයිතියක් නැති නිසා එම කැටගල් අප වෙත ලබා දෙන ලෙස ඉල්ලා ලිපියක් අදාළ ආයතනය වෙත යැවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රී අජිත් එඩිරආරච්චි මහතා ප්‍රකාශ කර සිටියේය.

මෙහිදී සභාවට යොමු කරන ලද සෑම ලිපියකටම ඒ සභාව මගින් ලබා දුන් තීරණය සම්බන්ධව අදාළ ලිපි එවනු ලබන පාර්ශවය දැනුවත් කර ලිපි යැවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විසින් පොදු ඉල්ලීමක් ඉදිරිපත් කල අතර ඒ සඳහා සභාවේ එකගතාවයද පළ විය.

**08. යථා පරිදි කල් දී ඇති යෝජනා ඃ**

**08.01. ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා :-**

I. **සම්පත් අතුකෝරල මැතිතුමන් විසින් උඩුගම නැගෙනහිර නව ප්‍රජා ශාලාවට අමුද්‍රව්‍ය ලබාදීමට රු.10000.00 ක මුදලක් ලබා දී ඇති අතර එම මුදල වියදම් කර නොමැති බැවින් එම මුදල සභා අරමුදලට බැර කර ගැනීමට යෝජනා කරමි.**

   එම මුදල සභා අරමුදලට බැර කර ගැනීම සම්බන්ධ යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

II. **තල්ගස්වලවත්ත ඇගළුම් කම්හල අසල සිට තල්ගස්වල වත්ත තේ කම්හල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ ගෙවිය යුතු රජයේ ආධාර රු. 44961.48 ක මුදල කර්මාන්ත ගිණුමේ පවතින අතර එම මුදල සභා අරමුදලට බැර කර ගැනීමට යෝජනා කරමි.**
   එම මුදල සභා අරමුදලට බැර කර ගැනීම සම්බන්ධ යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

III. **උඩවැලිවිටිය ශ්‍රී සම්බුද්ධ ජයන්ති විහාරයේ බෝධි මළුව ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 3000.00 ක මුදල සභා අරමුදලට බැර කර ගැනීමට යෝජනා කරමි.**

එම මුදල සහා අරමුදලට බැර කර ගැනීම සම්බන්ධ යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

**IV. ගම්මැද්දේගොඩ මිල්ලගහවත්ත පාරට අවශ්‍ය බෝක්කු යොදා බැම් බැඳීමට ආනන්ද පද්මසිරි මැතිතුමන්ගේ ප්‍රතිපාදන යටතේ 2012 වර්ෂයේ රු. 50000.00 ක මුදලක් ලැබී ඇති අතර එම මුදල් කර්මාන්ත ගිණුමේ නිශ්ක්‍රියව පවතින බැවින් එම මුදල සහා අරමුදලට බැර කර ගැනීමට යෝජනා කරමි.**

එම මුදල සහා අරමුදලට බැර කර ගැනීම සම්බන්ධ යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

**V. ගෝණදෙනිය කලඑළිගොඩ පාර 2x4 බෝක්කු ලබා ගැනීම සඳහා රු. 10000.00 ක මුදලක් 2012.11.26 දින ලැබුණු අතර එම මුදල කර්මාන්ත ගිණුමේ පවතින බැවින් එම මුදල් සහා අරමුදලට බැර කර ගැනීමට යෝජනා කරමි.**

එම මුදල සහා අරමුදලට බැර කර ගැනීම සම්බන්ධ යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

**VI. වැඩ/ක්ෂේත්‍ර කම්කරු , පී. කේ. නිශාන්ත මයා දසමස් වැටුප් අත්තිකාරම් මුදල වන රු. 227200.00 ක මුදලක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර එම මුදල සේවක ණය මුදලෙන් ගෙවීමට යෝජනා කරමි.**

එම මුදල් සේවක ණය ගිණුමෙන් ගෙවීමට සභාව විසින් ඒකමතිකව එකගතාවය පළ වූ අතර යෝජනා සභා සම්මත විය.

**VII. චතුරානි පතිනායක මහත්මිය දසමස් වැටුප් අත්තිකාරම් මුදල වන රු. 208000.00 ක මුදලක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර එම මුදල සේවක ණය මුදලෙන් ගෙවීමට යෝජනා කරමි.**

එම මුදල් සේවක ණය ගිණුමෙන් ගෙවීමට සභාව විසින් ඒකමතිකව එකගතාවය පළ වූ අතර යෝජනා සභා සම්මත විය.

**VIII. ප්‍රිමාලි ශ්‍රීණිකා පතිරණ මෙනවිය දසමස් වැටුප් අත්තිකාරම් මුදල වන රු. 236000.00 ක මුදලක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර එම මුදල සේවක ණය මුදලෙන් ගෙවීමට යෝජනා කරමි.**
එම මුදල් සේවක ණය ගිණුමෙන් ගෙවීමට සභාව විසින් ඒකමතිකව එකගතාවය පළ වූ අතර යෝජනා සභා සම්මත විය.

**IX. කොන්ත්‍රාත් පදනම මත රියදුරු වශයෙන් සේවය කරනු ලබන ඩබ්. කේ. සම්පත් සංජීව මහතාගේ හා කොන්ත්‍රාත් පදනම මත මුරකරු වශයෙන් සේවය කරනු ලබන එන්. එම්. රජිත් මහතාගේ දැනට ලබා දෙන දෛනික දීමනාව වන රු. 750.00 ක දීමනාව වැඩි කර දෙන ලෙස ඉල්ලා 2018/05/08 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපි සභාගත කරන ලදී.**

ඔවුන් පවරන ලද කාර්යයන් නිසි පරිදි ඉටු කරන නිසාත්, වර්තමානයේ පවතින ආර්ථික අපහසුතා නිසාත්, දෛනික දීමනාව රු. 1000.00 ක් වත් කල යුතු බවට ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා කරුණු දැක්වීය.

නමුත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව ඔහුගේ වැටුප ගණනය කල විට රු. 166.60 ක දෛනික දීමනාවක් සහ රු. 641.40 ක දෛනික වැටුප සහ දෙකෙහි එකතුව වන රු. 808.00 ක් පමණක් ගෙවිය හැකි බවට ගරු සභාපතිතුන් ප්‍රකාශ කර සිටියේය. තවද සභාවේ පවතින අඩු ආදායම් තත්වය නිසා වැටුප් වැඩිකර  සභා අරමුදලින් ගෙවීම අපහසු බවද එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ඉදිරියේදී වැටුප් වැඩි කර දීම සම්බන්ධව සළකා බලන බවට තීරණය විය.

**X. විෂය ලිපිකරු කේ. කේ. අවන්ත පද්ම මහතා විසින් ආපදා කළමනාකරණ වැඩමුළුවක් පැවැත්වීම සම්බන්ධව 2018/06/07 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව ජීවිත ආරක්ෂක ක්‍රම ජීවිත ගලවා ගැනීම ප්‍රථමාධාර පිහිණුම් ක්‍රම බෝට්ටු ධාවනය හා හැසිරීම යන කරුණු අඩංගු කරමින් හදිසි ආපදාවකදී කණ්ඩායමක් ලෙස මුහුණ දිය යුතු ආකාරය පිළිබඳ පූර්ව දැණුමක් ලබා දීම හා සැළැස්මක් සකස් කර ගැනීම අරමුණු කර ගෙන නාගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් හා ආයතන නිලධාරීන්, සේවකයන් ඉලක්ක කර ගනිමින් 50 දෙනෙකු සඳහා තල්ගස්වල වැව අසල ආපදා කළමනාකරණ පුහුණු වැඩමුළුව පැවැත්වීමට නියමිත බව සඳහන් විය.

ඒ අනුව මාතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හිටපු අධ්‍යක්ෂ මේජර් සම්පත් බාලසූරිය මහතා ඇතුළු කණ්ඩායම සම්පත් දායකත්වය ලබා දෙමින් එකී පුහුණුව සංවිධානය කිරීමට යෝජනා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව සභාවේ ඒකමතික එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.

**XI. විෂය ලිපිකරු කේ. කේ. අවන්ත පද්ම මහතා විසින් හදිසි ආපදා තත්වයන්ට මුහුණ දීම සඳහා  ආපදා කළමනාකරණ ඒකකයක් සභාව තුල පිහිටුවීමට අවශ්‍ය සම්පත් ලබා දෙන ලෙස 2018/06/07 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව කොට්ඨාශ 15 මූලික කර ගනිමින් වතුර මෝටර් 15, ජෙනරේටර් 15, ළිං ඉසින යන්ත්‍ර 15, වතුර ටැංකි 15, වතුර හෝස් 100ml – 15 බෝට්ටු 05, ජීවිතාරක්ෂක ජැකට් 500, චෙන්සෝ

මැෂින් 15, කුඩාරම් 100, විදුලි පන්දම්, අත්පොරොව, පිහි , කැති, උදළු සහ සවල් වැනි උපකරණ ඉල්ලුම් කර ඇත.

පෙර පැවති ගංවතුර ආපදා අවස්ථාවන්හිදී ඒ සියළු උපකරණ අප සභාව වෙත අප සභාව වෙත ලබා දී ඇති බවත්, වර්තමානය වන විට එම උපකරනවලට සිදු වූ දෙයක් නොමැති බවත් ගරු මන්ත්‍රීවරුන් තම අදහස් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව අදාළ උපකරණ ලබා ගැනීම සදහා ඉල්ලීම් ලිපියක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට යවන ලෙස සභාවේ එකගතාවය පළ විය.

**XII. 2017/12/31 දිනට පැවති භාණ්ඩ සමීක්ෂණයට අනුව භාවිතයෙන් ඉවත් කරන ලද රතු පැහැති ට්‍රේලර් ජල බවුසරය අංක දපපා/සං/03/අපහරණ හා 2018/03/09 දිනැති පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරු තක්සේරු වාර්තාවට අනුව ඉදිරියේදී අපහරණය කිරීමට යෝජනා කරමි.**

එම යෝජනාව සභාවේ ඒකමතික එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.

**XIII. 2017/12/31 දිනට පැවති භාණ්ඩ සමීක්ෂණයට අනුව භාවිතයෙන් ඉවත් කරන ලද අඩි 10X6 ප්‍රමාණයේ රතු පැහැති SPRV 5014 අංක දරණ ට්‍රේලරය අංක දපස/සං/03/අපහරණ හා 2018.05.09 දිනැති පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරු තක්සේරු වාර්තාවට අනුව ඉදිරියේදී අපහරණය කිරීමට යෝජනා කරමි.**

එම යෝජනාව සභාවේ ඒකමතික එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.

**XIV.2017/12/31 දිනට පැවති භාණ්ඩ සමීක්ෂණයට අනුව භාවිතයෙන් ඉවත් කරන ලද අංක SP GQ 8970 දරණ බැකෝ යන්ත්‍රය මල බැදී ඉදිරිපස කොටස දිරා ඇති බැවින් රා.මූ. චක්‍රලේඛ 02/2015,04(අ) හි II ඛණ්ඩය යටතේ වාහනයක් ලෙස ප්‍රධාන ලේකම්ගේ අංක CSS/03/09/12 හා 2017.11.30 දිනැති ලිපියට අනුව ඉදිරියේදී අපහරණය කිරීමට යෝජනා කරමි.**

J.C.B. යන්ත්‍රයේ වෙන්දේසි මුදල රු. 500000.00 කි. මෙය සෑදීමට නම් රුපියල් ලක්ෂ 20 ක් පමණ යන බවද සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී. 2011 වසරේ සිට මෙම වාහනය ධාවනය නවතා ඇත. මෙම J.C.B. යන්ත්‍රය වර්තමානයේ කෝටි 1 ක් පමණ මිළ වන අතර එම යන්ත්‍රය වෙන්දේසි කරනවාට වඩා නැවත් සකස් කර ප්‍රයෝජනයට ගැනීම සුදුසු යැයි ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

දැනට එම J.C.B. යන්ත්‍රය සෑදිය නොහැකි බවත්, නමුත් කළින් එය සාදා භාවිතා කිරීමට හැකියාවතිබූ බවද ගරු මන්ත්‍රී අජිඩ් එඩේරආරච්චි මහතා ප්‍රකාශ කරන ලදී.

එම J.C.B. යන්ත්‍රය අපහරණය කිරීමේ යෝජනාවට සභාවේ ඒකමතික එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.

**XV. PF 7360 අංක දරණ කැබ්රථයේ රියදුරු එම්. ඒ. වසන්ත මහතා විසින් PF 7360 කැබ් රථය සර්විස් කිරීම සදහා 2018/06/08 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපියට අනුව කලින් කැබ්රථය සර්විස් කර ඇත්තේ 123850 Km වන අතර නැවත සර්විස් කල යුත්තේ 128850 Km ධාවනයෙන් පසුවයි. වර්තමානයේ මීටරය 127429 Km පවතින බැවින් සේවා කිරීමට තවදුරටත් ඉතිරිව පවතින්නේ ඉතා සීමිත කිලෝමීටර් ගණනක් වන බැවින් වාහනය සර්විස් කිරීමට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

වාහනය කලින් සේවා කල යුනයිටඩ් මෝටර්ස් ආයතනය වෙතින් සේවා ලබා ගැනීම සම්බන්ධව සභාවේ ඒකමතික එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.

**XVI.. ගරු සභාපතිතුමාගේ සහ උප සභාපතිතුමාගේ නිවසේ මාසික දුරකථන බිල්පත් සදහා ගෙවීම් සිදු කිරීම සදහා අවශ්‍ය ගෙවීම් සීමාවක් යොදන ලෙස යෝජනා කරමි.**

ගරු සභාපතිතුමන්ගේ නිවසේ දුරකථන බිල්පත සදහා උපරිම සීමාව රු. 7500.00 ක් වන අතර ගරු උප සභාපතිතුමන්ගේ නිවසේ දුරකථන බිල්පත් සදහා උපරිම සීමාව රු. 5000.00 ක් ලෙස පෙර තිබූ සීමාවන්ම යොදා ගැනීමට සභාවේ ඒකමතික එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.

මෙහිදී ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් දුරකථනයක් ඉල්ලුම් කර ලිපියක් ඉදිරිපත් කර ඇති අතර එම දුරකථනය කඩිනමින් ලබා දීමට කටයුතු කරන මෙන් එතුමා විසින් ඉල්ලා සිටින බවද ප්‍රකාශ කරන ලදී.

මෙහිදී මෙය උප සභාපතිතුමන්ගේ අයිතිවාසිකමක් වන අතර කඩිනමින් ලබා දිය යුතු බව ද සභාව විසින් තීරණය කරන ලදී.

**XVII.නාගොඩ ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම පවත්වනු ලබන රැස්වීම් ශාලාව වායු සමීකරණය කිරීමට යෝජනා කරමි.**

එම යෝජනාව සදහා සභාවේ ඒකමතික එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.

**XVIII.තාක්ෂණික නිලධාරීන්ට මාර්ග ඇස්තමේන්තු කිරීමට අවශ්‍ය ලෙවල් මැෂින් 1 ක් සභාව සදහා මිළදී ගැනීමට යෝජනා කරමි.**

සභාවේ තාක්ෂණික නිලධාරීන්ට පස් සහිත මාර්ග, පිට්ටනි ඇස්තමේන්තු සකස් කිරීමට ලෙවල් මැෂින් 1 ක් අවශ්‍ය වන අතර එම උපකරණ ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා තම අදහස් ප්‍රකාශ කරන ලදී.

මිළ ගණන් කැදවා සුදුසු ස්ථානයකින් ලෙවල් මැෂින් 1 ක් මිළදී ගැනීමට සභාවේ එකගත්වය පළ විය.

### 8.2 කර්මාන්ත යෝජනා

I. වරාය හා නාවික කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමාගේ යෝජනාවකට අනුව උඩුගම කැටගොඩ පිහිටි ඉඹුල්කොටුකන්ද කන්ද පාර කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම සම්බන්ධව 2018/03/26 දිනැතිව එවන ලද ලිපිය සභාගත කරන ලදී. **එම ලිපියට අනුව දක්වන ලද රු. ලක්ෂ 15 ක මුදල වැඩිකර රු. ලක්ෂ 20 ක උපරිමයකට යටත්ව නැවත ඇස්තමේන්තු සකස් කරන ලෙස දක්වා තිබූ අතර එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.**

II. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කිලෝමීටර් 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන -2018 යටතේ 2018.08.23 දිනැතිව එවන ලද ලිපිය සභාගත කරන ලදී.

එම ලිපියට අනුව ගරු සභාපතිතුමා විසින් පහත යෝජනා ඉදිරිපත් කර ඇති අතර එම යෝජනා සභා අනුමැතියට ඉදිරිපත් කරන ලදී.
01. අමුන්දර - ගෝණදෙනිය මාර්ගය සංවර්ධනය කිරීම
02. යටලමත්ත - බරවමුල්ල - මාමණදොළ - නාකියාදෙණිය මාර්ගය සංවර්ධනය කිරීම
03. තල්ගස්වල- කුඹුරුහේන- කොළඹකඩේ මාර්ගය සංවර්ධනය කිරීම
04. නාගොඩ- ගම්මැද්දේගොඩ - පඤ්ඤාලෝක මාවත මාර්ගය සංවර්ධනය කිරීම
05. කැප්පිටියාගොඩ - පඹේදෙණිය - කිරිමැටිය මාර්ගය සංවර්ධනය කිරීම

**ඉහත යෝජනා සියල්ලම ඉටුකිරීම සම්බන්ධව සභාවේ ඒකමාතික එකගතාවය පළ කල අතර ඉහත යෝජනා සභා සම්මත විය.**

III. ගරු සභාපතිතුමන් විසින් නාගොඩ ඉහළ ග්‍රාම සේවා වසමේ මුලන අන්නාසිගලහේන සිට ඇලවත්තවිල මාවත කුරුපනාව දක්වා දිවෙන මාර්ගය සංවර්ධනය කිරීමට රු. ලක්ෂ 45 ක (රු. 4500,000.00) මුදලක ඇස්තමේන්තුවක් සභාවට ඉදිරිපත් කරන ලදී.

**එම යෝජනාව සදහා සභාවේ ඒකමතික එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.**

IV. දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍ය යූ. ජී. ඩී. ආරියතිලක මැතිතුමන්ගේ යෝජනා සදහා මාර්ග ඇස්තමේන්තු ලබාගැනීම සදහා මාර්ග ඇස්තමේන්තු ලබා ගැනීම සම්බන්ධව 2018/05/30 දිනැතිව එවන ලද ලිපිය සභාගත කරන ලදී.

එම ලිපියට අනුව පහත මාර්ග සම්බන්ධ යෝජනා ඉදිරිපත් විය
1. උඩුගම අලුත්වත්ත පැණිගලයාය පාර - 500m - ලක්ෂ 20

2. උඩුගම අලුත්වත්ත, 18 කන්ද මාර්ගය - 500m - ලක්ෂ 20
3. උඩුගම දකුණ සුදුවැලිපත කැකිල්ලකන්ද මාර්ගය - 500m - ලක්ෂ 20
**ඉහත යෝජනා සඳහා සභාව විසින් ඒකමතිකව එකගතාවය පළ කර අතර එම යෝජනා සභා සම්මත විය.**

V. ප්‍රධාන ලේකම්ගේ අංක CSS/4/7/22 හා 2018/05/07 දිනැති ලිපිය සභාගත කරන ලදී. එම ලිපියට අනුව දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ශාන් විජයලාල්ද සිල්වා මැතිතුමන්ගේ යෝජනා අනුව පසුබට කලාප සංවර්ධන වැඩසටහන යටතේ උඩුගම දකුණ සුදුවැලිපත ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමට රු. 300000.00 ක් හා උඩුගම අලුත්වත්ත කොරගමලේ ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමට රු. 400000.00 ක් අනුමත වී ඇති අතර එය සභා අනුමැතියට ඉදිරිපත් කරන ලදී. ඉහත දක්වන ලද ඉඩම්වල අයිතිය තහවුරු කර ගත යුතු බවද වැඩිදුරටත් සඳහන් කරමි.
**ඒ අනුව ඉහත යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සභාව ඒකමතික එකගතාවය පළ කල අතර ඉහත යෝජනා සභා සම්මත විය.**

මෙහිදී විමධ්‍යගත අරමුදලින් යම් මන්ත්‍රීතුමෙක් යමක් කිරීමට යාමේදී ඉඩම් වෙනත් කෙනෙකුගේ නමට තිබුණත් අයිතිය පිළිබඳ ප්‍රශ්න පැන නොනගින බවත් එවැනි ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා වැඩි කාලයක් ගත වන බවත්, එවිට කර්මාන්ත අවිච්ඡේද වීමට හේතු වන බවත්, ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා ප්‍රකාශ කල අතර එකී ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සම්බන්ධව එතුමන් කටයුතු සිදු කරන බවටද එම අයිතිය ඉදිරියේදී ලැබීමට සළස්වන බවද ප්‍රකාශ කර සිටියේය.

පසුගිය රජයන්වලින් ඒ සම්බන්ධ නිශ්චිත ක්‍රමවේද අනුගමනය නොකර ඇති බැවින් වර්තමානයේ එම කටයුතු නිශ්චිත ක්‍රමවේදයකට අනුව සිදුවන බවද චන්ද්‍රා මහතාද ප්‍රකාශ කර සිටියේය.

VI. වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම අමාත්‍යතුමාගේ යෝජනා අනුව 2018/5/4 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලද අතර එම ලිපියට අනුව උඩුගම මහජන ක්‍රීඩාංගණය සඳහා ක්‍රීඩා මණ්ඩපයක් සෑදීමට ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට ඉල්ලීම් සිදු කර ඇත.

**ඒ අනුව ඉහත යෝජනාව සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.**

VII. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන - 2018 යටතේ ප්‍රාදේශීය සභාවට මිලියන 4 ක ප්‍රතිපාදන වෙන්ව ඇති අතර ඒ සඳහා නාගොඩ හංදියේ සිට කුරුපනාව මාර්ගය යා වෙන අතුරු මාර්ගය එනම් ලියද්ද මාවත වල් බිහි වී ඇති බැවින් ඩෙංගු වැනි වසංගත තත්වයන් ඇති විය හැකි බැවින් එම මාර්ගය සංවර්ධනය කිරීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.
**ඉහත යෝජනාව සඳහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.**

VIII. දකුණු පළාත් සභා ගරු මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමන්ගේ ප්‍රතිපාදන යටතේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දුෂ්කර මාර්ග සංවර්ධනය කිරීම සඳහා රු.

200000.00 (ලක්ෂ 02) ක මුදලක් වෙන් කර ඇති අතර ඒ සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 3/2/6 හා 2018/05/24 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**ඉහත යෝජනාව සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.**

IX. දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍ය යූ. පී. ඩී. ආරියතිලක මැතිතුමන්ගේ යෝජනා යටතේ බී. ඩී. 5 තලගහහේන අතුරු මාර්ගයේ ඇල හරහා පාලම ඉදි කිරීමට ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට 2018/05/14 දිනැතිව එවන ලද ලිපිය සභාගත කරන ලදී.
**ඉහත යෝජනාව සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.**

X. ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් 2018/06/03 දිනැතිව උඩුගම අලුත්වත්ත ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස අපවිත්‍රව ඇති බැවින් J.C.B. යන්ත්‍රයක් යොදා ශුද්ධ පවිත්‍ර කර ගැනීමට ඉල්ලා සිටිමින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී. ඒ සම්බන්ධව රු. 25000.00 ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.
**ඉහත යෝජනාව සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනාව සභා සම්මත විය.**

**8.3. ගරු සභාපතිතුමන් හා මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. පිටඹිවිට මුහන්දිරම් තුරාව මාර්ගය පිළිසකර කිරීම
II. නාගොඩ ගග අද්දර මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම
III. නාගොඩ කුරුපනාව අලවත්ත විල පාර බෝක්කු දමා කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම
IV. අන්නාසිගලහේන ශ්‍රමදාන මාවත පිළිසකර කිරීම
V. කුරුපනාව මරණාධාර සමිතිය අසළ සිට අලවත්ත විල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම
VI. නාගොඩ ජයසිංහාරාම මාවත කුරුපනාව යා වන මාර්ගය අවසන් කොටස සංවර්ධනය කිරීම
VII. නාගොඩ මංසන්ධියේ සිට කුරුපනාව මාර්ගයට පිවිසෙන ලියද්ද පාර සංවර්ධනය කිරීම

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. වාඩිගොඩ නයාමුල්ල කන්ද මාර්ගය ලීලා ධර්මසේකර මාවත නමින් නම් කරන ලෙස ඉල්ලමි.
II. උඩලමත්ත මීපෙ ගෙදර ලග ඒදණ්ඩ නැවත සකස් කිරීම සදහා අවශ්‍ය පොල් ගස් හා අනෙකුත් ද්‍රව්‍යයන් ලබා දීම. ඒ සදහා අවශ්‍ය ශ්‍රමය සදහා සෘජු ශ්‍රමික පදනමින් ගෙවීම් සදහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙෂ යෝජනා කරමි.
III. උඩලමත්ත මීපෙ ගෙදර ඒදණ්ඩ වෙනුවට එච්අයන් යොදා අඩිපාලමක් සකස් කිරීමට ඇස්තමේන්තුවක් සකස් කිරීමට යෝජනා කිරීම

IV. උඩලමත්ත කන්දඋඩදෙනිය මාර්ගය පිළිසකර කිරීමට වීරකෝන් මහතාගේ නිවස අසලට කොරිපස් කියුබ් කිහිපයක් ලබා දෙන ලෙස යෝජනා කරමි. ඒ සදහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස ඉල්ලමි.

V. බණ්ඩාරනායකපුර මහවල වංගුව අකුලහේන මාර්ගය සදහා සිළිංඩර ලබාදීමට ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස ඉල්ලා සිටිමි.

VI. උඩලමත්ත තල්පෙගෙදර වත්ත මාර්ගය සදහා පැති බැම්මක් සකස් කිරීමට ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස ඉල්ලා සිටිමි.

VII. බණ්ඩාරනායකපුර බංඩිහේන මාර්ගයට J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීමට ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස ඉල්ලා සිටිමි.

VIII. විලමාවත I පටුමග සදහා J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීමට ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස ඉල්ලා සිටිමි.

IX. උඩලමත්ත දිමුතු වෙළඳසැල යියොක්කාහේන මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා සකස් කිරීමට යෝජනා කරමි.

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

ගරු උප සභාපතිතුමන් විසින් පහත යෝජනා පිළිබදව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලදී.

වාඩිගොඩ නයාමුල්ල කන්ද මාර්ගය ලීලා ධර්මසේකර මාවත නමින් නම් කරන ලෙස ඉල්ලන ලද අතර ලීලා ධර්මසේකර මාවත නමින් මෙම මාර්ගය නම් කිරීම සුදුසු වන අතර ඊට හේතුව ලීලා ධර්මසේකර මැතිණිය ගමේ සිටින ප්‍රජා සේවිකාවක් වශයෙන් එතුමිය කල සේවාව ඇගයීමට එම මාර්ගය ලීලා ධර්මසේකර මාවත ලෙස නම් කිරීමට යෝජනා කල බව මෙහිදී උප සභාපති ගාමිණී සුසන්ත මහතා අදහස් ප්‍රකාශ කරන ලදී. මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී යම් පුද්ගලයෙක් විරුද්ධ වන විටදී එතුමිය නඩුවකට ගොස් ප්‍රාදේශීය ලේකම් තුමිය සමගද සාකච්ඡා කර පාර සම්බන්ධව පාර්ලිමේන්තුවෙත් කතා කර පාර නිදහස් කර ගැනීමට ඇප කැප වූ බවත්, ඒ වෙනුවෙන් එතුමිය නමින් මාර්ගය නම් කර එම පුවරුව ලබා දෙන ලෙසත් උප සභාපතිතුමන් වැඩිදුරටත් සදහන් කලේය.

ප්‍රදේශයේ පවතින එකම අඩි පාලම වන මීපෙ ගෙදර ලග ඒදණ්ඩ මිනිසුන් නිතරම පොල්කදන් දාලා ඇණ ගහලා මැෂින් දාලා ශ්‍රමය යොදා ගෙන සකස් කර ගන්නා අතර ප්‍රදේශයේ ගරු මන්ත්‍රීවරයෙකුත් සිටින අතර ඒ සදහා ඍජු ශ්‍රමය ඇස්තමේන්තුව සකස් කර ඒ සදහා ගෙවීම් කිරීමට කටයුතු කරන්නැයි එතුමා ඉල්ලා සිටියේය.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී පී රංජිත් ජයවීර මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. මාපලගම කුඹුරුහේන මාර්ගය දෙපස කාණු පද්ධතිය ස්ථාපිත කිරීම

II. කුඹුරුහේන කොළෙඹ කඩේට යන මාර්ගය අවට වීථි පහන් ස්ථාපිත කිරීම

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් එඩේරආරච්චි මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. කුරුන්ද දහවුල්හේන මාර්ගයේ මැද පවතින අවධානම් සහිත ලංකා විදුලිබල මණ්ඩලයට අයත් විදුලි කණුව ඉවත් කිරීම
II. අබලන්ව පවතින උඩුගම මොරගල්මුල්ල මාර්ගය පිළිසකර කිරීම
III. උඩුගම කොට්ඨාශය වෙනුවෙන් ඇප්තොප්වත්ත ඉඩමෙහි සුසාන භූමියක් ඉදි කිරීම
IV. උඩුගම මහජන ක්‍රීඩාංගණය නවීකරණය කිරීම
V. 2018 බටහිර ගමගොඩ ගංවතුරින් පීඩාවිදින ගම්මානයක් බැවින් ආපදා තත්වයකදී ඔවුන්ට රැදී සිටීමට ප්‍රජා ශාලාවක් ඉදි කිරීම

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. උඩුගම දකුණ, උඩුගම මධ්‍යම හා උඩුගම අලුත්වත්ත ග්‍රාම නිලධාරී වසම්වල අක්‍රිය තත්වයේ පවතින වීථි පහන් සවි කිරීම
II. උඩුගම නැගෙනහිර බංගම පාරේ අම්බලම්පිටි දොලෙන් එහා වීථි පහන් සවි කිරීම
III. උඩුගම මධ්‍යම දොඩංගොඩ මාවත හා උඩුගම නැගෙනහිර පැගිරිහේන මාවත කම්කරුවන් යොදා එලිපෙහෙලි කිරීම
IV. උඩුගම දකුණ අලුත්වත්ත ප්‍රදේශවල කසල එකතු කිරීම යලි ආරම්භ කිරීම
V. උඩුගම රන්කැකුළු පෙරපාසලට අවශ්‍ය විදුළි සැපයුම ලබා ගැනීම සහ ඉඩම සභාවට පවරා ගැනීම
VI. උඩුගම නැගෙනහිර රන්කැකුළු පෙර පාසල පාලිකාවගේ සේවය ස්ථිර කිරීම දැනට උඩුගම දකුණ පෙර පාසලේ ගුරු සහායිකාවට ගුරුවරුන් බදවා ගැනීමේදී ප්‍රමුඛතාව ලබා දීම.
VII. උඩුගම බංගම මාර්ගයේ උඩුගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ අම්බලම්පිටි දොළ හරහා යොදා ඇති අබලන් බෝක්කුව සකස් කිරීම

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය ඉදිරිපත් කරන යෝජනා**

I. ආරියතිලක මාවත පාරේ 100 m කොන්ක්‍රීට් කිරීම
II. සැන්ඩෝ කඩේ පාර ඉහළට ඇති මාපලගම ප්‍රධාන පාර සහ ගාලුපාර සිට හමුවන තුන්මංසල පාර වන මෙය විශාල වංගු සහිත ඉතාම අබලන් මාර්ගයක් වන බැවින් 200ප දුර හෝ කොන්ක්‍රීට් කර දීම තවද මෙය සැන්ඩො කඩේ පියසෙන් ගම්මානය දක්වා ඇති එම අතුරු පාර බද්දේගම ප්‍රධාන පාරට සමන්විත වේ.
III. වළකුඹුර මංසන්ධියෙන් නාගොඩවත්ත මාර්ගයේ ඇති අතුරු මාර්ග ඉතාම අබලන් බැවින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම
IV. කැප්පිටියාගොඩ අලුත්ගේවත්ත පාර නියාගම්වත්ත බද්දේගම ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන මැටි පාර ප්‍රතිසංස්කරණය කිරීම

V. වළකුඹුර නාන පොදු ළිඳ වල් බිහිවී ඇති බැවින් නැවත එය පිළිසකර කර ජනතා ප්‍රයෝජනයට ගත හැකි ලෙස සකස් කිරීම
VI. කැප්පිටියාගොඩ ගිංගග අසළ පවතින සියළුම තොටුපලවල් ප්‍රතිසංස්කරණය කිරීම
VII. කැප්පිටියාගොඩ ප්‍රදේශවාසීන්ට පානීය ජල පහසුකම් ලබාදීමට කටයුතු කිරීම
VIII. දොරණාවිල පාරට සම්බන්ධ ඇති හොරගහකන්දට ප්‍රවිශ්ඨ වන ඉතා අබලන් මාර්ගය කොන්ක්‍රීට් කිරීම

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය ඉදිරිපත් කරන යෝජනා**

I. මාපලගම අලුත් ඉහල කොළඹකඩේ හංදියේ සිට කොවුලාන හංදිය දක්වා මාර්ගය දෙපස කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම
II. මාපලගම අලුත් ඉහල ග්‍රාමීය බැංකුව අසල පිහිටි බෝ ගහ දිරාපත් වී ඇති බැවින් එම අනතුර සදහා ක්‍රියාමාර්ග ගැනීම
III. මලාමුර 6/4 පාලම අබලන් බැවින් නව පාලමක් ඉදි කිරීම
IV. මලාමුර වී මෝල අසල බෝක්කුව ගිලා බසිමින් පවතින අතර එය ප්‍රතිසංස්කරණය කිරීම
V. මාපලගම සිට මලාමුර දක්වා වීථි ලාම්පු අක්‍රියව පවතින බැවින් එය යථා තත්වයට පත් කිරීම

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී නිහාල් වසන්ත පතිනායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. අබලන් වී ඇති ගල්කැටියාගොඩ සිට මල්වත්තහේන දක්වා ඇති මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කර ගැනීම
II. තලගහහේන මහගෙදර මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කර ගැනීම
III. මිදැල්ල තලගහහේන කලහෙගෙදර මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කර ගැනීම
IV. බී. ඩී. 05 තලගහහේන මාර්ගයේ ඇති පාලමේ ආරක්ෂිත ඇදි වැට සවි කර දීම
V. කොතේගොඩකන්ද ඉහළ කොටසේ ඇති මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කර ගැනීම

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. මාපලගම බස් නැවතුම හා තල්ගස්වල නගරයේ වීථි ලාම්පු සදහා සෝඩියම් බල්බ් සවි කිරීම
II. මාපලගම නගරයේ සිට පනංගල පෝද්දිවල පාර ආරච්චිදිගන (ආසිරි ටයර් සර්විස් අසල) බෝක්කුව අසල මාර්ගය දෙපස කාණුව ශුද්ධ කර පස් ඉවත් කිරීම
III. 215 අලුත් පහළ වසමේ අතුල දර්ශනාරාම විහාරස්ථානයට ප්‍රවේශ මාර්ගය කොන්ක්‍රීට් ගල් දැමීම

IV. 215 අලුත් පහල වසමේ නාරංගොඩ මාර්ගය පස් දමා පිරවීම
V. කුඹුරුහේන - දොලේකඩේ අසල සිට නාවින්න මාර්ගය කොන්ක්‍රීට් කිරීම
VI. කුඹුරුහේන කොටස මාර්ග කිහිපයක් බැකෝ යන්ත්‍ර යොදා ප්‍රතිසංස්කරණය කිරීම
VII. තල්ගස්වල දියවරගම තුලට ප්‍රවේශ වන මාර්ග 04 බැකෝ යන්ත්‍ර යොදා ප්‍රතිසංස්කරණය කිරීම

- **ඉහත යෝජනා සියල්ල සඳහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. උඩවැලිවිටිය තලාව අබරයි ගොවිපල අසල ඇති රජයේ ඉඩම කැබලි කොට බෙදා දීම නතර කිරීම සහ රජයේ පොදු කටයුතු සඳහා යොදා ගැනීමට ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම
II. උඩවැලිවිටිය ප්‍රාදේශීය සභා ප්‍රජා ශාලාවේ විදුලි බිල සභාවෙන් ගෙවීමට පියවර ගැනීම සහ 2019 වර්ෂයේ පෙර පාසලක් ඇරඹීමට කටයුතු කිරීම
III. උඩවැලිවිටිතලාව හොරංගල්ල මාර්ගය සංවර්ධනය කිරීම
IV. උඩවැලිවිටිය කොට්ඨාශයේ ප්‍රාදේශීය සභාව සතු මාර්ග ගැසට් මගින් පවරා ප්‍රසිද්ධ කිරීම
V. උඩවැලිවිටිය මෝදරකඩේ අසල සිට උඩවැලිවිටිතලාව මන්සන්ධිය දක්වා සහ ගම්මැද්දේගොඩ අලුත් පාලම දක්වා මාර්ගය දෙපස තණකොල කපා ශුද්ධ පවිත්‍ර කිරීම
VI. අන්නාසිගලදෙනිය පාර කොන්ක්‍රීට් කිරීම

- **ඉහත යෝජනා සියල්ල සඳහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්. පී. ගයාන් මධුෂංක මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. සුනිල් නාරංගොඩ මහතාගේ නිවස අසළ සිට ගිංගග දක්වා ඇති මලාමුර ඇළ මාර්ගය ශුද්ධ කිරීම
II. අලුත් ඉහළ සහ පරණතානායම්ගොඩ සම්බන්ධ වන ප්‍රධාන පාලම ඇණ යොදා ප්‍රතිසංස්කරණය කිරීම
III. කොළඹකඩේ හංදිය ආසන්නයේ ඇති මලාමුර ප්‍රදේශයට ඇති පාලම අසළ ඇළට ගම්වාසීන් කුණු කසල බැහැර කරන බැවින් එම ස්ථානයට කසල බදුන් ස්ථාපනය කිරීමට යෝජනා කරමි.
IV. මලාමුර නව ගම්මානයේ ස්ථාන දෙකක් සඳහා බෝක්කු යෙදීම
V. කොවිලාන සිට කම්හල්ගොඩ දක්වා ඇති මාර්ගයේ කුඩා ප්‍රමාණයේ පාලම දැඩි ලෙස අබලන් වී අවදානම් තත්වයේ ඇති නිසා ප්‍රතිසංස්කරණය කිරීම හෝ නව පාලමක් ඉදි කිරීම

- **ඉහත යෝජනා සියල්ල සඳහා  සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. ලෙහුවල ප්‍රජා ශාලාව නඩත්තු කිරීම හා පවරා ගැනීම
II. බුදපනාගම සමනල පෙර පාසල අළුත්වැඩියා කිරීම, දැල් ගැසීම හා ළමුන්ට බුද්ධ වන්දනා කිරීමට බුදු මැදුරක් සෑදීමට ප්‍රාදේශීය ලේකම්තුමිය සතු භූමියේ පර්චස් 02 ක් පවරා ගැනීමට කටයුතු කිරීම
III. උනන්විටිය සති පොළේ අපද්‍රව්‍ය ගෙන යාම සඳහා ප්‍රථමයෙන් උනන්විටිය හරහා කටඹුරාව තෙක් අපද්‍රව්‍ය රැගෙන යාමට කටයුතු කිරීම
IV. අප සභාවට අයත් සමනල පෙර පාසලේ සහාය පාලිකාව ස්ථිර සේවයට අනුයුක්ත කර ගැනීම (සේවා කාලය වසර 05)
V. අප සභාවට හොද ආදායම් මාර්ගයක් ලෙස පුරන්ව ගිය කුඹුරුවල උක් වගා කිරීම

- **ඉහත යෝජනා සියල්ල සඳහා  සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය ඉදිරිපත් කරන යෝජනා**

I. ගම්මැද්දේගොඩ පඤ්ඤාලෝක මාවත පළාත් සභාවට පවරා දීමට කටයුතු කිරීම
II. ගම්මැද්දේගොඩ උතුර රාහුල පෙර පාසලට විදුලිය ලබා දීම
III. දඩුගහහේන පොදුළිද ප්‍රතිසංස්කරණය කිරීම

- **ඉහත යෝජනා සියල්ල සඳහා  සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී බී. පී. අරුණ ශාන්ති මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. උඩුගම මහජන පොල ජනතා අයිතියට පැවරීම
II. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යන හෝටල් ආපනශාලා හා පාසල්වල ආපනශාලා පිළිබදව විධිමත් සෞඛ්‍යය ආරක්ෂක ක්‍රමවේදයක් හදුන්වාදීමට යෝජනා කරමි.
III. අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල අපට හිමි චංචල හා නිශ්චල දේපල සම්බන්ධයෙන් තක්සේරුවක් හා වර්තමාන තත්වය පිළිබදව සියළුම සභිකයින් දැනුවත් කිරීමට යෝජනා කරමි.

- **ඉහත යෝජනා සියල්ල සඳහා  සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. පොලොන්නරුව කඩේ ගාව සිට ඇතුල්පාර පස් දමා සකස් කිරීම හා බෝක්කු දැමීම
II. ගල්ලන්දල ඇල ඉහල මාර්ගය බෝක්කු දමා සකස් කිරීම
III. නෙළු ඇල මුකලාන පාර J.C.B. කර සකස් කිරීම
IV. 50 මාර්ගය J.C.B. කර සකස් කිරීම
V. 65 මාර්ගය J.C.B. කර සකස් කිරීම

VI. අක්කරවත්ත පාර J.C.B. කර සකස් කිරීම
VII. හෝමදොල හංදියේ ත්‍රීවිල් රථගාල නියමිත ස්ථානයේ සකස් කර දීම

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**213 පරණතානායම්ගොඩ ග්‍රාම නිලධාරී වසම**

I. උඩුමුල්ල මාර්ගය ගොඩකර කොන්ක්‍රීට් කිරීම
II. අරුක්ගමුව මාර්ගය කොන්ක්‍රීට් කිරීම
III. පුරන් වූ කුඹුරු අස්වැද්දීමට අක්කර පහ සහ හීන්දෙනියගොඩ යායට අයත් ඇල මාර්ගය සහ උඩුමුල්ල මැටිම ඇළ පිළිසකර කිරීම

**213 B පරණතානායම්ගොඩ ග්‍රාම නිලධාරී වසම**

IV. සංවර්ධන ගම්මානයට යන ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම
V. පුස්සල්ලකාර මාර්ගය කොන්ක්‍රීට් කිරීම
VI. පුරන් කුඹුරු අස්වැද්දීමට, පුස්සල්ලකාර තේක්කවත්ත ඇළ මාර්ගය පිළිසකර කර කරපටුව මාර්ගයේ ඇති ජල මට්ටමට වඩා උඩින් ඉදි කර ඇති බෝක්කුව පහත් කර සංවර්ධනය කිරීම

**213A පරණතානායම්ගොඩ ග්‍රාම නිලධාරී වසම**

VII. අම්බුව මාර්ගය සංවර්ධනය කිරීම
VIII. සංවර්ධන ගම්මානයේ සිට වාඩියකන්ද දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරීම
IX. මල්වත්තහේන මාර්ගයේ ඉතිරි අදියර කොන්ක්‍රීට් කිරීම
X. පරණතානායම්ගොඩ **213 B** සහන ගොවි සංවිධානය විසින් යොමු කරන ලද රක්ෂණ ගම්මානයේ සිට ගොණදෙනිය මාර්ගයේ බෝක්කුව උසින් පිහිටා ඇති බැවින් කරච්ච යාය දෙපස වගා කිරීමට නොහැකි වී ඇති බව දැන්වීමෙන් අනතුරුව ඔබගේ නිලධාරී මහතුන් විසින් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව එය සිදු කිරීම සදහා ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් අවසර ලබා ගෙන ඇති නමුත් තවමත් මෙම කටයුතු සිදු වී නොමැති බැවින් මෙය සිදු කිරීමට කටයුතු යොදන මෙන් ඉල්ලා සිටිමි. (ඔබේ අංකය ගා/නාප්‍රාස/සං02 හා 2017.12.)

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**09. කාරක සභා වාර්තා**

**9.1. මුදල් ගෙවීම් වාර්තාව සම්මත කිරීම**

**<u>ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම්</u>**

01. එච් එල් කේ ශ්‍රීනිත් රුක්ෂාන් උඩුගම

උඩුගම මහජන පුස්තකාලයට පුවත් පත් සැපයීම වෙනුවෙන් ගෙවීම
2018 අප්‍රේල් - රු 3935.00

02. පෝස්ට් මාස්ටර් ජනරාල්
2018 වර්ෂය සඳහා තැපැල් ගාස්තු ගෙවීම - රු.10000.00

03. ජෝජ් අබේගුණවර්ධන මයා, නාගොඩ
ප්‍රධාන කාර්යාලය සඳහා පීරිසි කොප්ප වීදුරු කට්ටල මිළදී ගැනීමේ බිල්පත - රු. 8125.00

**ඉදිරි ගෙවීම්**

01.ලේකම්,නාගොඩ ප්‍රාදේශීය සභාව.

උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායමට 2018 අප්‍රේල් ,මැයි මාස දෙක

සඳහා ඉන්ධන වෙනුවෙන් දීමනා ගෙවීම. -රු.162000.00

02.සභිපතිතුමා,උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායමට 2018 අප්‍රේල් ,මැයි

,ජුනි මාස තුන සඳහා පෙරගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත. - රු.85500.00

- **ඉහත ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් සියල්ල සඳහා සභාවේ එකගතාවය පළ වූ අතර එම ගෙවීම් සභා සම්මත විය.**

**9.2. මුදල් කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම**

**2018.06.05 දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව.**

**යෝජනා**

01. උඩුගම බහුකාර්ය ගොඩනැගිල්ල, පිට්ටනි හා වෙනත් සභාව සතු දේපල කුලියට දීමේදී හා සේවා සැපයීමේදී පසුව එම වෙන් කිරීම අවලංගු වුව හොත් රඳවා ගන්නා තැන්පතු මුදලින් හෝ කුලී ආදායමින් 25% ක වටිනාකමක් ආපසු නොගෙවා තබා ගැනීමට යෝජනා කිරීම.

**ඉදිරි ගෙවීම්**

**01. මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම**

**2018 මැයි මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 935.40 |
| II. | 2813038709 | - කැකුලු පෙර පාසල | - රු 240.00 |
| III. | 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු 5034.60 |
| IV. | 4507357802 | - සමනල පෙර පාසල | - රු. 459.60 |
| V. | 4509082800 | - උදාර පෙර පාසල | - රු. 349.80 |
| VI. | 8617046104 | - බහුකාර්ය මධ්‍යස්ථානය | - රු 752.40 |
| VII. | 4592323912 | - යමුනා ස්ටෝර්ස් | - රු. 240.00 |
| VIII. | 2810236100 | - මා.ක. ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| IX. | 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 569.40 |
| X. | 4501090200 | - මා.වෙ.සංකීර්ණ කොරිඩෝව | - රු. 880.50 |
| XI. | 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු 1392.90 |

**2018 අප්‍රේල් මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 4599064300 | - ගෝණාදෙනිය පෙර පාසල | - රු 404.70 |
| II. | 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු 276.60 |

**2018 ජනවාරි මස විදුලි බිල්පත**

| | | | |
|---|---|---|---|
| I. | 4507357802 | - සමනල පෙර පාසල | - රු. 294.90 |

**2018 පෙබරවාරි මස විදුලි බිල්පත**

| | | | |
|---|---|---|---|
| I. | 4599064300 | - ගෝණාදෙනිය පෙර පාසල | - රු 313.20 |

**2018 මාර්තු මස විදුලි බිල්පත**

| | | | |
|---|---|---|---|
| I. | 4507357802 | - සමනල පෙර පාසල | - රු. 294.90 |

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**
**අප්‍රේල් මස දුරකතන බිල්පත් ගෙවීම්**

| | | |
|---|---|---|
| I. | 0912296433- ප්‍රධාන කාර්යාලය | - රු 7568.35 |
| II. | 0912296537- ප්‍රධාන කාර්යාලය | - රු 3719.34 |
| III. | 0912296577- මාපලගම උප කාර්යාලය | - රු 516.38 |

**03. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය**

ජල බිල්පත් ගෙවීම- උඩුගම උප කාර්යාලය-33/53/003/008/11
(2018.04.19-2018.05.18) - රු 1783.65

04. මොබිටෙල් පුද්ගලික සමාගම
පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කෙටි පණිවුඩ සේවා ගාස්තු ගෙවීම - රු. 299.36

**05. සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය**

**2018 අප්‍රේල් මස ඉන්ධන ලබා ගැනීමේ බිල්පත්**

| | | |
|---|---|---|
| PF 7360 කැබ් රථය | ඩීසල් ලීටර් 510 ක | - රු.48450.00 |
| LL 7103 ටිපර් රථය | ඩීසල් ලීටර් 210 ක | - රු. 19950.00 |
| LL 7650 කෘෘ කැබ් | ඩීසල් ලීටර් 207 ක | - රු. 19665.00 |
| RD 1637 ට්‍රැක්ටරය | ඩීසල් ලීටර් 46 ක | - රු. 4370.00 |
| 252-6478 කැබ් රථය | ඩීසල් ලීටර් 130 ක | - රු 12350.00 |
| ගබඩාව සඳහා | පෙට්‍රල් ලීටර් 34 ක | - රු. 3230.00 |

**06. ලේකම් , නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. මුදල් ප්‍රතිපූර්ණය කිරීම

- LL 7650 කෘෘ කැබ් රථය දුම් වාර්තාව ලබා ගැනීම - රු. 1610.00
- LL 7650 කෘෘ කැබ් රථය යෝග්‍යතා සහතිකය ලබා ගැනීම - රු. 500.00
- LL 7103 ටිපර් රථය දුම් වාර්තාව ලබා ගැනීම - රු. 1610.00
- LL 7103 ටිපර් රථය යෝග්‍යතා සහතිකය ලබා ගැනීම - රු. 500.00
- LL 7103 ටිපර් රථය ආදායම් වාර්තාව ලබා ගැනීම - රු. 7700.00
- LL 7366 බවුසරයේ යෝග්‍යතා සහතිකය ලබා ගැනීම - රු. 500.00

- LL 7366 බවුසරයේ දුම් වාර්තාව ලබා ගැනීම - රු. 1610.00
- 252-6478 කැබ් රථය ආදායම් බලපත්‍රය ලබා ගැනීම - රු. 9900.00

II. මහජන සෞඛ්‍ය පරික්ෂක නිලධාරීන්ට ආහාර සාම්පාල් ලබා ගැනීම සඳහා අක්මුදල් ලබා දීම

- එච්. එල්. එන්. පී. කුමාර මයා - රු. 1000.00
- එච්. ඩබ්. පී. අමරනාත් මයා - රු. 1000.00

**07. ගමන් වියදම් ගෙවීම්**

**2018 මැයි**

I. එම්. එච්. ෆර්සියා ෆර්වින් මිය - රු.2060.00
II. ඩී. එන්. ඩී. පලිහවඩන මිය - රු. 542.00
III. දිලිනි දිසානායක මිය - රු. 462.00
IV. එස්. කේ. මල්ලවආරච්චි මයා - රු.1098.00
V. එම්. ඒ. වසන්ත මයා - රු.1575.00
VI. අයි. කේ. ඉන්දික කුමාර මයා - රු. 2016.00
VII. එන්. ජී. ගීතා රංජනී මිය - රු. 2008.00
VIII. බි. ඩී. එල්. ඩී. කුමාරි මිය - රු. 1506.00
IX. ටී. සෙව්වන්දි මෙය - රු. 1506.00
X. ශ්‍රියානි කිරින්දගේ මිය - රු. 1560.00
XI. එම්. එම්. මහින්දදාස මයා - රු. 2016.00
XII. එම්. ඒ. ඩිලානි චන්ද්‍රප්‍රභා මෙය - රු. 522.00
XIII. පී. කේ. කුසුමලතා මෙය - රු. 440.00
XIV. එච්. ඩී. එන්. පී. ගුණවර්ධන - රු. 442.00
XV. එච්. පී. මල්කාන්ති මිය - රු. 442.00
XVI. ඉරේෂා මල්කාන්ති මිය - රු. 2008.00
XVII. කේ. පී.ජී. ප්‍රසන්ත මයා - රු. 2016.00

**ගමන් වියදම් ගෙවීම්**

**2018 අප්‍රේල්**

I. පී. කේ. කුසුමලතා මෙය - රු. 504.00
II. ඩී. පී. තිලානි මේබලා මිය - රු. 512.00
III. එම්. කේ. ශීලා රංජනී මිය - රු. 504.00
IV. එච්. පී. මල්කාන්ති මිය - රු.1004.00
V. එච්. ඩී. එන්. පී. ගුණවර්ධන - රු. 502.00

**2018 මාර්තු**

I. ඩී. එන්. ඩී. පලිහවඩන මිය - රු. 267.00

**08. පරිවර්ථිත ගමන් වියදම් 2017 දෙසැම්බර්**

I. ඩී. එන්. ඩී. පලිහවඩන මිය - රු.3000.00

II. දිලිනි දිසානායක මිය - රු. 3133.00

**පරිවර්ථිත ගමන් වියදම් 2018 මැයි**

I. කේ. පී. ජයනි මිය - රු. 3000.00

**09. අතිකාල දීමනා ගෙවීම්**
**2018 මැයි**

I. එම්. ඒ. වසන්ත මයා - රු. 7034.00
II. බී. පී. පියතිලක මයා - රු. 7034.00
III. ඩී. ටී. ආර්. ඒ. ගුණරත්න මයා - රු. 4959.00
IV. කේ. කේ. අවන්ත පද්ම මයා - රු. 1728.15
V. ඒ. එච්. පී. සංජීව මයා - රු. 4230.00
VI. එන්. එම්. රජිත මයා - රු. 3000.00

**2018 අප්‍රේල්**

I. එන්. එම්. රජිත මයා - රු. 3000.00
II. ඩී. ටී. ආර්. ඒ. ගුණරත්න මයා - රු. 6033.45
III. ඩබ්. කේ. සම්පත් සංජීව මයා - රු. 9000.00

10. එච්. එල්. එන්. පී. කුමාර මයා , ම.සෞ.ප.

i. ආහාර පනතේ නඩු සඳහා උඩුගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම හා ඒම වෙනුවෙන් ගෙවීම් (2018.05.03) - රු. 236.00
ii. ආහාර පනතේ නඩු සඳහා උඩුගම මහේස්ත්‍රාත් අධිකරණයට (2018.04.04) හා ආහාර සාම්පල් ලබා දීම සඳහා කළුතර සෞඛ්‍ය විද්‍යායාතනයට යාම හා ඒම - රු. 624.00

11. එච්. ඩබ්.පී. අමරනාත් මයා , ම.සෞ.ප.
ආහාර සාම්පල් ලබා දීම සඳහා කළුතර සෞඛ්‍ය විද්‍යායාතනයට යාම හා ඒම වෙනුවෙන් ගෙවීම් (2018.05.31) - රු. 500.00

12. ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී එල් සී
MP 2001 L ඡායා පිටපත් යන්ත්‍රයේ ගබඩා කිරීමට ගෙන්වූ ටෝනර් කාට්ලේජය මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 7465.00

13. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිග විගණන ගාස්තු මුදලින් කොටසක් ගෙවීම - රු.10000.00

14. මාපලගම පැරණි කඩ කාමර 1 වෙනුවෙන් කල ටෙන්ඩර් තැන්පතු මුදල් ආපසු ගෙවීම

I. එම්. ඒ. සී. ලසන්ති මිය - රු.20000.00
II. කේ. කේ. ගාමිණී මහින්ද මයා - රු.20000.00
III. ඩී. පී. වික්ටර් ගුණතිලක මයා - රු.20000.00
IV. එම්. එම්. පියදාස මයා - රු. 5000.00
V. එන්. එච්. කේ. ක්‍රිෂානි කල්පනා මිය - රු. 5000.00

15. 2018 වර්ෂයට සඳහා උඩුගම සදුදා සති පොළෙහි ටෙන්ඩර් තැන්පතු මුදල් ආපසු ගෙවීම
I. එච්. වී. අමරසිරි මයා - රු. 5000.00
II. කේ. බී. වසන්ත මයා - රු. 5000.00

16. 2018 වර්ෂයට සඳහා තල්ගස්වල බදාදා සති පොළෙහි ටෙන්ඩර් තැන්පතු මුදල් ආපසු ගෙවීම
I. කේ. බී. වසන්ත මයා - රු.15000.00
II. එච්. වී. අමරසිරි මයා - රු.15000.00

17. ඒ. පී. එස්. නදීශානි මිය, උඩුගම
උඩුගම බහුකාර්ය ගොඩනැගිල්ල වෙන් කිරීමට අදාල මුදල් ආපසු ගෙවීම - රු. 5000.00

18. දිනිල් ඩී. ලියනගේ මයා, ගාල්ල
පුස්තකාල සඳහා ගුරු සුවද කෘති 03 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 750.00

19. පී. එල්. රංජන් මයා, ගාල්ල
පුස්තකාලයාධිපති සහ තාක්ෂණ නිලධාරින් සදහා නිල මුද්‍රා සකස් කිරීමේ බිල්පත - රු. 3000.00

20. රෙජිස්ටර් ජනරාල්, රෙජිස්ටර් ජනරාල් දෙපාර්තමේන්තුව
2015 වර්ෂයේ ජනවාරි- ජුනි දක්වා මුද්දර ගාස්තු සකස් කිරීම වෙනුවෙන්
කාර්ය මණ්ඩල දීමනා ගෙවීම - රු. 30900.00

21. දයානි පුද් සමාගම, මාපලගම
ළිං ඉසීම සදහා මිළදී ගත් උපකරණ බිල්පත පියවීම - රු. 940.00

22. අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස්, පිටිගල
වීථි පහන් සදහා CFL බල්බ් මිළදී ගැනීමේ බිල්පත - රු.44000.00

23. බ්‍රවුන්ස් ඇන්ඩ් කම්පැනි පී. එල්. සී.
Sharp AR 5316 ඡායා පිටපත් යන්ත්‍රයේ වාර්ෂික සේවා කිරීමේ ගිවිසුමේ
වාර්ෂික ගාස්තු ගෙවීම - රු. 16422.00

24. දේවපියසිරි මයා, රත්ගම
උඩුගම මහජන ක්‍රීඩාංගනය වෙන්කිරීමට අදාල තැන්පත් මුදල් ආපසු ගෙවීම් - රු. 3000.00

25. කෙත්සිරි කමියුනිකේශන්, තල්ගස්වල
ප්‍රධාන කාර්යාලය සදහා ලෙටර් හෙඩ් පොත් මුද්‍රණය කර ගැනීම වෙනුවෙන්
බිල්පත් පියවීම - රු. 51250.00

- **ඉහත මුදල් කමිටු වාර්තාව සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම ගෙවීම් සභා සම්මත විය.**

## 9.3 යෝජනා හා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

| යෝජනා ඉදිරිපත් කල පාර්ශවය | අංශය | මුදල රු. |
|---|---|---|
| | | |

| | | |
|---|---|---|
| නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා | ඉඹුල් කොටු කන්ද පාර කොන්ක්‍රීට් කිරීම හා සංවර්ධනය | රු. 2000000.00 |
| යූ. පී. ඩී. ආරියතිලක මැතිතුමා | උඩුගම අලුත්වත්ත පැණිගලයාය පාර 500m<br>උඩුගම අලුත්වත්ත 18 කන්ද මාර්ගය 500m<br>උඩුගම දකුණ සුදුවැලිපත කැකිල්ලකන්ද මාර්ගය 500m | රු. 2000000.00<br>රු. 2000000.00<br>රු. 2000000.00 |
| ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | අන්නාසිගලහේන සිට ඇල්ලවත්තවිල මාවත කුරුපනාව දක්වා මාර්ගය | රු. 4500000.00 |
| ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ඌරල නෑහිනිගල මාර්ගය කාණු කපා සංවර්ධනය | රු. 25000.00 |
| ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ඌරල, නෑහිනිගල මාර්ගය සංවර්ධනය කිරීම | රු. 800000.00 |
| ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ප්‍රධාන කාර්යාලයේ සභාපතිතුමාගේ නිල කාමරය සහ පුස්තකාලය අලුත්වැඩියා කිරීම | රු. 850000.00 |
| ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | අමුන්දර ගෝණාදෙනිය මාර්ගය සංවර්ධනය කිරීම් | රු. 2000000.00 |
| ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | යටලමත්ත - බරවමුල්ල, මාමණාදොළ- නාකියාදෙනිය මාර්ගය | රු. 5000000.00 |
| ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | තල්ගස්වල- කුඹුරුහේන කොළඹ කඩේ මාර්ගය | රු. 5000000.00 |
| ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | නාගොඩ - ගම්මැද්දේගොඩ පඤ්ඤාලෝක මාවත සංවර්ධනය | රු. 5000000.00 |
| ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | කැප්පිටියාගොඩ පඹේදෙනිය මාර්ගය | රු. 1000000.00 |
| ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | උඩුගම අලුත්වත්ත කොරගමලේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම | රු. 25000.00 |

**ඉදිරිපත් කරන ලද සියළුම යෝජනා හා ඇස්තමේන්තු සඳහා සභාවේ එකගතාව පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**කර්මාන්ත කමිටුව**

නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී ප.ව. 3.00 ට කර්මාන්ත කමිටුව පවත්වන ලද අතර එහි වාර්තාව ඉදිරිපත් කරන ලදී.

**කර්මාන්ත කමිටු වාර්තාව ඇමුණුම් 1 ලෙස සභා වාර්තාව සමග අමුණා ඇත.**

**කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කරන ලද සියළුම යෝජනා සඳහා සභාවේ එකගතාව පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

මෙහිදී උඩුගම උප කාර්යාලය සම්බන්ධව පසුගිය සභාවේදී සම්මත වූ යෝජනාව කර්මාන්ත කමිටුවට ඇතුලත්ව නැති බවත්, ඊට හේතු දක්වන ලෙසත්, ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා තම අදහස් ප්‍රකාශ කර සිටියේය.

මේ වසර ගණනාවටම අප ප්‍රදේශවල කිසිදු සංවර්ධනයක් සිදු වී නොමැති බවත්, දැනට ඉදිරිපත් කරන යෝජනාද උඩුගම ප්‍රදේශයේ යෝජනා බැවන් මේ වන විටත් නාගොඩ ප්‍රදේශයේ කිසිදු සංවර්ධනයක් දක්නට නොවීම කණගාටුවට කරුණක් වන බව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය ප්‍රකාශ කරන ලදී. ගරු නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමන් වලකුඹුර නාගොඩවත්ත මාර්ගයට රු. ලක්ෂ 20 ක ප්‍රතිපාදන එවා තිබුන බවට දැන් වූ අතර ඒ පිළිබඳව දැනුවත් කරන ලෙසද ඉල්ලා සිටියාය.

මෙහිදී එම යෝජනාවන් සභා මන්ත්‍රීවරු කරන යෝජනා නොවන අතර ගරු නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමන් විසින් අමාත්‍යාංශය මගින් නම් කර එවන ලද යෝජනා වන බවත් ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා ප්‍රකාශ කරන ලදී. එතුමන්ගේ යෝජනා ලැයිස්තුව මෙලෙස එවන අතර එය වෙනස් කිරීමට අවශ්‍ය නම් නිශාන්ත ඇමතිතුමන්ටම ප්‍රකාශ කළ යුතු බව අජිත් මහතා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාවලට මුදල් ලැබී නොමැති බවත්, මේවා තවමත් යෝජනා මට්ටමේම පවතින බවත්, ඇස්තමේන්තු සාදා යැවූ පසු අනුමත වුව හොත් පමණක් සිදු වන බවත් යන එහි වර්තමාන තත්වය පිළිබඳව අජිත් මහතා ප්‍රකාශ කරන ලදී. කිලෝමීටර් 1000 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ගරු නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මහතා විසින් එතුමන්ගේ යෝජනා ලෙස එම යෝජනා ඉදිරිපත් කර ඇති අතර එම ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් වූ පසු සභාපතිතුමන් විසින්ද පාරවල් සංවර්ධනය සම්බන්ධව යෝජනා 03 ක් ලබා දුන් අතර ප්‍රාදේශීය සභා මට්ටමින් දැනුවත් වන ප්‍රමාණය මත එලෙස යෝජනා ඉදිරිපත් කරන බවදගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී. මේ යෝජනා ප්‍රාදේශීය සභා මට්ටමින් නොඉල්ලන අතර ඒ ප්‍රදේශයේ සිටින අමාත්‍යවරුන් ඔවුන්ගේ මට්ටමින් යෝජනා ඉදිරපත් කරන බවද එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී සාකච්ඡා වී ඇති සියළු යෝජනා උඩුගම ප්‍රදේශයේ යෝජනා වන අතර අනිත් ප්‍රදේශවලට බෙදී ගොස් නොමති බව ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම ප්‍රතිපාදන නිශාන්ත මුතුහෙට්ටිගම ඇමතිතුමන්ගේ ප්‍රතිපාදන නොවන අතර අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වන බැවින් එතුමන්ගේ සම්බන්ධතාවය මත එම යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාව

එතුමන් ලබා ගෙන පසුව ගරු ඇමතිතුමන් විසින් ප්‍රාදේශීය සභාවෙන් අදාළ යෝජනා ඉල්ලුම් කර එම යෝජනා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන බව මේ අනුව පෙනී යන බවත්, ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා ප්‍රකාශ කරන ලදී. ඒ අනුව අනිකුත් කොට්ඨාශවල පවතින යෝජනාවන් මන්ත්‍රීවරුන්ගෙන් අරගෙන පළාත් පාලන ඇමතිතුමන්ට එම යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස මෙහිදී ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. අප ප්‍රදේශයේ පවතින ඉතාම අබලන් පාරවල් සම්බන්ධව මීට කලින් අප යෝජනා ඉදිරිපත් කල අතර එයින් එක් පාරක්වත් මෙම යෝජනාවලට ඇතුළත් කිරීමට අවස්ථාව ලබා දීම ඉතාම වැදගත් බවද එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. අපි සභාපතිතුමන්ට ඒ බව දැනුම් දෙන බවත්, යෝජනා ඉටු වුවත්, නොවුනත් සභාපතිතුමන් හරහා එම යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස එතුමා වැඩිදුරටත් සඳහන් කළේය.

එලෙස යෝජනා ඉදිරිපත් කිරීමේ හැකියාව වජිර අබේවර්ධන මැතිතුමාටත්, බන්දුලලාල් බණ්ඩාරිගොඩ මැතිතුමාටත් පවතින අතර එවැනි ඕනෑම මන්ත්‍රී කෙනෙකුට යෝජනා ඉදිරිපත් කර පළාත් පාලන අමාත්‍යාංශයට යැවිය හැකි බවත්, ඒවා යෝජනා ඉදිරිපත් කිරීමක් පමණක් වන බවත්, ගරු මන්ත්‍රී අජිත් එඩ්රිආරච්චි මහතා නැවතත් අදහස් ප්‍රකාශ කරන ලදී. අනෙකුත් ප්‍රදේශවල පවතින යෝජනාද ඒ අදාළ ප්‍රදේශයේ මන්ත්‍රීවරුන් වෙත යවා පළාත් පාලන අමාත්‍යාංශයට යොමු කිරීමට කටයුතු කරන ලෙසද එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

කිලෝමීටර් 1000 සම්බන්ධ ව්‍යාපෘතිය පිළිබඳව පළාත් පාලන අමාත්‍යාංශය මගින් සභාව දැනුවත් කර නොමැති අතර අපට සෘජුවම වගකියන අමාත්‍යාංශයක් ලෙස පළාත් පාලන අමාත්‍යාංශය අපව ඒ සම්බන්ධව දැනුවත් කර නොමැති වීමත්, වෙනත් අය ඒ සඳහා යෝජනා ඉදිරිපත් කිරීමත්, ඉතා කණගාටුදායක තත්වයක් බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා වැඩිදුරටත් තම අදහස් ප්‍රකාශ කරන ලදී. නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමන් උඩුගම ප්‍රදේශයේ යෝජනා පමණක් ලබා දීම නොව නාගොඩ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමකු ලෙස එතුමන්ට නාගොඩ ප්‍රදේශය දියුණු කිරීම සම්බන්ධව යුතුකමක් පවතින බවත්, ඒ පිළිබඳව කර්මාන්ත කමිටුවේදීත් සඳහන් කල බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

පෙරදීත් එම තත්වය පැවති තවත් මීට පෙර ගරු ලක්රුවන් මන්ත්‍රීතුමන් සිටි කාලයේදී එලෙසම සිදු වූ බවත් ගරු මන්ත්‍රී බන්දුල හිරිමුතුගොඩ මහතා ප්‍රකාශ කරන ලදී.

පළාත් පාලන අමාත්‍යාංශයේ මුදල් ඇමතිවරුන් නම යොදා අරගෙන ඇමතිතුමන් නමින් සිදු කරන බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

මේ කාරණා සම්බන්ධව කලබල විය යුතු නොවන අතර එම යෝජනා සියල්ල ප්‍රාදේශීය සභාව හරහා ඇස්තමේන්තු සකස් කර යැවීමත් මෙහිදී සිදුවන බවද ඒ සම්බන්ධව ඇස්තමේන්තු විශාල ප්‍රමාණයක් අප යොදා සාදා ගන්නා බැවින් තාක්ෂණික නිලධාරී කාලය හා ශ්‍රමය ඒ සඳහා යොදන

බැවින් අපේ සභාවේ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන යෝජනා සම්බන්ධ ඇස්තමේන්තු සකස් කර ගැනීම හා යැවීමට තාක්ෂණික නිලධාරීන් යොදවා ගැනීම අපහසු වන බවත්, ක්‍රියාත්මක නොවන ඇස්තමේන්තු සකස් කිරීමට යොදා ගත හැකි බවත් ක්‍රියාත්මක නොවන සමහර යෝජනා සදහා සභාවේ වාහන, තෙල්, ශ්‍රමය කැපවන ප්‍රමාණය පිළිබදව ගරු මන්ත්‍රී අජිත් එඩිරආරච්චි මහතා තම අදහස් ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා ඒ කරුණට තම එකගතාවය පළ කල අතර එම ඇස්තමේන්තු සැකසීමට ගතවන කාලය, ශ්‍රමය අපතේ යන බවත් එය අනවශ්‍ය කටයුත්තක් ලෙසද ප්‍රකාශ කරන ලදී. ඇමතිවරුන් තම ලේසිය හා පහසුව අනුව කටයුතු කරන බවද ඒ සදහා අප ශ්‍රමය කැපවන බවද එතුමන් ප්‍රකාශ කරන ලදී.

මේ සියළු කටයුතුල බලධාරියා ප්‍රාදේශිය සභාව වන බැවින් සියළුම ඇස්තමේන්තු ප්‍රාදේශීය සභාව හරහා යා යුතු නිසා මැති ඇමතිවරුන් එම යෝජනා සදහා ඇස්තමේන්තු ප්‍රාදේශීය සභවෙන් අනුමත වීම අවශ්‍ය නිසා සියළු යෝජනා ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීම මෙයට හේතුවන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

සියළුම මන්ත්‍රීවරුන්ගේ යෝජනා 5 බැගින් ගෙන ඒ සදහා ඇස්තමේන්තු සකස් කර වෙනම තබාගෙන අවශ්‍ය අවස්ථාවන්හිදී, යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලද සැනින්ම එම යෝජනා හා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට හැකි ලෙස කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. ඒ තුළින් කාලය ඉතිරිවනවා මෙන්ම ඉල්ලන අවස්ථාවේදීම ඉදිරිපත් කිරීමේ හැකියාව පවතින බවද ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා ප්‍රකාශ කරන ලදී. ප්‍රාදේශිය සභාවට අයිති පාරවල්වල වැඩකටයුතු බොහොමයක් සිදු කෙරෙන්නේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා වන බැවින් රේබීය අමාත්‍යාංශය යටතේ මුදල් එවීම සිදුවන්නේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට වන බැවින් මේවායේ පාලනය අප යටතට ගැනීමට කටයුතු කිරීම වැදගත් බව එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

උඩුගම වෙළද සංකීර්ණය සම්බන්ධ යෝජනාව සභාවේ අනුමත වූ බැවින් එය කර්මාන්ත කමිටුව මගින් අනුමත වීමක් අවශ්‍ය නැති බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

පසුගිය සභා වාරයේදී උඩුගම පොළ සම්බන්ධව කතා කල අවස්ථාවේදී පොළ විවෘත කල බවට තරංග සුදර්ශන මහතා ප්‍රකාශ කල අතර පසුගියදා තමන් ගිය අවස්ථාවේදී මේ වන විටත් පොළේ ජනතාව එම වැසිකිළිය භාවිතා කිරීමට නොහැකිව සිටින බව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ප්‍රකාශ කර සිටියේය. අවුරුදු 15 ක් තිස්සේ තම ශරීර අවශ්‍යතා සපුරා ගැනීමට ඔවුන් භාවිතා කරන්නේ පොළ පිටුපස පවතින උඩුගම දොළ බවද එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. ඒ පිළිබදව සොයා බලා අප සතු සම්පත් භුක්ති විදීමේ අවස්ථාව එම පොළ භාවිතා කරන වෙළෙන්දන්ට ලබා දීමට කටයුතු කරන ලෙස ගරු වෙරංග ලක්මාල් මන්ත්‍රීතුමන් ප්‍රකාශ කර

සිටියේය. පොළ දිනය පිරිසිදු පොළ දිනයක් කිරීමට කැපවෙන ලෙස ගරු සභාපතිතුමන්ගෙන් ඉල්ලීමක්ද සිදු කරන ලදී.

පෙරදී අඩුගම පොළ ජනතාවට භාර දුන් බවත් එම පොළ භූමිය භාවිතා කිරීමට අකමැති බවත්, එහි පවතින වැසිකිලිය ඔවුන්ට භාවිතා කිරීමට හැකි බවත් ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ප්‍රකාශ කර සිටියේය. පුරනැගුම පොළ සාදන ආකාරය පිළිබදව ඒ දිනවල විවිධ විවේචන ඉදිරිපත් කල අතර පුරනැගුම අධ්‍යක්ෂතුමන්ද ඒ අවස්ථාවට ගෙන්වූ බවද එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී පොළේ පවතින වැසිකිලිය ටෙන්ඩර් කර බාරදීමට කටයුතු කරන ලෙසත් ඒ පිළිබද විධිමත් වැඩපිළිවෙලක් යොදන ලෙසත් ගරු උප සභාපතිතුමන් තම අදහස් ප්‍රකාශ කරන ලදී.

පොලේ පවතින යතුර භාර දීමට වැඩපිළිවෙලක් ඇති කරන ලෙස ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාද ප්‍රකාශ කර සිටියේය.

එම පොළ වෙනුවෙන් වියදම් දරා සාදන ලද පොළ භූමිය වෙත එම වෙළදුන් යැවීමට කටයුතු කරන ලෙසත්, එම ගොඩනැගිල්ල භාවිතා නොකර තැබීම මහත් අපරාධයක් බවත් ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මියද තම අදහස් ප්‍රකාශ කරන ලදී.

පොළ ඉදිකලේ ගරු මහින්ද රාජපක්ෂ මැතිදුන්ගේ කාලයේ වන අතර දැන් පොළ විවෘත කිරීමට උත්සව අවශ්‍ය නොවන බවත්, පිරිසිදුව පොළ පැවැත්වීමට සුදුසු පරිසරයක් එම ස්ථානයේ නිර්මාණය කිරීමත්, යතුරු භාරදීමට ක්‍රමවත් වැපිළිවෙලක් සැකසීමත් පිළිබදව කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා නැවතත් ප්‍රකාශ කලේය.

ඒ සියළු කරුණු පිළිබදව දැනුවත් වූ බවත්, ඒ පිළිබද ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත්, ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

**9.4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

කාර්යාලීය අල්මාරිය මිළ ගණන්

| විස්තරය | දම්රෝ ප්‍රදර්ශනාගාරය, උඩුගම | හසාරෝ එන්ටර්ප්‍රයිසස්, ගාල්ල | සිංහගිරි ෆර්නිචර් උඩුගම |
|---|---|---|---|
| කාර්යාලීය අල්මාරිය (වීදුරු රහිත) | රු 19057.50 | රු. 18500.00 | රු 15750.00 |
| කාර්යාලීය අල්මාරිය (වීදුරු සහිත) | රු. 29677.50 | රු. 25500.00 | රු. 20900.00 |

අල්මරිය මිළදී ගැනීම සම්බන්ධව අල්මාරියේ වර්ගය, හා ප්‍රමාණය ඇතුලත් කර නැවත මිළ ගනන් ඉදිරිපත් කර ඊළග සභාවට යොමු කිරීමට තීරණය කරන ලදී.

**10. ලැබීම් හා ගෙවීම් වාර්තා**

**මාසික ආදායම් විස්තරයක් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී.**

**මාසික ආදායම - නාගොඩ ප්‍රාදේශීය සභාව**

| **ස්වයං උත්පාදිත ආදායම** | **දළ ඇස්තමේන්තුව** |
|---|---|
| | රු ශත |
| අක්කර බදු | 5,000.00 |
| පොළ බදු | 112,500.00 |
| අයදුම්පත්‍ර ගාස්තුව | 15,000.00 |
| වතුර බවුසරය කුලියට දීම | 5,000.00 |
| ව්‍යාපාර බලපත්‍ර ගාස්තු | 37,500.00 |
| කඩකුලී | 37,650.00 |
| අලෙවි ප්‍රවර්ධන ගාස්තු | 10,000.00 |
| පරිසර බලපත්‍ර ගාස්තු | 12,500.00 |
| කොම්පෝස්ට් විකුණුම් | 5,000.00 |
| බහුකාර්ය ගොඩනැගිල්ල කුලියට දීම | 10,000.00 |
| පොළ දඩ | 10,000.00 |
| පුස්තකාල දඩ | 2,000.00 |
| | **262,150.00** |

**මාසික වියදම - නාගොඩ ප්‍රාදේශීය සභාව**

| | **දළ ඇස්තමේන්තුව** |
|---|---|
| | රු ශත |
| සේවක මාසික වැටුප් (වැටුප් ප්‍රතිපූර්ණ හැර) | 160,000.00 |
| දෛනික වැටුප් | 125,000.00 |
| අතිකාල හා නිවාඩු දින දීමනා | 45,000.00 |
| ගමන් වියදම | 30,000.00 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ | 75,000.00 |
| ඉන්ධන | 100,000.00 |
| වාහන අළුත්වැඩියාව හා සේවා කිරීම | 75,000.00 |

| | |
|---|---|
| ඉන්ධන දීමනා (මන්ත්‍රීවරුන් සඳහා) | 81,000.00 |
| පෙර ගෙවුම් කාඩ්පත් (මන්ත්‍රීවරුන් සඳහා) | 28,500.00 |
| පුවත්පත් සඳහා | 18,000.00 |
| විදුලි බිල්පත් | 15,000.00 |
| තැපැල් ගාස්තු | 10,000.00 |
| | **762,500.00** |

රුපියල් ලක්ෂ 5 ක පමණ ඌණතාවයක් පවතින බැවින් සෑම කටයුත්තක්ම සිදු කල යුත්තේ ඒ පිළිබඳ සළකා බැලීමෙන් අනතුරුව බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

පසුගිය දිනක ෆේස් බුක් පිටුවේ මාපලගම ක්‍රීඩාංගණය තුළට කුණු දමන ඡායාරූපයක් ඇතුළත් කර තිබූ බවත් පසුව සොයා බැලීමේදී අපේ කුණු ඉවත් කරන සේවක මහතා විසින්ම එසේ සිදු කරන බවත් ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී. ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතාද දැනුවත් වූ බව ප්‍රකාශ කරන ලදී. ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතාද දැනුවත් වූ බව ප්‍රකාශ කරන ලදී. මාපලගම වැසිකිලිය වසා දමා ඇති බවත්, එය විවෘත කර බැලූ බවත්, ඒ අවස්ථාවේදී ජනතාව විවිධ අදහස් ප්‍රකාශ කල බවත්, එම අවස්ථාවට ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතාත් සම්බන්ධ වූ බවත් ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටියේය.

එම මාපලගම වැසිකිලිය පිරිසිදු කිරීම සඳහා පෙරදී ද්‍රවිඩ කම්කරුවන් සිටි අතර පසුව ඔහු අසනීප තත්වය මත ඉවත් වූ බවත්, සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී. මෙහිදී එම වැසිකිලිය ඉදිරි දොර වසා දොර පිටුපසින් සවි කර ප්‍රතිසංස්කරණය කර ද්‍රවිඩ කම්කරු ඒ සඳහා යෙදවීමට යෝජනාවක් පවතින බවද එම අවස්ථාවේ බන්දුල හිරිමුතුගොඩ මන්ත්‍රීතුමාත් සිටි බව සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී වැසිකිලියේ දොර පිටුපසට දැමීම සුදුසු ක්‍රියාවක් නොවන බවත්, කම්කරුවෙක් යොදා තාවකාලිකව එය භාවිතා කිරීම සුදුසු බවත්, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ප්‍රකාශ කරන ලදී. කම්කරුවෙක් යොදනවානම් එය භාවිතා කරන අය රු. 10.00ක් හෝ 20.00 ක් ගෙවා එය භාවිතා කරන අතර මුදල් දුන්නොත් ඔහු විසින් එය පිරිසිදු කරන බවත්, එතුමන් ප්‍රකාශ කර සිටියේය. යතුර තියාගෙන කිහිපදෙනෙකු එය භාවිතා කලත් මිනිසුන් ඒ මගින් විශාල අපහසුතාවයකට පත් වන බවද එතුමන් ප්‍රකාශ කරන ලදී. අලුත් වැසිකිළිය ඉදිකරන තෙක් පරණ වැසිකිලිය ප්‍රතිසංස්කරණය කර තාවකාලිකව කම්කරුවෙක් යොදවා ඔහුට දීමනාවක් ලබා දීමට ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා යෝජනා කරන ලදී.

එම වැසිකිලිය පොදු වැසිකිලියක් නොවන බවත් එම ස්ථානයෙන් වෙනත් ස්ථානයකට වැසිකිළිය ඉදිකිරීම සුදුසු යැයි ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය මගින් ඉඩමක් තෝරා ගෙන වැසිකිලියක් ඉදිකිරීමට ලක්ෂ 35 ක් අනුමත වී ඇති අතර ඒ ඉක්මණින් එය අනුමත කරවා දෙන ලෙස ඉල්ලුම් කල බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී. එම කටයුත්ත සිදුවන බවද එතුමා ප්‍රකාශ කර සිටියේය.

පෙරදී එම ස්ථානයේ පැවති සන්රි හෝටලය ඉවත් කිරීමට සිදු වූයේ එම වැසිකිලිය භාවිතා කිරීම නිසා මැස්සන් හා දුගද හැමීමේ හේතුව නිසා බව ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතාද තම අදහස් ප්‍රකාශ කරන ලදී. රාත්‍රි කාලයට වැසිකිලි භාවිතා කරන්නන් එය විධිමත් ලෙස භාවිතා නොකිරීමෙන් මාපලගම වෙළද සංකීර්ණයට හා එහි ගැවසෙන පාරිභෝගිකයන් මහත් අසීරුතාවයකට පත් වන බවද එතුමන් ප්‍රකාශ කර සිටියේය. මෙහිදී තාවකාලිකව ඉදිරිපස දොර වසා පිටුපසින් දොරක් විවෘත කර එය භාවිතා කිරීමට ඉඩ දී වෙළද සංකීර්ණය බදු දෙන විට අනිවාර්යයෙන්ම එයට වැසිකිලි කැසිකිලි පහසුකම් ලබා දීමේ පදනම මත වෙළද සංකීර්ණය සඳහා වැසිකිලියක් අලුතින් සාදන ලෙසද එතුමන් තම අදහස් ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතාද වැසිකිලියේ ඉදිරිපස දොර වසා පිටුපස දොරක් සාදන ලෙසත් පෙරදී එම වැසිකිලියෙන් වහනය වූ දුගන්ධය හේතුවෙන් විනෝදා පොත්හලේ දරුවන් දෙදෙනකු අසනීප වූ අතර ලේකම්තුමිය ඒ ළමුන් බැලීමට ගිය බවත්, මේ තත්වය දැන් නොවිසදුනොත් වර්තමානයේදීවත් එවැනිම තත්වයක් ඇති විය හැකි බව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා වැඩිදුරටත් ඒ සම්බන්ධව ප්‍රකාශ කරන ලදී.

මෙම වැසිකිලිය සඳහා වෙනමම කම්කරුවෙක් යොදා වැසිකිලිය පිරිසිදු කිරීම වෙනුවට දැනට කසල ඉවත් කිරීමටකොන්ත්‍රාත් පදනම මත සිටින කම්කරුවාට මසකට රු.17000.00 ක වැටුපක් ගෙවන නිසා ඔහුම එම වැසිකිලි පිරිසිදු කිරීමේ කාර්යයට යෙදවීම සුදුසු බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී. ඔහුට දිනකට දැනට පැවරෙන්නේ බස්නැවතුම්පල පිරිසිදු කිරීමත්, උප කාර්යාලය අවට පිරිසිදු කිරීමත් නිසා වැසිකිලි පිරිසිදු කිරීමේ කාර්යයන් ඔහුට පැවරිය හැකි බව එතුමා ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී බන්දුල හිරිමුතුගොඩ මහතා ප්‍රකාශ කල පරිදි බස් 50 ක පමණ සෙනග  දිනකට එම වැසිකිලි භාවිතා කරන බවද සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

වැසිකිලි පිරිසිදු කිරීම අමාරු කාර්යයක් බැවින් එතනට යන අප විසින් යම් මුදලක් ලබා දෙනවා නම් එම මුදල ඔහුටම ගැනීමට හැකියාව පවතින බව ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා ප්‍රකාශ කරන ලදී. මෙහි නීත්‍යානුකූල තත්වයක් නැති වුවත් එලෙස රු. 10.00 ක් ලබා ගත්තාට ගැටළුවක් නොමැති බව එතුමා ප්‍රකාශ කරන ලදී. වැසිකිලියේ කම්කරුවන් යෙදීම සම්බන්ධව මන්ත්‍රීවරුන් තම අදහස් ප්‍රකාශ කරන ලද අතර කම්කරුවන් දෙදෙනකු යොදා එම කාර්යයන් සඳහා වෙන වෙනම වැටුප් ගෙවීම සුදුසු නොවන බවත්, එම කාර්යයන් දෙකම එකම කම්කරුවෙක් යොදා සිදු

කර ඔහුට ඊට වඩා වැඩි වටුපක් ගෙවිය හැකි බවට ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මතා ප්‍රකාශ කරන ලදී.

මාපලගම උප කාර්යාලයට මේ වන තුරුත් ජලය ලබා දීමට කටයුතු කර නොමැති බවත්, නළ ළිදක් ගැසීමට කර්මාන්ත කමිටුවේදීවත් සාකච්ඡා කල බවත්, එම ස්ථානයේ මළකඩ වතුර එන බවට ප්‍රකාශ කරන බවත් මාපලගම බස් නැවතුම්පොලේ පවතින මෝටරයෙන් වතුර ලබ ාදිය හැකි වුවත්, එම මෝටරය ආරක්ෂා කර ගත නොහැකිව සභාවට ගලවා ගෙන ඇවිත් ඇති නිසා නැවත එම මෝටරය සවිකර වැසිකිලිය සදහා යොදන කම්කරුවාටම එම මෝටරය පවරා දීමට කටයුතු කර උප කාර්යාලය වෙත ජලය ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ප්‍රකාශ කරන ලදී.

මෝටරය එම ස්ථානයේ සවි කිරීමට ගරු සභාපතිතුමන් තීරණය කරන ලදී.

මුලින් අනුමත වූ රු. 500.00 ක වැටුප රු. 800.00 දක්වා වැඩි කිරීමටමුලින් අනුමත වූ බැවින් එලෙස වැඩිකර දනට සිටින කම්කරු අරනෝලිස් යන අයට එම කාර්යයන් දෙකම භාර දෙන ලෙසත් ඔහු එයට අකමැති වුවහොත් මුලින් සදහන් කල ද්‍රවිඩ කම්කරු වෙත එය ලබා දෙන ලෙස ගරු උප සභාපති තුමන් ප්‍රකාශ කරන ලදී.

අලුතින් වැසිකිලිය සාදන තෙක් පවතින වැසිකිලිය ප්‍රතිසංස්කරණය කර භාවිතයට සුදුසු ලෙස සාදා තාවකාලිකව පරිහරණය කිරීම සදහා ලබා දීමටත් එය පිරිසිදු කිරීමට දැනට සිටින කම්කරු මහතා යෙදවීමටත ඔහු ඊට අකමැතිනම් ද්‍රවිඩ කම්කරු යෙදවීමටත් සභාව අවසාන වශයෙන් තීරණය කරන ලදී.

### 11. වෙනත් කරුණු :-

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම මෙම සභාවට යෝජනා ඉදිරිපත් කල අතර පළමුවන යෝජනාව වන ලෙහුවල ප්‍රජා ශාලාව නඩත්තු කිරීම හා පවරා ගැනීම සම්බන්ධව කතා කරන්න කැමතියි. මා එය පරික්ෂා කල අතර මත්ද්‍රව්‍ය, බියර් හිස් කැන්, අරක්කු බෝතල්, ගිණිකූරු සහ ඊයම් කොළත් ඊට අමතරව මත් පෙති භාවිතා කල ආකාරයත් අපිට එම පරික්ෂාවේදී දැක ගත හැකි වුණා. ලෙහුවල බෝධිය හා පාසල අවට පිහිටා ඇති මෙම ප්‍රජා ශාලාව ඉතා අපවිත්‍ර තත්වයේ පවතින අතර මෙය පවරාගෙන නඩත්තු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. එහි ග්‍රාම නිලධාරීතුමන්,සමෘද්ධි නිලධාරීතුමන් හා සංවර්ධන නිලධාරීතුමන් කාර්යාල පවත්වා ගෙන බවත් අමතර කාමරයක ටෙන්ට් බඩු, පුටු ආදාය දමා ඇති බවත්, මෙය සභාවට පවරා ගත හොත් එයින් අමතර ආදායමක්ද ලබා ගත හැකි බව අතර රු. 39000.00 ක පමණ විදුලි බිලක්ද ගෙවීමට ඇති බැවින් එය ගෙවා හෝ මෙම ශාලාව පවරා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

බුද්පනාගම සමනල පෙර පාසලෙහි පුංචි ළමුන්ට වන්දනා කිරීමට බුදු මැදුරක් නොමැති බැවින් එම භූමියෙන් පර්චස් 2 ක් පමණ පවරා ගෙන බුදු මැදුරක් සකස් කර දෙන මෙන් මා මේ සභාවට යෝජනා කරනවා.

උනන්විටිය සති පොළ අද දින පැවැත්වෙන අතර හෙට දින සිට කුණු ගෙන යන ට්‍රැක්ටර් රථය උනන්විටිය පොළේ කුණු අරගෙන යන ගමන් උනන්විටිය යටලමත්ත සිට කටඹුරාව හරහා ඒ පැත්තෙන් පැමිණෙන ලෙස මම යෝජනා කරනවා. එයට හේතුව ලෙහුවල නිවාස යෝජනා ක්‍රමය යටතේ කුණු දැමීමට ස්ථානයක් නොමැති වීමයි. ඔවුන් කැලෑවලට කුණු දමා තිබෙන අතර ඒ පිළිබඳව ජනතාවද දැනුවත් කලා. එහෙයින් ඔවුන්ගේ කුණු ලබා ගැනීමට කටයුතු කරන ලෙස මම යෝජනා කරනවා.

පෙර කාලවලදී අපගේ පවුල්වලට හොඳ ආදායමක් ලබා දුන් උක් වගාව ගම්මැද්දේගොඩ, කැප්පිටියගොඩ ආදී ප්‍රදේශවල විශාල වශයෙන් දක්නට ලැබුණා. නමුත් දැන් ගග දෙපස ඉඩම්වල තේ වගා කරලා , ගංවතුර ගලනවා, කණ්ඩිය කැඩෙනවා. නිතර පොහොර යොදනවා. නමුත් උක් වගාවට එසේ නිතර පොහොර යෙදිය යුතු නොවන නිසා උක් වගාව ජනතාව අතරට ගෙන ගියොත් අපට විශාල ආදායමක් ඒ තුළින් ලබා ගන්න පුළුවන්. අපේ කැප්පිටියාගොඩ ප්‍රදේශයේ ජීවත් වන අයෙක් දැනටමත් මොණරාගල සිට උක්පැණි ගෙනවිත් මැලිබන් ආයතනයට විකුණා විශාල ආදායමක් ලබා ගන්නා අතර ඒ දවස්වල සමූපකාරවල උක්පැණි, උක්හකුරු දක්නට ලැබුනා. එය ප්‍රචලිත් කලොත් අපට හොඳ ආදායමක් ලබා ගත හැකි බව ප්‍රකාශ කරමින් මම නිහඩ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. විලේගේ මැතිතුමන්ගේ පුතණුවන්ගේ මළගෙදර පළමුවෙන්ම දැන්වීම සම්බන්ධයෙන් මම ප්‍රථමයෙන් ගරු උපසභාපතිතුමන්ට ස්තූතිවන්ත වෙනවා. එම මළගෙදර වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණේ බලවත් ශෝකය මම මේ අවස්ථාවේදී පුද කර සිටිනවා.

මගේ පළමුවන යෝජනාව වන කුඹුරුහේන මාර්ගයේ දෙපස කාණු පද්ධතිය ස්ථාපිත කිරීම ඒ වගේම කුඹුරුහේන කොළඹ කඩේට යන මාර්ගය අවට වීථි ලාම්පු සවි කිරීම ගරු සභාපතිතුමන් එම යෝජනා දෙක සම්බන්ධව සවන් යොමු කරන්න ඇතැයි කියා සිතනවා.

ඒ වගේම පසුගිය සභාවාරයේදී කතා කල ආකාරයට ඉක්මණින් යටවන ග්‍රාම සේවා වසම් දෙක, තුනක් පවතින අතර එම ගම්වලට සවිබල බෝට්ටු නැති වුවත් නිකම් බෝට්ටු හෝ ලබා දෙනවා නම් හොඳයි කියලා මා හිතනවා.

පසුගියදා ඔබතුමන් විසින් නිරීක්ෂණය කල දියවර ගම්මානයේ වතුර රදා පවතින ස්ථානයේ ඉඩම් හතර පහක ප්‍රමාණයක් ගොඩ කර ගෙන තිබෙන අතර එම ස්ථානයේ කාණු පද්ධතිය නිසි පරිදි සාදා දුන්නොත් ගංවතුර උවදුරින් ඒ මාර්ගය අවහිර වීම වැළකෙනවා. පසුගියදා පාසල් ළමයෙක් එම ස්ථානයෙන් වැටිලා බොහෝම අමාරුවෙන් ජීවිතය බේරා ගත්තා. එම ස්ථානය අඩි 03 ක පමණ ජලයෙන් පිරී යනවා. ඒ නිසා නිසි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

අපගේ පුස්තකාලය හා ආයුර්වේදයේ ජල ප්‍රශ්නයක් පවතින අතර බීමටවත් ජලය ලබා ගත නොහැකි වෙනවා. මෝටරය සෑදීමට ගෙන ගොස් බොහෝ කල් වන අතර එය තවමත් සවි කර නැහැ. එය විශාල අඩුපාඩුවක් වෙනවා. ඒ වගේම ආයුර්වේදයේ වෛද්‍ය නලාව කර්ටන් මේවා කිසිත් නැහැ. රෝගියෙක් පරීක්ෂා කිරීම ඉතාම අපහසු වෙන බව වෛද්‍යතුමිය මා සමග ප්‍රකාශ කළා. අපි පුස්තකාල ගොඩනැගිල්ලේ අඩුපාඩු සම්බන්ධ යෝජනා ඉදිරිපත් කලේ පළමු සභා වාරයේදී නමුත් මේ වන විටත් ඒවාට විසදුම් ලැබිලා නැහැ. ඒ ගැන මම කණගාටු වෙනවා.

ගම්මැද්දේගොඩ, ගෝණලගොඩ ප්‍රදේශයේ පවතින මත්ද්‍රව්‍ය මහා පරිමාණයෙන් ප්‍රචලිත වෙලා තියෙනවා. පසුගිය දිනෙක නිවසකට පැන රු. 10000.00 ක් මංකොල්ලකාලා තිබෙන අතර එවැනි තත්වයක් දක්වා මෙය වර්ධනය වෙලා තියෙනවා. මේ සම්බන්ධව පොලිස් ස්ථානාධිපතිතුමන් වෙත දන්වන්න කටයුතු කරන්න.

පුස්තකාලයේ පෙර පැවති ජංගම රථය සම්බන්ධව දැනුවත් කරන අතර එම ජංගම රථය අපට ඉක්මනින් ලබා දී එම සේවාව ඉටු කරන ලෙස අපි යෝජනා කරනවා.

තල්ගස්වල නගරයේ ඇති පොදු වැසිකිලියේ එක් ජල කරාමයක් පමණක් පවතින අතර, පොළේ බල්බ 03 ක් පමණක් පවතිනවා. අපි බදු ලබා ගන්නවා. නමුත් ඒ මිනසුන්ට කිසිදු පහසුකමක් නැහැ. ඒ වගේම තල්ගස්වල ෂෙඩ් එක අසල කුණු එකතු නොකරන බවට අපට චෝදනා කලා. ඒ වගේම චන්ද්‍රා මල් ශාලාව ළග සිට යන කාණු පද්ධතියෙන් දුගදක් හමන අතර ඒ අසල කඩවලටද එය හානියක් වන බව ප්‍රකාශ කලා.

කුඹුරුහේන මාර්ගයේ යම් කාණු පද්ධති අපි ශ්‍රමදාන මට්ටමින් කර ගෙන යනවා. අපි කිව්වට ඒවා කෙරෙන්නෙ නැහැ. ඇත්තටම කණගාටුයි. එම පාර කරත්ත පාරක් වගෙයි. පාසල් ළමුන් 75 ක් 100 ක් පමණ ප්‍රමාණයක් එම මාර්ගයේ ගමන් කරනවා. ඇත්තටම එම මාර්ගයේ පයින්වත් යන්න බැහැ. ඒ තරම්ම අබලන්. සෝරත මාවතේ සිට එන පාලම ද අබලන් වී ඇති අතර පාසල් බස් රථයක්වත් එතනින් යන්න බැහැ. ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතාත් දන්නවා. එම මාර්ගය ඉතා ඉක්මණින් ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

අපි වීථි ලාම්පු ක්‍රමවේදය පිළිබද දැනුවත් වෙන්න කැමතියි. අපි මේ වගේ කණුවෙන් කණුවට ලයිට් දානවට කැමතියි. සමහර තැන්වල කණුවෙන් කණුව ලයිට් දාලා තියෙනවා. වළකුඹුර නිවසක් හතර වටේ වීථි ලාම්පු 4 ම දමා ඇති බවට ආරංචි වුණා. එසේ නොකර අපේ පැත්තට ඉන් එක වීථි ලාම්පුවක්වත් සවි කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඔබතුමා පත්වෙනකොටම කිව්වා එක හැන්දෙන් බෙදනවා කියලා අපි ඒ විදිය දකින්න කැමතියි. ඒ කරුණු ඉදිරිපත් කරමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම සහභාගි වූ සභා වාර තුන අතරින් සභා වාර දෙකකදී මා විසින් ලබා ගත් මන්ත්‍රී දීමනාව මා අධයාපනය ලැබූ උඩුගම මහා විද්‍යාලයේ A සාමාර්ථ 9 ක් ලබා ගත් ළමුන් තිදෙනකු වෙනුවෙන් පරිත්‍යාග බල අතර එය මම මහත් අභිමානයෙන් යුතුව ප්‍රකාශ කරනවා. ඒ තුළින් මේ සභාවටත් ගරුත්වයක් ලැබෙයි කියා මා විශ්වාස කරනවා.

මම ගිය සභාවේදී උඩුගම කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය පිළිබදව සදහන් කළා. පසුගිය දිනවල මම එම ස්ථානයේ ස්ථානීය පරීක්ෂණයට ගිය විට එම ස්ථානයේ පොහොර කිලෝ 1000 ක් තිබුණා. පැකට් 150 ක් ක් තිබුණා. ඒ පැකට් ඔක්කොම බල්ලො කඩලා දාලා. ඒ පිළිබද විමසීමේදී ඒ පොහොර ගෙනියන්න වාහනයක් නොමැති බව ප්‍රකාශ කළා. මෙතරම් සභාවේ වාහන තිබියදී රියදුරන් සිටියදී අඩුම තරමින් ඒ පොහොර ටික උප කාර්යාලයටවත් ගෙනිහින් විකිණීමට තිබුණා. පෙහොරවලට සෑහෙන ඉල්ලුමක් තියෙනවා. එම පොහොර සම්බන්ධව මාසයේ මුල සතියේ හා අවසාන සතියේ වෙනමම වැඩපිළිවෙලක් සකස් කර ඒ සදහා වාහනයක් ලබා දී මිනිසුන් දැනුවත් කර පොහොර විකිණීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

කසල බදුන් ස්ථාපිත කිරීම පිළිබඳව මම යෝජනා කළා. එක්තරා ප්‍රාදේශීය සභාවක මෙය ක්‍රියාත්මක කර තිබුණා. අපට යුනිලිවර් ආයතනයේ වෙනමම ප්‍රචාරක වැඩසටහනක් තියෙනවා. ඔබතුමාත් එය ලබා ගැනීමට ඉල්ලීමක් කරන්න. ඩෙටෝල් සමාගමෙත් එය පවතිනවා. ඔවුන් බකට් 3 ක් ඩෙටෝල් ස්ටිකර් අලවලා වෙළඳපොලේ තබා තියෙනවා. ඒ තුලින් වෙළඳ ප්‍රචාරණයක් ලබා දෙනවා. අපිට එම බකට්වලට පිරෙන කසල ටික එකතු කර ගැනීමේ වගකීම පමණක් පැවාරනවා. එවැනි වැඩපිළිවෙලවල් සඳහා ඔබතුමන්ගේ අවධානය යොමු වෙයි කියලා මම විශ්වාස කරනවා.

පොල් ඉඩම පවරා ගැනීමට කටයුතු කිරීම පිළිබඳවත් මම මගේ ස්තූතිය පුද කර සිටිනවා. එය අපේ ප්‍රාදේශීය සභාවට වඩා ඵලදායි ක්‍රියාවලියක් වෙනවා.

උඩුගම බාර්හංදියේ මඩවලේ වතුර පිරීම සම්බන්ධව යෝජනාව ස්ථානීය පරීක්ෂාවට ලක් කළා. එහිදී මුදල් නැහැ වගේ වචන තමයි තාක්ෂණ නිලධාරීන්ගෙන් අහන්න ලැබුනේ. එම ස්ථානයේ පවතින දැඩි අවධානම ඉවත් කර දෙන මෙන් මම නැවතත් ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා.

කුරුන්ද දවුල්හේන මාර්ගය සම්බන්ධව මම මෙවරත් යෝජනා ඉදිරිපත් කළා. මේ මාර්ගයේ ලයිට් කණුවක් තියෙනවා. ඒක තියෙන්නෙ පාර මැද ඒ පිළිබඳව තරංග සුදර්ශන මන්ත්‍රීතුමන් ඇතුළු උඩුගම ප්‍රදේශයේ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් ඇති. එහි දැඩි අවධානමක් පවතිනවා. මේ සම්බන්ධව විදුලි අධිකාරිතුමන් පෞද්ගලිකව මා සමග සාකච්ඡා කළා. මිනිස්සුන්ට මළ ගෙදරකට, මගුල් ගෙදරකට, විනෝද ගමනකට යාමට බස් රථයක් දවුල්හේන මාර්ගයෙන් යන්න බැහැ. මෙම මාර්ගය අයිති අපට  අපේ පවතින නීති රීති භාවිතා කරමින් විදුලි අධිකාරිතුමන් සමග මැදිහත් වී එම අඩුසැර විදුලි කණුව ඉවත් කර මාර්ගය ආරක්ෂිත මාර්ගයක් කිරීමට ඔබතුමන්ගේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

උඩුගම පොළ විවෘත කිරීමක් අවශ්‍ය නොවන අතර පොළේ ජනතාවට වැදගත් ලෙස බඩු අරගෙන තෙමෙන්නේ නැතුව මඩේ ලගින්නේ නැතුව අදාළ කාර්යයන් කර ගැනීමට හැකි ලෙස පවතින සම්පත් උපයෝගී කර ගැනීමට අවස්ථාව සළසා දෙන්න. පොළ දිනය පිරිසිදු පොළ දිනයක් බවට පත් කරන්න.

උඩුගම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 03 ක් නියෝජනය කරනවා. උඩුගම පවතින්නේ එකම එක සුසාන භූමියක් වන අතර එය පවතින්නේ කුරුන්ද ප්‍රදේශයේ. එයත් මිනිස්සු අල්ලගෙන තේ හිටවලා තියෙනවා. පසුගියදා උපුල් මහතාගේ මවගේ මරණය තැන්පත් කලේ ප්‍රජා ශාලාව ඉදිරිපිට බොහෝ සුළු ප්‍රදේශයයි මේ සඳහා පවතින්නේ. අද බොහෝ ගෙවල්වල පර්චස් 10, 20 වැනි සුළු ඉඩම්වල මිනිය වළලන්න තැනක් නැහැ. අපගේ දැක්ම මෙහෙවර තුල ගැබ්වෙලා තියෙන්නේ මිනිසුන්ට සේවය කිරීම නම්, අඩුම තරමින් ඔවුන්ව මිහිදන් කිරීමටවත් ස්ථානයක් ලබා දිය යුතුයි. මිනිසුන් මළ පසු මිහිදන් කිරීමට  ස්ථානයක් වෙන් කර දීමේ යුතුමක් ප්‍රාදේශීය සභාවට තියෙනවා. ඒ නිසා හැමෝටම භාවිතා කිරීමට හැකි ලෙස ඇප්තොප්වත්ත තුළ සුසාන භූමියක් ඉදි කරන ලෙස මම යෝජනා කරනවා.

මෙවර කුරුන්ද ප්‍රදේශය ආවරණය වන පරිදි මම නියෝජනය කරන උදාර සමාජ සත්කාරක පදනම මගින් දින 03 ක කාලයක් පොසොන් කලාපයක් පැවැත්වීමට සංවිධානය කර ඇති අතර එම දැවැන්ත වැඩපිළිවෙල සඳහා සහභාගි වන මෙන් මම ගරු සභාපතිතුමාට ඇතුළු ඔබ සැමට ඉතාම ගෞරවයෙන් ආරාධනා කරනවා. ඔබ සියළු දෙනාටම සුභ දවසක් පතමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර  මහත්මිය :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම යෝජනා ලෙස ඉදිරිපත් කල අප ප්‍රදේශයේ පවතින ඉතාම අබලන් තත්වයේ මාර්ගයන් එම ජනතාවට ගමන් කල හැකි වන ලෙස සකස් කර දෙන මෙන් ඉල්ලා සිටිනවා. කැප්පිටියාගොඩ ප්‍රදේශයේ ගංගාමිටියාවත ප්‍රදේශයේ අපි

පදිංචිව සිටිනවා. පානීය ජලය සම්බන්ධව විශාල ප්‍රශ්නයක් උද්ගත වී තියෙනවා. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. ඒ වගේම වළකුඹුරේ ප්‍රධාන නාන ළිඳ ලග වල් බිහි වී එම ස්ථානයට ලං විය නොහැකි තත්වයට පත් වෙලා තියෙනවා. ඒ පිළිබඳත් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. සභාවෙන් නැවත එය ප්‍රතිසංස්කරණය කර අපගේ සම්පත් ගොඩනගා ගැනීම සඳහා ඉඩකඩ සළසා දෙන මෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම කැප්පිටියාගොඩ ගිංගග ට බැසීමට ඇති පාරම්පරික තොටුපලවල් වල වල් බිහි වෙලා තියෙනවා. එම තොටුපලවල් තිබුණ තැනක්වත් සොයා ගැනීමට නොහැකි වෙලා තියෙනවා. ඔබතුමාගේ අවධානය යොමු කර එම තොටුපලවල් නැවත ජනතා අයිතියට පත් කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා. අපේ මන්ත්‍රීවරුන් දන්නවා ඇති ගාලු ප්‍රදේශයේ සිට එන විටත් මාපලගම ප්‍රදේශයේ සිට යන විටත් සැන්ඩ්‍රෝ කඩේ කියනන අතුරු මාර්ගයකින් පාරට වාහන දාන විට එම ස්ථානයේ දැඩි අවධානම් තත්වයක් පවතිනවා. එතන විශාල වංගුවක් සහිත ස්ථානයක් තමයි තිබෙන්නේ. එම අවධානම් තත්වය නැති කිරීමට ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. අපේ ප්‍රදේශයේ මාර්ග පද්ධතිය පිළිබඳ මම නිතරම මතක් කරනවා. පාරවල් එකකවත් යා නොහැකි තත්වයක තමයි තියෙන්නෙ වැඩිපුරම ඇත්තේ මැටි පාරවල් අධික වර්ෂාව නිසා මෙම පාරවල් වල යෑමට නොහැකි වෙලා තියෙනවා. පසුගිය දිනක මම ශ්‍රමදානයක් මගින් එම මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සිදු කළා. දින ගණනාවක් තිස්සේ ඉල්ලීම් කල පාරවල් මේ වන විට එකක්වත් ඉටු වෙලා නැහැ. ඒ නිසා ඔබතුමාගෙන් මේ සඳහා පිළිතුරක් ලැබේ යැයි සිතනවා. ඔබ සැමට සුභ දවසක් ප්‍රාර්ථනය කරමින් මම නිහඩ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය කතා කරමින් :-**

ගරු සභාපතිතුමා ඇතු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මගේ පළමු යොජනාව උඩුගම මහජන පොළ ජනතා අයිතියට පැවරීම වන අතර පොළ විවෘත කිරීමක් එයින් නොකියවෙන අතර පොළ ජනතාවට භාවිතා කිරීමට හැකි ලෙස පැවැත්වීම එයින් අදහස් කරන බවත්, සභාව ඒ පිළිබඳව වැරදි අවබෝධයක් ලබා නොගන්නා ලෙසත් ප්‍රකාශ කරනවා. වර්ෂා කාලයට පොලට යාමට නොහැකි ලෙස වතුර පිරෙනවා. සභාපතිතුමනි ඔබතුමන් වැසි කාලයට උඩුගම පොළට ගිහින් බලන්න. පොළ සඳහා හොඳ ගොඩනැගිල්ලක් සකස් කර තිබුනත් අපේ වෙළෙන්දන් මඩ ගොඩේ සිට බඩු විකුණනවා. අපිත් ඒ පොළෙන් බඩු මිළදී ගන්නවා අපටත් ඒවායින් විෂබීජ යන්න පුළුවන්. ඒ වගේම නව ගොඩනැගිල්ල ඉදිරිපිට වාහන නවතා තියෙන නිසා වෙළඳුන් ඒ පැත්තේ බඩු දාන්න කැමති නැහැ. එම වාහන වෙන තැනක නවත්තන්න හදලා යන්න ඉඩ තියලා දෙපැත්තක කඩ පේලි ගහලා රෙදි සෙල්ලම් බඩු ඒ වෙලදුන්ට දීලා එළවළු හා අනිත් භාණ්ඩ අප සකස් කල ගොඩනැගිල්ලට දාන්න පුළුවන්. මම මේ පිළිබඳව ලේකම්තුමිය සමග සාකච්ඡා කල අවස්ථාවේදී එම වෙළඳුන් අලුත් ගොඩනැගිල්ලට යන්න අකමැති බව ප්‍රකාශ කරන බව එතුමිය පැවසුවාය. සභාපතිතුමනි ඔවුන් කියන දෙයට අපි හිස නැමිය යුතු නැහැ. පොළ අපේ අපි දැන ගත යුතුයි. ඒ මිනිසුන්ට අවශ්‍ය තැන අපි දෙන්න මේ පිළිබඳව අධීක්ෂණය කරලා ඒ සම්බන්ධ විධිමත් වැඩපිළිවෙලකක් හදන්න කියලා මම යෝජනා කරනවා.

උඩුගම පොළේ ලක්ෂ ගණනක වතුර බිලක් ගෙවීමට ඇති බවත් වැසිකිළි පහසුකම් නොමැති බවත් වෙළෙන්දන් පැවසූවා. එම ලක්ෂ ගණනක වතුර බිලක් ගෙවීමට තියෙනවද කියලා දැනගන්න මම කැමතියි. එහෙම ප්‍රශ්නයක් තියෙනවානම් අපට පුළුවන් ඊට විකල්පයක් ලෙස ළිදක් කපලා මෝටරයක් දාලා පොළට වතුර ලබා දෙන්න.

උඩුගම පොළ ටෙන්ඩරය භාර ගෙන කර ගෙන යන පුද්ගලයා ලේකම්තුමියට අභියොගයක් කළා. පුළුවන් නම් මාස 2 ක් පොළ කරලා පෙන්නන්න කියලා. එතුමන් අපිට අභියෝග කරනකල් ඉදීම සුදුසු නැහැ. එතුමන් අපිට අභියෝග කරන්නේ අපේ සභාවේ නිසි නායකත්වයක් පෙන්නුම් නොකරන නිසා. ඒ නිසා පොළ සම්බන්ධ ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ඉදිරිපත් කල

යෝජනාවට මමත් එකගතාවය පළ කරනවා. ඒ නිසා පොළ පිළිබඳ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ඔබතුමාට නාගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පවත්වා ගෙන යන හෝටල් ආපනශාලා හා පාසල්වල ආපනශාලා පිළිබඳව විධිමත් සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීමට යෝජනා කරනවා.

ඒ සඳහා නිර්දේශ ලෙස බල ප්‍රදේශයේ පවතින හෝටල් ආපනශාලා සුරක්ෂිත භාවයෙන් තොරව කරගෙන යන අතර එම නිශ්පාදිත ආහාරවල ගුණාත්මක භාවය අඩුයි. ඒ වගේම ආපනශාලා හොටෙල්වල මුළුතැන්ගෙයි පිරිසිදුකමක් නැහැ. නිශ්පාදිත ආහාර එනම් රෝල්ස් එළවළු රොටි වැනි ආහාර බැදීමේදී එකම තෙල් භාවිතා කිරීම නිසා ළමුන් විවිධ ලෙඩරෝග වලට මුහුණ දෙනවා. එයට විසදුමක් ලෙස සෑම සතියකට වරක් මහජන සෞඛ්‍ය පරික්ෂක වරුන්ගේ පරික්ෂනයට ලක් කරන්න කියලා මම යෝජනා කරනවා. මෙලෙස කම් කර ආපනශාලා හෝටල් ශ්‍රේණි ගත කිරීම පිළිබඳව මුළුතැන්ගෙයි පරික්ෂා කිරීම හා ආහාර සුරක්ෂිතභාවය පිළිබඳව ආපනශාලා හා හෝටල් හිමියන් දැනුවත් කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරික්ෂකතුමන්ට භාර දීම හොඳ ආහාර පවතින තැන් පිළිවෙලට නම් කර ඒ සඳහා A ශේණිය B ශ්‍රේණිය   ලෙස නම් කර ආපනාශාලා හා හෝටල් ශ්‍රේණිගත කිරීමට යෝජනා කරන අතර ඒ තුළින් ජනතාව A ශ්‍රේණියේ ආපනශාලා භාවිතා කිරීම නිසා අනිත් B ශේණියේ පවතින අයත් A ශ්‍රේණියේ වෙත ඉබේම ගමන් කිරීමට යොමු වෙනවා. මෙම යෝජනා මහජන සෞඛ්‍ය පරික්ෂක තුමන් වෙත භාර දී එය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනවා.

මම තෙවනුව අප ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ අපට හිමි චංචල හා නිශ්චල දේපළ සම්බන්ධයෙන් තක්සේරුවක් හා වර්තමාන තත්වය පිළිබඳ සියළුම සභිකයන් දැනුවත් කිරීමට මම යෝජනා කරනවා. උදාහරණයක් ලෙස අපට හිමි පවතින ඉඩමක යම් කෙනෙක් ගෙයක් හදනවා. නමුත් අපි දැනුවත් නැහැ. මේක සභාවේ  ඉඩමක්ද කියලා . අප සතු දේපළ අසළ මේක සභාව සතු දේපලක් ලෙස දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට මම යෝජනා කරනවා. එවිට එහි අයිතිය පිළිබඳව සභාව දැනුවත් වෙනවා. ඒක බාහිර බලපෑම්වලට ගොඩක් වටිනවා කියලා මම හිතනවා. ඒ නිසා එම ඉල්ලීම් ඉටු කරන ලෙස මම ගරු සභාපතිතුමාගෙන ඉල්ලා සිටියා. මුදල් ලබා ගෙන ඉටු කරන යෝජනාත් ඉටු කිරීමට අපහසු බැවින් සැමටම ක්‍රියාත්මක කල හැකි කාලෝචිත යෝජනා තමයි මම ඉදිරිපත් කරන්නේ.

මම ගිය වර ඉදිරිපත් කල යෝජනා වන උප කාර්යාලයේ අඹ ගස කැපීම වහල සෑදීම පුස්තකාලයට ඇතුළු වන පඩිපෙලට පොඩි ගේට්ටුවක් දැමීම පුස්තකාලය පාර්ටිෂන් කිරීම යන කිසිම යෝජනාවක් ගැන සැළකිලිමත් වෙලා නැහැ. අධික වර්ෂාව නිසා අඹ ගස කැපීම වැනි යෝජනා ඉටු නොවනවා කියලා හිතනවා. අපේ සාහිත්‍ය මාසය ඉදිරියට එන බැවින් පුස්තකාල වහල සෑදීම ඉතාම කාලොචිත දෙයක් ලෙස පෙන්වා දෙනවා.

ඒ වගේම උඩුගම මාර්ගයේ ඡායාරූප මම ඉදිරිපත් කරලා තියෙනවා. පාරේ පැච් දක්නට ලැබෙනවා. මේක අපට අයිති පාරක්. යූ.පී.ඩී. ආරියතිලක මහතා හරහා එම පැච් වැසීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙස මම යෝජනා කරනවා. මම ඡායාරූපවල ඉදිරිපත් කර ඇති ආකාරයට මේවා පොඩි පැච් සුළු වියදමකින් ඒවා වැසීමට පුළුවන්. ඒ වළවල් වැසීමට සභාව හරහා මධ්‍යම රජයට යෝජනා ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමා ඇතුළු සියළුම  මන්ත්‍රී මණ්ඩලයෙන් හා ලේකම්තුමියගෙන් අවසරයි. මම ගිය සභාවේදීත් වැඩිය කතා කලේ නැහැ. සභා වාර 3 ක කතා කරලා නොයෙකුත් ඉල්ලීම් ඉදිරිපත් කරලා තියෙනවා. අපි කණගාටුවෙනවා. බොහෝ ඉල්ලීම් කතාවට පමණක් සීමාවෙලා තියෙනවා.

අපි ගමට යනකොට ගමේ ජනතාවගේ පුංචිම බලාපොරොත්තුව තමයි ගමට වීථි පහනක්වත් සවි කර ගැනීම. මගේ කොට්ඨාශය තමයි විශාලම කොට්ඨාශය නමුත් අපි කිහිප විටක්ම ඉල්ලීම් කළා. උඩුගම ගාල්ල ප්‍රධාන මාර්ගය පිහිටලා තියෙන්නේ ඒ කොට්ඨාශයේ එකම වීථි පහනක්වත් සවි කිරීමට අපට කිසිදු සම්බන්ධතාවයක් ලබා දුන්නේ නැහැ. ඒ නිසා කතා කරාට වැඩක් නැහැ. පුංචි හෝ වැඩක් කෙරෙන වැඩපිළිවෙලක් තිබිය යුතුයි. අඩුම තරමින් අලුතින් දාන්න බැරි නම් දැනට අක්‍රීය වූ වීථි පහන් කිහිපයක් හරි අළුත්වැඩියා කර එම ප්‍රදේශයට දාලා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

අලුත්වත්ත කොට්ඨාශය ගත් විට මහා විශාල දුෂ්කර මාර්ග ප්‍රමාණයක් තියෙනවා. අපිට ක්‍රීඩාපිටි සකස් කිරීමට ගිය විට එහි අයිතිය පිළිබඳ ප්‍රශ්ණ පවතිනවා. මෙන්ම අලුත්වත්ත මාර්ගවලටද එහි අයිතිය පිළිබඳ ප්‍රශ්ණය බලපානවා. ඒ සඳහා වැඩ පිළිවෙලක් යොදන ලෙස ඉල්ලා සිටිනවා.

සභාව මගින් අවුරුදු ගණනාවක් තිස්සේ පවත්වා ගෙන යන උඩුගම රන් කැකුළු පෙර පාසට තවමත් විදුලිය නැහැ. උත්සවයක් ඇති වන අවස්ථාවේදී විදුලිය ගැනීමට සිදුව ඇත්තේ අසල්වාසි නිවසකින් මෙය හරිම ගැටළුවක්. මෙහිදී විදුලිය ලබා දීමට කවුරුහරි ඉදිරිපත් වුවත් සභාවට ඉඩම පවරාගෙන නොමැති නිසා විදුලිය ලබාදීමේදී එය ගැටළුවක් වෙලා තියෙනවා. නමුත් සභාවට පවරා ගෙන නැති වෙනත් ආයතනවලටත් විදුලිය ලබා දීලා තියෙනවා. විදුලිබල මණ්ඩලය සමග සාකච්ඡා කර හෝ මෙම පෙර පාසලට විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. දැනට මෙම පෙර පාසල පවරා ගැනීමේ ක්‍රමවේදයක් සභාව තුල ක්‍රියාත්මක වෙන අතර පවරා ගැනීමට තව මාස 4 හෝ 06 ක කාලයක් කොළඹ ගිහින් පවරා ගෙන ඒමට ගතවෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමිය සමග සාකච්ඡා කර හෝ අයිතිය පිළිබඳ පවතින ගැටළුව පසෙකලා විදුලිය ලබා ගැනීම පිලිබඳ සභාපතිතුමන් අවධානය යොමු කර කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගිය සභා වාරයේදී චෙරංග ලක්මාල් මන්ත්‍රීතුමා කල යෝජනාවට එකග වෙමින් මම කතා කළා. උඩුගම බංගම පාරේ බෝක්කුව පිළිබදව අපි ඒ සම්බන්ධව අදාළ නිලධාරින් ගෙන්වා ගෙන ඇස්තමේන්තු සකස් කර ගත්තා. එම ක්‍රියාවලිය ඉක්මණින් ඉටු කරලන්න කියලා මම ඉල්ලා සිටිනවා. එම ලිපිය දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරීතුමන් වෙත යොමු කරනු ඇතැයි විශ්වාස කරනවා. අප සතු වාහන ඉඩම් දේපල තියෙනවද කියලා පළමුවර සභාවාරයේ සිටම මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට කතා කළා. නමුත් ඒවාට කිසිදු වැඩපිළිවෙලක් නැහැ. අපිත් ඒ පිළිබඳ දැනුවත් වීම අවශ්‍යයි. වැනි දේපළ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ඒ පිළිබඳ සොයා බලා පවරා ගැනීමට දීර්ඝ කාලයක් යන නිසා එම දේපළ පවරා ගැනීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

උඩුගම දකුණ පෙර පාසල පිළිබඳව ලිපියකින් දැනුවත් කිරීම සිදු කළා. එම චක්‍රලේඛයට අනුව දින දීර්ඝ කිරීම් ලබා දීමට නොහැකියාවක් පවතින බව තමයි අපිට හැගී ගියේ. ඒ සම්බන්ධව විවිධ කතා ගම්වල විවේචනය වෙනවා. උඩුගම අලුත්වත්ත ප්‍රදේශයේ කලින් පෙර පාසලක් තිබිලා තියෙනවා. එය දැන් වහලා. අපි ඒ සම්බන්ධව දැනුවත් නැතුව එම අලුත්වත්ත පෙර පාසල සභාවෙන් ගුරුවරයෙකු යොදා නැවත ආරම්භ කිරීමට යන බවට කට කතා පැතිරෙනවා. එම පෙර පාසල් නැවත ආරම්භ කිරීමේදී ගම්වල සිටින පිරිස් සමග සාකච්ඡා කර එවැනි දේ ඉටු කිරීම යෝග්‍ය වෙනවා. නැවත එය අලුතින් ආරම්භ කලත් දැනට සභාවේ සිටින ගුරුවරුන්ට ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

දැනට සභාවේ සිලින්ඩර් එකක්වත් තියෙනවද කියලා අහන්න කැමතියි. එයට හේතුව අපේ ගම්වල වැසියන් අපෙන් සිලින්ඩර ඉල්ලනවා. සමහර ගම්වාසීන් වෙනත් මන්ත්‍රී කෙනෙකුගේ නම සඳහන් කරලියුමක් ලබා දීලා සිලින්ඩර 05 ක් ගන්න පුළුවන් කිව්වා. ඔබතුමාටත් ලිපියක් දීලා සිලින්ඩර 05 ක් ගන්න පුළුවන්ද කියලා අහනවා. දැනට නම් මා ඒ පිළිබඳ දැනුවත් නැහැ. එහෙම තිබුනොත් සිලින්ඩර දෙන්නම් යන කාරණය මම ඔවුන්ට පැහැදිලි කළා. සැබෑවටම සිලින්ඩර පවතිනවනම්

අපට ඒ අවශ්‍යතාවය ඉටු කිරීමට අවස්ථාව ලබාගැනීම පිනිස මම ඒ පිළිබඳ අපට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඉනෝකා විජේවර්ධන මහත්මිය කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. මුලින්ම මම අද දින එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායම් නායක ධූරය වෙනුවෙන් ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා පත් කර එවීම සම්බන්ධ සතුට ප්‍රකාශ කරන්න කැමතියි. ඒ වගේම එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම් සංවිධායක ධූරය වෙනුවෙන් ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා පත්වීම සම්බන්ධව මම මගේ සතුට ප්‍රකාශ කරන්න කැමතියි.

මගේ මුල්ම යෝජනාව කුණු සම්බන්ධ ප්‍රශ්නයක්. ප්‍රාදේශීය සභාවෙන් හෝ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් අපේ ගම්වලට ගොස් කුණු එකතු කර ගෙන එන බවට ප්‍රචාරණය වීමත් සමග සියළු දෙනාම කුණු වීදුරු සැමන් ටින් බෝතල් යන සියල්ලම ගෙනත් ගොඩ ගසා තිබෙන්නේ අපේ ගෙදර දොරකඩයි. දැනට යූරියා බෑග් 6ක් 7 ක් පමණ කුණු එතන පවතිනවා. ඒ බෑග් ටිකක් දැන් දිරලා ගිහින්. දැනටත් එම කසල අපේ නිවස අසල පවතිනවා. එය පසුගිය දිනක සිදු වූ ප්‍රචාරණයක් නෙවෙයි. කලින් සිදු කල ප්‍රචාරණයක්. එය ඉවත් කිරීමට කටයුතු කරන ලෙස මතක් කරනවා.

නාගොඩ අලුත් පාලමේ සිට එගොඩහට ගොස් උඩවැලිවිටියට හැරෙන මාර්ගයේ පසුගිය ගංවතුරට බෝක්කුවක් කැඩිලා තියෙනවා. 2017 ගංවතුරට යම් කිසි පුදගලයෙක් එතනින් යන්න ගිහින් බෝක්කුවෙන් වැටිලා මරණයටත් පත් වුණා. මෙවර ගංවතුරට ඒ බෝක්කුවේ දෙපසම කැඩිලා උඩවැලිවිටියට යන්න තියෙන මාර්ගය ඒක අඩි 4 ක් වත් පස් දමා ගොඩ කර තමයි එතනින් යන්න පුළුවන් වෙන්නෙ. ඒ පිළිබදවද අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

උඩවැලිවිටිය සිට කැප්පිටියගොඩට එගොඩ වෙන පාලම 2018 ගංවතුරෙදි අබලන් තත්වයට පත්වෙලා. අපි ලිපි යවලා ඊට පිළිතුරක් ලෙස ඇස්තමේන්තු සකස් කරලා වන ලෙසට ලිපියක් ලැබිලා ඇති. ඒ පිළිබදව ලේකම්තුමිය දැනුවත් ඇති. ලිපිය එවා ඇත්තේ 2017.12.07 දින ඒ අනුව එම ස්ථානයේ ස්ථානීය පරීක්ෂණයකට ලක් කර එම ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමට හැකියාවක් පවතිනවා නම් එය ඉතා කඩිනමින් පළාත් පාලන කොමසාරිස් වෙත වාර්තා කරන ලෙස ලිපිය මගින් දන්වා එවා තිබෙනවා. පාලම ඉතා අබලන් තත්වයේ පවතිනවා. පිළිබදවත් ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින අතර ලක්රුවන් සම්පත් මන්ත්‍රීතුමා විසින් උඩවැලිවිටය හොරංගල්ල මාර්ගය සාදන ලෙස යෝජනා කරලා තියෙනවා. ගිය වර තුල එම පාර සෑදීමට කොන්ත්‍රාත් මහතුන් ගිහින් තිබුණා. එම පාර කඩලා කොන්ක්‍රීට් කැබලි ගිහිහින් දමන්න ප්‍රවාහන කුලී ඇස්තමේන්තුවට ඇතුලත් කර නැත යන පදනම මත එම කොන්ත්‍රාත් එක නැවැත්තුවා. මේ වන විටත් ඒ පාර සෑදීම නවතලා තියෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව එම මුදල් තවම ඇති. ඉදිරියේදී එම පාර සෑදෙයි.

මම ගිය වර ඉදිරිපත් කල අලුත්පාලමේ සිට එගොඩහට යන මාර්ගය අඩි 2 ක් උස්සලා පාර සකස් කර දෙන්න කියලා ඉල්ලීමක් ඉදිරිපත් කළා. අඩි 03 ක් පස් පුරවා එම පාර සෑදීමට ඇස්තමේන්තු සකස් කරමින් පවතින බවට ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් දැන ගැනීමට ලැබුණා. ඒ පිළිබදව මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී එන්. වී. සමන් මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. පොලොන්නරු කඩේගාව ඇතුල්පාර ගෙවල් 30ක වගේ යන්න බැරි තත්වයට පත් වෙලා තියෙනවා. පස් දමා පුරවා සකස් කර බෝක්කු දැමීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

ඒ වගේම ගල්ලන්දල ඇළ ඉහළ මාර්ගය දැනට J.C.B. කරලා සකස් කර ඇති පාර බෝක්කු දමා සකස් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වගේම නෙළුඇළ මුකලාන පාරත් යන්න බැරි තත්වයට පත්වෙලා J.C.B. කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම 65 මාර්ගය අක්කරවත්ත මාර්ගය වැනි මාර්ගයක් J.C.B. කරන්න කියන යෝජනා ටික මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා. හෝමදොළ හංදියේ ත්‍රීරෝද රථ ගාල හිටපු ගරු මන්ත්‍රී රංජිත් හේවාවිතාන මහතා විසින් පොළ පවතින ප්‍රදේශයට ලබාදීමට ඉල්ලීම් කරලා තිබුණා. තරංග මන්ත්‍රීතුමන් මේ පිළිබඳ දන්නවා ඇති. ගරු සභාපතිතුමනි, අපි නවක මන්ත්‍රීවරු අපි යෝජනා ඉදිරිපත් කරද්දි ඒ පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලා සිටින ගමන්ම ඒ ත්‍රීරෝද රථ ගාල පොළ ප්‍රදේශයට ලබා ගැනීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ත්‍රිරෝද රථ ගාල පොළ ප්‍රදේශයට ලබා ගන්න පුළුවන් කියන කාරණාව රංජිත් හේවාවිතාන ගරු මන්ත්‍රීතුමත් එතුමාගේ කාලයේ සිට කරන යෝජනාවක්. ඒ පිළිබඳව ඔබතුමන්ගේ දැඩි අවධානය යොමු කරන ලෙස නැවත වරක් ඉල්ලනවා.

ඒ වගේම වනිගරත්න මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල ආකාරයට ප්‍රධාන පාරේ වීථි ලාම්පු ටික ඉතා ඉක්මණින් ලබා දීමට කටයුතු කරන්න කියලා මතක් කරනවා. තරංග සුදර්ශන මන්ත්‍රීතුමන් ඒ වීථි ලාම්පු පිළිබඳ දිගින් දිගටම කතා කළා. දැනට කැටගොඩ, බාර්හංදිය, හෝමදොළ හංදිය ප්‍රදේශයේ ඒ වගේම මාපලගම නාගොඩ කිසිම ප්‍රදේශයක ප්‍රධාන මාර්ගයේ වීථි පහන්ටිකවත් ක්‍රියාත්මක නොවන තත්වයට පත් වෙලා තියෙනවා. ඒ පිළිබඳවත් ඔබතුමන්ගේ දැඩි අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

අපගේ සහෝදර ධනංජය විලේගේ මන්ත්‍රීතුමන්ගේ ආදරණීය සහෝදරයා අප අතරින් වෙන්ව ගියා එතුමන්ට අප සියළු දෙනාගේ සංවේගයෙන් එතුමන් වෙනුවෙන් අප පුදකර සිටිනවා. සියළු දෙනාටම ස්තූතියි.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. පසුගිය දිනක ඇතිවූ සුළු ගංවතුර තත්වය නිසා සභාව සතු වතුර මෝටරය සභාපතිතුමාගේ හා ලේකම්තුමියගේ අවසරය මත මම මගේ කොට්ඨාශයට රැගෙන ගියා. ඒ වතුර මෝටරයේ වයර් කොඩ් එකක්වත්, ප්ලග් පොයින්ට් එකක්වත් නැහැ. නියනෙන් ඔබලා තමයි වයර් සම්බන්ධ කිරීම සිදු කලේ. ඒ මෝටරයේ පවතින අධි තාක්ෂණික තත්වය නිසා ඇම්පියර් 15 ප්ලග් පොයින්ට් එකක් නිවසකට තිබිය යුතුයි. නැත්නම් ටිප් ස්විච් එක ඕෆ් වෙනවා. එහි වයර් දිග මදි අතර මීටර් 100 වයර් කොඩ් එකක්වත් දාන්න කියලා මම කියනවා. මෙවැනි ප්‍රශ්න නිසා නිවාස කිහිපයකට මෝටරය ගෙන ගොස් ළිං ඉසීමට නොහැකිව මෝටරය නැවත අරගෙන ආවා.

තවද මාපලගම ත්‍රීරෝද රථ ගාල අසළ මඩ වළක් හැදෙන බැවින් එම ස්ථානයට පස් ටිකක් දමා ගොඩ කර දීම අවශ්‍ය වන අතර එය ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ඇත්තටම ප්‍රාදේශීය සභාවේ කලින් නියෝජිතයන් හිටියේ 13 යි. නමුත් දැන් 27 ක් දෙනෙක් නියෝජනය කරන නිසා දැන් ග්‍රාම සේවා වසම් 53 ක ම පවතින අඩුපාඩු එකින් එක සොයාගෙන සභාවට ඉදිරිපත් කරනවා. සභාපතිතුමන්ගේ ඔළුව දැන් කම්මලක් වගේ ඇති. මේ සියළු දේටම එතුමාට උත්තර දෙන්න වෙනවා. ඇත්තටම එම නිසා ගැටළු ඇතිවෙනවා. ප්‍රාදේශීය සභා පනත් තුල කටයුතු කරන ආකාරය පිළිබඳව සඳහන් වන අතර පෙර කාලවලදී ගම්වලදී පැවතුනු බොහෝ ගැටළු ගම්වැසියන් විසින් විසදා ගත්තා. සභාවේ ප්‍රශ්න ඉදිරිපත් කරන ආකාරය දුටුවම යටලමත්ත, උඟරල වගේ ගම්මාන ගත් විට උඩුගම පැත්තේ විශාල ප්‍රශ්න පවතින බව ප්‍රකාශ කරනවා. මේ කියන විදියට පවතින ගැටළු ඉතා කෙටියෙන් දක්වන නිසා යටලමත්ත හා උඟරල තමයි ප්‍රශ්න අඩුම වෙලා පවතින ලෙස පේන්නේ. අපේ වසම්වලට නියෝජිතයින් දෙන්නා තුන්දෙනා ඉන්න තැන් හා එක්කෙනෙක් ඉන්න තැන් පවතිනවා. ගමේ දෙන්නා තුන්දෙනා ඉන්න තැන්වල එකතුවෙලා සැළැස්මක් හදලා ඉදිරිපත් කලොත් කාල වේලාව ඉතුරු කරගන්න පුළුවන් කියලා මම හිතනවා. තුන්දෙනාගෙම යෝජනා එකට ඉදිරිපත් කල යුතුයි. එවිට ඉක්මණින් වැඩ කටයුතු ටික කර ගන්න පුළුවන්. පක්ෂ 3 කින් ඉන්න නිසා එසේ කිරීම අපහසු වෙයි. මෙතනට ආවට පස්සෙ අපි 27 දෙනාම එකහා සමානව සැළකිය යුතුයි. අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය සෞඛ්‍ය සම්බන්ධව කතා කළා. ඡායාරූප ගහගෙන ඇවිත් යෝජනා ඉදිරිපත් කළ. ඇත්තටම හොදයි. ඒ සඳහා සභාපතිතුමන් ක්‍රමවේද සකස් කර ඇතැයි විශ්වාස කරනවා. බල්ලෙක් මැරුනත්, කෑවත් බල්ලට කරන දෙය විමසා ප්‍රාදේශීය සභාවට දුරකතන ඇමතුම් ලබා දෙනවා. බල්ලා මැරුණත් සභාවට කියනවා. එවැනි කටයුතු සභාවෙන් ඉටු කල යුතු යැයි සෞඛ්‍ය ආයතන ප්‍රකාශ කරනවා. අපි යෝජනා නොකලත් යටලමත්ත හංදියෙන් යන මාමඩොල මාර්ගය, කිරිමැටිය පාර යෝජනාවලට එක් කිරීම සම්බන්ධව අපි ස්තුතිවන්ත වෙනවා. එම පාරවල් සඳහා විශාල මුදලක් වැය වෙනවා. ඒ පිළිබඳව අධීක්ෂණය කර එම යෝජනා ඉදිරිපත් කිරීම ගැන නැවත වරක් ස්තූතිවන්ත වෙනවා. සෑම දෙනාම තමාගේ ගැටළු ඉතා කෙටියෙන් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන අතර ඉදිරිපත් කරන තරමට ක්‍රියා කිරීම අපහසුයි. ඒ වගේම මම හැමදාම ප්‍රකාශ කල ආකාරයට වීථි පහන් අප ප්‍රදේශයට ලබා දෙන මෙන් ඉල්ලුම් කරමින් සැමට එකට වැඩ කිරීමට ධෛර්‍යය ලැබේවා යැයි පතමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා කතා කරමින් -:**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගිය මාසේ මගේ ශ්‍රමදාන කටයුත්තට සහභාගි වන ලෙස මම සියළු මන්ත්‍රීවරුන්ට ආරාධනා කළා. වර්ෂාව නිසා එය සිදු කිරීමට නොහැකි වුණා. නමුත් කිසිම මන්ත්‍රීවරයෙක් ඇහුවෙ නැහැ. ඉල්ලීමට අනුව අපි ආවා නමුත්

ශ්‍රමදාන කටයුත්ත කෙරුනෙ නැහැ කියලා. තරංග මන්ත්‍රීතුමන් පමණක් දුරකතනයෙන් කතා කරලා කරන දේ පිළිබඳ විමසුවා. සමන් මන්ත්‍රීතුමත් කතා කළා. ඒ හැර කිසිම මන්ත්‍රීවරයෙක් කතා කලේ නැහැ. ඒ බවත් සිහිපත් කරමින් මම ඉදිරිපත් කරන ලද සියළුම යෝජනා සභාව පිලිගත් යෝජනා හැටියට මා දකිනවා. කාල වේලාව මදි නිසා ඒ යෝජනා පිළිබඳ මම නැවත මතක් කරන්නේ නැහැ. සංවර්ධන ගම්මානයට යන මාර්ගයේ පසුගිය දිනෙක සභාපතිතුමන් උත්සවයකට සහභාගි වී පැමිණෙන අතර ඒ මාර්ගය බොහෝ අබලන්ව යා නොහැකි තත්වයක පවතින විට එතුමා යෝජනා කලා ඒ මාර්ගය පස් ටිකක් දමා සංවර්ධනය කරන්න කියලා. ඒ සම්බන්ධව ඔබතුමන්ගේ කාරුණික අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ යෝජනාව මගේ යෝජනාවලත් ඇතුළත් වෙනවා. ඇත්තටම එම මාර්ගය සංවර්ධනය කර දෙනවා නම් වටිනවා.

2012 වර්ෂයේදී 213 B ග්‍රාම නිලධාරි වසමේ ගොවි සංවිධානයේ සභාපතිවරයා හැටියට මම මගේ අවසන් යෝජනාව ඉදිරිපත් කළා. ප්‍රාදේශීය සභාවේ බෝක්කුවක් නිසා එහි නඩත්තු කටයුතු සිදු වුනේ පාලනය වුනේ ප්‍රාදේශීය සභාවෙන්. එම වගකීමෙන් අපට ගැලවිය නොහැකියි. ලේකම්තුමියගේ පාලන කාලය යටතේයි. එම බෝක්කුව පහත් කර දෙන මෙන් මම ඉල්ලීමක් ඉදිරිපත් කළා. හේතුව එම කුඹුරු දෙක වගා කර ගැනීමට හැකියාවක් නැහැ. එම ලිපියට පිළිතුරු තමයි මෙහි දක්වා තිබෙන්නේ. මේ බෝක්කුව නිසා ගෝණදෙනිය කරවිට යාය ඇත්තටම දැන් පුරන් කුඹුරක් බවට පත් වෙලා තියෙනවා. ඒ නිසා බෝක්කුව පහත් කර දෙන මෙන් ඉල්ලීම ඉදිරිපත් කළා. මෙම ලිපිය ප්‍රාදේශීය සභාවෙන් ගොවිජන සේවා සංවර්ධන නිලධාරීතුමන් වෙත යොමු කර ඇති අතර එය ඉටුකරන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථානයෙනුත් අවසර ලබා දී තියෙනවා. නමුත් අද වනතුරුත් එම කටයුත්ත ඉටු කරලා නැහැ. ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. කුඹුර වගා කරන්න හැකියාවක් නැහැ. ඒ නිසා ඒ ගැටළුව විසඳා දීම වැදගත් වෙනවා. මාර්ගයක් හදනවට වඩා කඹුරු වගාකරුවන්ට එය වගා කිරීමට හැකි නිසා අපේ ගමේ සංවර්ධනය උදෙසා එම ගැටළුව විසදීම එය ඉතා වැදගත් වෙනවා. කරවිට සංවර්ධන ගම්මානයේ බෝධියත් එක්ක මාර්ගයේ කොන්ක්‍රීට් නොකර ඉතිරි කල අඩි 10ක 15 ක කෑල්ලක් තමයි පවතින්නේ. ඒ ගැන අවධානය යොමු කරන්න.

ඊළගට මාපලගම උප කාර්යාලය ගැන ගිය සභා වාරෙයේදී බොහෝ කතා කළා. අපේ පක්ෂ තුනේම ප්‍රශ්නයක් වෙලා තියෙනවා. මාපලගම උප කාර්යාලයේ ඇති ප්‍රශ්න. අපි ඒ අඹ ගස කැපිය යුතුමයි. ඒ නිසා එය විසඳීමට යම් අපහසුතාවයක් පවතිනවා නම් එම කටයුත්ත අපට භාරදෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. එම ගහේ අතු වහලයේ වදින විට වහල කොපමන හැදුවත් වැඩක් නැහැ. කොපමණ කතාකරත් වැඩක් කෙරෙන්නෙ නැත්නම් වැඩක් නැහැ. වතුර ප්‍රශ්නය ගැන කතා කළා. එයට විසදුමක් නැහැ. ඒ මෝටරය අපට හරි ලබාදෙන්න මොකද අපේ මුදලින් හරි ඒක කරන්නම්. එම ස්ථානයේ වැඩ කරන්නේ අප හඳුනන නිලධාරීන් මේවා ඉටු නොකර අපිට එතනින් යන්න හැකියාවක් නැහැ. ඒ නිසා මීට අවධානය යොමු කර එම ගස කැපීමට අවශ්‍ය බලය අපට ලබා දෙන්න. පියල් මන්ත්‍රීතුමනුත් මමත් ඒ කාර්යය ඉටු කර දෙන්නම්.

මේ ශාලාව වායුසමීකරණය කිරීමට සියළු දෙනාම එකගත්වය පළ කළා. අපේ සැප පහසුවට එය හොඳ වුනත් මේ සඳහා තාක්ෂණික නිලධාරියෙක් යොදවා බලන්න. මෙහි තිර රෙදි පිටුපස වීදුරු දාලා තියෙන්නේ. එහෙම තියන්න බැහැ. සිවිලිමේ සිදුරු තියෙන්න බැහැ. මේ ගොඩනැගිල්ලත් කඩන තැනට යෝජනා ඉදිරිපත් වෙලා තියෙනවා. කලින් යෝජනා වුනා බිත්තිවලට විදුලි පංකා සවි කිරීමට ඒ සඳහා ලොකු වියදමක් යන්නේ නැහැ. එක විදුලි පංකාවක් රු. 2500.00 ක් පමණ තමයි වෙන්නේ. එය අඩු වියදමකින් කරගන්න පුළුවන් නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න. වායු සමීකරණය කිරීමට ඒකමතිකව ස්ථිර වෙලා තියෙනවා. මේක ඔබගේ අවධානය පිණිස මා විසන් ඉදිරිපත් කරන අදහසක් පමණයි.

පසුගිය දින කිහිපයක්ම ඉල්ලීම් කල පසු මට එක් දිනක් වීථි පහන් සවි කිරීමට විදුලි කාර්මික ශිල්පියා ලබා දුන්නා. මම ඉණිමග අල්ලන්න ගිහින් මට විදුළි සැර වැදුණා. එතුමා පවසන ආකාරයට එතුමා මෙහි පවතින අවධානම් තත්වය පිළිබඳ සභාව දැනුවත් කර තිබෙනවා. මම ඔහුට උදව්වක් කරන්න ගිහින් මට කරන්ට් එක වැදුනා. එතුමා ෆයිබර් ඉණිමගක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියා. ඊට කලින් ෆයිබර් ඉණිමගක් ඉල්ලා නැති බව ලේකම්තුමිය ප්‍රකාශ කළා. දැනට පවතින වර්ෂා කාලගුණය නිසා විදුලි සැර වැදීමේ අවධානමක් පවතිනවා. වීථි පහන් සෑදීම සම්බන්ධව මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් වැඩි නිසා ඔවුන් වර්ෂා අවස්ථාවලදිත් වීථි පහන් සවි කිරීමට යනවා. මෙම ෆයිබර් ඉනිමග ලබා දීම ආයතනයට වැදගත් වෙනවා. කාලයක් මෙය පාවිච්චි කිරීමට පුළුවන්.

අප කාලය වැය කර කතා කල යුත්තේ අපේ ප්‍රදේශයේ සංවර්ධනයට දායක වන කරුණු වන අතර පෙර වාර්තාවේ සඳහන් වෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ කිසිම දෙයක් වෙලා නැහැ. කියලා. වසර 17 ක් නිදාගත්තද කියලා අපට ප්‍රශ්නයක් වෙනවා. අපි දිගටම මේ පිළිබඳ කතා කරන විට කාල වේලාව යනවා. ඒ නිසා ඒ පිළිබඳව මීට පසුව කතා කරන්න එපා. යම් මන්ත්‍රීවරයෙකු කතා කරන විට යම් පක්ෂයකට පහරක් වන ආකාරයෙන් කතා කරන්න එපා. ඒ පිළිබඳව කතා කල මන්ත්‍රීවරයා තවම ගමට කරලා තියෙන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලයේ සැකසූ පාරක් පැච් දැමීම විතරයි. ඒ නිසා ඒ පිළිබඳව කතා කරන්න එපා. ඒ පිළිබඳව කතා කරන්න වීම ගැන සමාවෙන්න. පසුව මේ ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් කතා කරන්න කාලය වෙන් කරන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී එන්. වී. පතිනායක මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ඌරල කොට්ඨාශයේ මෑතකදී හමන ලද දැඩි සුළං තත්වය නිසා ඌරල උනන්විටිය මාර්ගයේ ඩොංගා ගස් තුනක් සහිත විශාළ පඳුරක් බිමට වැටිලා නැතිවුනත්, ඇල වී වෙනත් ගසකට හේත්තු වෙලා තියෙනවා. ඒ නිසා එම ගස දැන්ම ඉවත් නොකරොත් විශාල අනතුරකට පත් වෙනවා. සමහරු කියනවා. මෙය ඉවත් කිරීමේ අයිතිය සභාවට කියලා, ග්‍රාම නිලධාරී තවත් කෙනෙකුට අයිතිය කියනවා. ඒ සම්බන්ධව විවිධ ගැටළු

පවතිනවා. නමුත් ගමේ පවතින අවධානම් තත්වය කවුරුවත් ඉවත් කරන පාටක් නැහැ. ඒ සම්බන්ධව අවධානය යොමු කර ඉක්මනින් ඒ ගස ඉවත් කිරීමට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගාල්ල මාපලගම ප්‍රධාන මාර්ගයේ බෝවිටියමුල්ල සිට නාගොඩ දෙසට එන විට විශාල ජුලියන් ගසක් තියෙනවා. ඒක විශාල අනතුරක් පෙර දිනක මම මගේ දරුවා සමග පාසලට එන විට ජුලියන් ගෙඩියක් පාරට වැටුණා අනතුරක් වෙන්න කලින් එම ගස ඉවත් කර දෙන මෙන් ඉල්ලා සිටිනවා. නැතිනම් ගහේ අතුටික හරි ඉවත් කරල දෙන්න. බෝවිටියමුල්ල හංදියේ සිට අරාලකන්ද උඩ තියෙන පාර ආසන්නයේ එම ගස පිහිටා තියෙනවා. මෝටර් සයිකල්වලින් ගමන් කරනවා. යම් දෙයක් සිදු වූ පසු එයට පිලියම් යොදා පලක් නොවන අතර ඒ සඳහා දැඩි අවධානයක් ලබා දී කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

එම යෝජනා විශාල සංඛ්‍යාවක් සභාවට ඉදිරිපත් කරලා තියෙනවා. ඒවා ඇතුලත්ව තියෙන නිසා නැවත පැහැදිලි කිරීමක් කරන්නේ නැහැ. එම යෝජනා සියල්ලම ඉටු කර ගැනීමට අවශ්‍ය අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඩ වෙනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රිනී සුභාෂී ඒකනායක මෙනවිය කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. මුලින්ම මම ගරු මන්ත්‍රී ඉනෝකා මහත්මිය සඳහන් කල බෝක්කුව ගැන කතා කරන්න කැමතියි. මම ලක්රුවන් මන්ත්‍රීතුමා සමග එය නිරීක්ෂණය කිරීමට ගිය අවස්ථාවේ එතුමිය පවසන ආකාරයට ගංවතුරින් වන අවධානම අඩු කර ගැනීමට නම් එම පාර ගොඩ කළ යුතුයි. ඊට ප්‍රථමව බෝක්කුවට හානියක් වී නැති අතර බෝක්කුවේ පැති බැම් දෙක නැති නිසා උඩ කන්දෙන් එන වතුර පාරට පාර සෝදා ගෙන ඇලට ගොස් ඇති නිසා පාර කැඩී ඇති බවද මෙහිදී පාලමට කිසිදු හානියක් වී නොමැති බවද එතුමිය විසින් ප්‍රකාශ කල අතර එම පාලමේ ගැටි දෙක සකස් කර දෙන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. එම ස්ථානය කැඩී යාමේ අවධානම අපිට ඒ තුළින් වළක්වා ගන්න පුළුවන්. 26 වෙනිදාට යොදා ගෙන තිබූ පඤ්ඤාලෝක මාවතේ ශ්‍රමදානය දැඩි අයහපත් කාලගුන තත්වය නිසා මෙම මස 15 වන දිනට යොදා ගෙන ඇති අතර පසුගිය සභාවේදී සඳහන් කල ආකාරයට ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා ශ්‍රම දායකත්වය ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. ඒ වගේම පඤ්ඤාලෝක මාවතේ ගම්මැද්දේගොඩ උතුරු කොටසට පැති බැම්මකට අනුමත වූ මුදල් වගයක් ඒ ජනතාවගේ අකමැත්ත නිසා තාවකාලිකව එය ක්‍රියාත්මක නොවී පවතිනවා. සංවර්ධන නිලධාරීතුමිය පවසන ආකාරයට එම ස්ථානයේ පවතින කුඹුර මනින්න ලබා දෙනවා කියලා ඒ ජනතාවගෙන් ලිඛිතව ලිපියක් අවශ්‍ය බව එතුමිය විසින් ප්‍රකාශ කළා. ඒ අනුව ඊට අවධානය යොමු කර අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. අපේ හිටපු සභාපති හේමචන්ද්‍ර විලේගේ මැතිතුමාගේ පුත් සහ ධනංජය විලේගේ මන්ත්‍රීතුමාගේ සහෝදරයා වන කලන විලේගේ මහතාගේ අභාවය වෙනුවෙන් මම ශෝකය පළ කරනවා. යෝජනා ගොඩක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වුවත් අප මාස 3 ක් තිස්සේ යම් යම් අදහස් දැක්වූවා. සභාවට අවිත් කරුණු කාරනා කතා කරලා යනවා. නමුත් සභාපතිතුමන් හා අනිත් මන්ත්‍රීවරුන්ට එම යෝජනා ඉටු කර ගන්න වුවමනාව තිබුණත් සභා මට්ටමින් එය ඉටුකිරීමට හැකියාව තිබෙන්න නැතුව ඇති. අපි ලක්ෂ ගණනින් කොටි ගණනින් මෙතනට ඇවිත් කතා කරලා යනවා. නෙලී මන්ත්‍රීතුමිය ප්‍රකාශ කලා වගේ මන්ත්‍රීවරුන් 13 දෙනා 27 දෙනා බවට පත් වී ඇති අවස්ථාවේ තිබූ සංවර්ධනය අඩාල වෙලා තිබෙනවා. පසුගිය කොමසාරිස් පාලන කාලයේදී සිදු වුනු සංවර්ධනයක් වත් අද වෙනවද කියලා සැකයක් පවතිනවා. එහෙම දෙයක් අපට පේන්නෙ නැහැ. මුදල් කමිටුවට පැමිණි අවස්ථාවේ විවිධ වියදම් තිබෙනවා දැක්කත් රු. 145000.00 ක පමණ බල්බ් සවි කරලා තිබුණා. ඒවා කොහොමද සවි කරලා තියෙන්නේ. නමුත් අපේ එක යෝජනාවක්වත් ඉටු කරලා නැහැ. අඩුම තරමින් මම ප්‍රධාන පාරේ උඩුගම බස් නැවතුම්පොළ ගැන කතා කළා. ඒ ප්‍රදේශයේ ලයිට් සවි කර තිබුනත් එම බස් නැවතුම්පල ඉදිරිපිට තවම ලයිට් හයි කරලා නැහැ. ගාල්ල ඇරුණම පවතින දිගම හා ලොකුම බස් නැවතුම්පොළ තමයි මේ. ඒත් තවම ලයිට් හයි කරලා නැහැ. පක්ෂය නිසා නොව අපි කරන යෝජනා සළකා නොබලනවද කියලා අපිට පොඩි සැකයක් තියෙනවා. අපි ඉදිරිපත් කරන යෝජනා වැදගත් යැයි හැගෙනවනම් ඔබතුමාලා ඒකට ක්‍රියා කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. සභාපතිතුමන්ගේ හා ලේකම්තුමියගේ උපදෙස් පරිදි කටයුතු කරන ලෙස නිලධාරීන්ටත් ප්‍රකාශ කර සිටිනවා. අපි පසුගිය සභාවේ ඇවිත් කතා කරලා ගියා. සභාවේ සභාපතිවරයාට අදාළ නොවන නමුත් ප්‍රදේශයට වැදගත් වන අප විසින් ඉදිරිපත් කරන බාහිර යෝජනා සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කරන්න. එසේ දැනුවත් කර එම ලිපියෙහි පිටපතක් මන්ත්‍රීවරුන්ටත් ලබා දෙන්න. එවිට මන්ත්‍රීවරුන් ලෙස අපට යම් අධීක්ෂණයකින් පසු විපරමක් කරන්න පුළුවන්. නමුත් ඒ සම්බන්ධව කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. මේවා යෝජනා දැක්වීමට අදහස් දැක්වීමට පමණක් සීමා වෙලා තියෙනවා. අලුත් කාරුණු කීමට කළින් ඒවා නිවැරදි වෙනවා නම් හොඳයි. අපි ක්‍රියාත්මක කල නොහැකි දේවල් ප්‍රකාශ කරන්නේ නැහැ. අපි ලොකු ගණන් වල යොජනාවන් නෙමේ ඉදිරිපත් කලේ මේ සභාවේ නිලධාරීන් සහ සම්පත්වලින් කල හැකි යෝජනාවන් තමයි . අපි ඉදිරිපත් කරනු ලැබුවේ මම පසුගිය සභාවේදී උඩුගම රෝහලේ විකිරණ ශිලපියෙක් නොමැති බව ප්‍රකාශ කළා. මම කියපු ලෙසම අදාළ ආයතන දැනුවත් කර අපට පිටපතක් සහිතව ලිපියක් යවන ලෙස මා ප්‍රකාශ කළා. නමුත් මෙය එතරම් වැදගත් කොට සැලකුවේ නැහැ. අපේ ලංකාදීප පුවත්පත නිසා අපට එම රෝහලේ කොටි ගණනක දේපළ පාවිච්චි කිරීමට හැකියාව ලැබුණා. ලංකාදීප පුවත්පතට එම යෝජනාව වැදගත් වුණා. මම කතා කල එම කරුණ පිළිබදව ලංකාදීප පුවත්පත මට කතා කර ඊට අවශ්‍ය වැඩිදුර තොරතුරු ඔවුන් මගෙන් ලබා ගත්තා. මම අදාළ

කරුණු දැක්වුවා. පසුව දකුණු පළාත් සෞඛ්‍ය සේව අධ්‍යක්ෂ ඒ ගැන තොරතුරු විමසා ඒ කටයුත්ත නිවැරදි කර තිබුණා. උඩුගම රෝහලට ලංකාදීප පුවත්පත නිසා X- ray ලබා ගන්න විකිරණ ශිල්පියකු එක දිනක් තුළ ලැබුණු බව ප්‍රකාශ කරන්න කැමතියි. නමුත් සභාවට අපි ඒ ගැන කතා කළාට එයට පිළිතුරක් ලැබුනේ නැහැ. එසේ ලිපි යැවීම තුළින් ප්‍රදේශයට වඩා වැදගත් සේවයක් කල හැකියි. ගිය සභාව ගත්තම ඉදිරිපත් වූ බොහෝ යෝජනා එසේ ක්‍රියාත්මක කලේ නැහැ. පසුගිය වතාවේ ප්‍රකාශ කල ආකාරයට ප්‍රාදේශීය සභාව සතු ශ්‍රවනාගාරයට බෝඩ් එකක් නැහැ. උඩුගමට බෝඩ් ගිනිහින් තියෙනවා. ඒක සවි කිරීමට ක්‍රමවේදයක් නැහැ. ඒ වගේම මා පුස්තකාලය තිබෙන තැන පෙන්වීමට ඊතලයක් යොදා බෝඩ් එකක් සවි කරන්න කිව්වා. නමුත් ලොකු දේවල් නොවුනත්, මේ කිසිවක් ක්‍රියාත්මක වී නැහැ. මේවා සභාව තුළින්ම සිදු කර ගත හැකි දේවල්. මුලින් අපි මේවා සභාවට කියනවා. නැත්නම් කියන්න වෙලා තියෙන්නෙ මාධ්‍යයට. සභාවට මසකට දිනක් ඇවිත් මේවා කතා කරලා ගියාට වැඩක් නැහැ. මාධ්‍යයට කීම තුළින් අපිට ඒ හරහා වැඩක් කරන්න පුළුවන්. ඒ නිසා පක්ෂ භේදයකින් තොරව ඉදිරිපත් කරනු ලබන යෝජනාවල වැදගත්කම සළකා ඒ අනුව ක්‍රියාත්මක වන්න කියා ඉල්ලා සිටිනවා. ඒ වගේම ඉන්න නිලධාරින්ගෙන් ප්‍රයෝජනයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

සභාවේ විවිධාකාර නිලධාරින් ඉන්නවා ඒ නිලධාරින් සේවය නොකරනවා නෙවෙයි. නමුත් එම නිලධාරින්ගෙන් නියමාකාර සේවයක් ලබා ගන්නවාද කියා සැකයක් පවතිනවා. රජය විශාල වැටුපක් ගෙවනවා. එහෙයින් නිලධාරීන්ගෙන් උපරිම සේවයක් ලබා ගන්න. නමුත් එය වෙන ආකාරයක් පෙනන්න නැහැ.

ගිය සභා වාරයේදී ඔයිල් ෆාම් වත්තේ අපද්‍රව්‍ය බැහැර කිරීම ගැන කතා කළා. සභාවෙන් ඒ සම්බන්ධව කිසිදු කටයුත්තක් සිදු නොවුනු නිසා එම ස්ථානයට ගොස් පරීක්ෂා කළා. එම ස්ථානයට ගිය විට කර්මාන්ත ශාලාවේ අපද්‍රව්‍ය බවුසර් හයකින් දිනපතා අපද්‍රව්‍ය බැහැර කරනවා. එම අපද්‍රව්‍ය බැහැර කරන්නේ ප්‍රදේශයේ උසම ප්‍රදේශයට. කඳු මුදුනේ වලක් පවතින අතර දිනපතා එම අපද්‍රව්‍ය බවුසර් වලින් ගෙනිහින් දානවා. තනිකරම එම අපද්‍රව්‍ය සර්විස් සෙන්ටර් එකකින් අයින් කරපු ඔයිල් වගේ. වර්ෂා කාලයේදී එම වලවල් උතුරා කාණු දිගේ අපද්‍රව්‍ය බහිනවා. ඒ නිසා එම ප්‍රදේශවල වතුර බොන්න බැහැ. අපි පසුගිය කාලයේ නිවාසවලට ගිය වෙලාවේ ඒ මිනිසුන් අපෙන් රස්සාවල්, ලොකු දේවල් ඉල්ලුවේ නැහැ. ඔය කාරණාව විසදා දෙන ලෙස තමයි ඉල්ලුවේ. මේ පිළිබඳව ගිහින් බලන්න. කලිනුත් මේ ගැන කතා කරලා තියෙනවා. ඔවුන් අපෙන් ඉල්ලුවේ ජීවත් වීමේ අයිතිය විතරයි. ඒ මිනසුන්ට පිරිසිදු වතුර ටිකක් බීමට අවස්ථාව ලබා දෙන්න. සම්පූර්ණ වතු සමාගමක් එක්ක වට වුනු ඉඩම් තියෙනක ගමක්. ඉඩමේ කොතනක ළිද හෑරුවත් එම ප්‍රශ්ණය ඔවුනට එනවා. ඒ නිසා හගරන්වල ප්‍රදේශය ගැන අවධානයක් යොමු කරන්න. පරිසර ප්‍රශ්ණය සභාවට අයිති කාරණයක් පරිසර දින ක්‍රියාත්මක වෙනවා. මොනව වුනත් අපි කල යුතු දෙය කරලා නැහැ. ඒවට අපිට මැදිහත්වෙන්න පුළුවන්. අන්තිමට එම කරුණු මාධ්‍යයට ගියහම අපටත් හොඳ නැහැ. ඔබතුමන්ලා මේ සඳහා ගත් ක්‍රියාමාර්ග තමානවද කියලා සභාවෙන් අහවි. ඇත්තටම ඒ ලිං

ජලය කලු පාටයි. මේ මිනිස්සු මෙතරම් කල් ජීවත් වෙන්නෙ කොහොමද කියලා මට හිතුණා. ඒ පිළිබඳව සළකා බලා ඔබතුමන්ගේ දැඩි අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධව සභාවේ පරිසරය සම්බන්ධ නිලධාරීන් ස්ථානීය පරික්ෂාවට යවා අපි කියන කරුණුවල සත්‍යතාව තහවුරු කර ගන්නා. ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්න කියලා නැවතත් ප්‍රකාශ කරනවා.

ඒ වගේම අයාලේ යන ගවයින් අයිති සභාවට එම ගවයන් නිසා අනතුරු සිදු වෙනවා. පෙර කාලවලත් මෙම ප්‍රශ්න තිබුණා. ඒවාට විසදුම් ලබාදීමට නොහැකි වුණා. වර්තමානයේදීවත් එම ගව ගැටළුවට මැදිහත් වෙලා යම් ක්‍රියාමාර්ගයක් ගමු. ඒ ප්‍රදේශවල ජනතාවට කුඹුරක්, වගාවක් කරන්න බැහැ. ප්‍රාදේශිය සභාව පුරාම ඔය ගැටළුව පවතිනවා. රෑට වාහන අනතුරු සිදුවෙනවා. ඒ සඳහා යම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කල යුතුයි. අපි සභාව විදියට අවධියෙන් ඉන්නව කියලා ඒ අයට අපි පෙන්විය යුතුයි.

අපි සභාවේ උදේ සිට ලිපි 100 ක් විතර කියවනවා. නමුත් ඒ පිළිබඳව කතා කරලා අන්තිමට ෂේප් වෙනවා. ඒකෙ වුන තීන්දුව මන්ත්‍රීවරු කවුරුත් දන්නෙ නැහැ. අපි හවස ගමට ගිහින් කවුරුහරි ඇහුවොත් ඒකට වුනේ මොකද්ද කියලා ගනිපු තීන්දුවකුත් නැහැ. කියවන ලිපි පිලිබඳ පැහැදිළි තීරණයක් ලබා දෙන්න. පෙර යෝජනා කල පරිදි තීරණ දැනුම්දීමට කටයුතු කරන්න. ඒ අදාළ ආයතනයට හා ලිපි ඉදිරිපත් කරන පුද්ගලයාට පිළිතුරක් යවන්න. සභා තීරණය කුමක්ද යන්න දන්වන්න. එවිට ගැටළුවක් නැහැ.

අපේ වෙරංග ලක්මාල් මන්ත්‍රීතුමා මෙවරත් හොද යෝජනාවක් ඉදිරිපත් කළා. නමුත් උඩුගම පොළ පිලිබද මම බොහෝ කතා කළා. උඩුගම පොළේ වෙළෙන්දන් වැසිකිළි විදියට භාවිතා කලේ උඩුගම ඇළ . නමුත් අපි මෙය පසුගිය සභා කාලවලදී නිවැරදි කළා. අලුත් ශාලා හදලා වතුර ටැංකි තියලා, වැසිකිලි හදලා එසේ සිදු කලත් ඒවායෙන් ප්‍රයෝජනයක් ගත්තෙ නැත්නම් එහි යතුර මෙහේ තියෙනවනම් අපි පාලක පක්ෂය විදියට දැනගන්න ඕන. අපි හතර ගොල්ලෙක් හොද නැහැ කියලා ඔබතුමාව පත්කරගෙන ඔබතුමන්ලාගේ කාලසීමාව පටන්ගෙන මාස 3 ක් වෙනවා. ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ බලය යොදාගෙන තියෙන සම්පත්වලින් උපරිම ප්‍රයෝජනයක් ගන්න වැඩපිළිවෙලක් යෝජනා කරන්න. අපි කතා කරන්න ඕන කරුණු තමයි පාලක පක්ෂය වුනු මේ මන්ත්‍රීවරු සභාවට ඇවිත් මේ කියන්නෙ හෙට අනිද්දා වෙන කොට අපිට කතා කරන්න දෙයක් නැහැ. අපි කවුරුත් කොට්ඨාශ ජයග්‍රහනය කලේ නැහැ. ඔබතුමන්ලා ජයග්‍රහනය කරලා තියෙනවා. දේශපාලන භේදයක් නැතුව ප්‍රකාශ කරන්නේ. ඔබතුමන්ලා තියෙන සම්පත්වලින් ප්‍රයෝජන ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම උඩුගම නගරය පිරිසිදු කරන්න ඉස්සර කම්කරුවෙක් යොදලා තිබුණා. දැන් ඔහු විශ්‍රාම ගිහින් නැවතත් මාපලගම හා නාගොඩ වගෙ වෙලා උඩුගම නගරයත්, යම් සංවර්ධනයක් සිදු වී ඇති වෙලාවේ උඩුගම මංසන්ධියේ සිට ප්‍රධාන මාර්ගය පිරිසිදු කරන්න කියලා මම නැවතත් ප්‍රකාශ කර සිටිනවා. කම්කරුවෙක් ඒ සඳහා යොදවන්න කියා ඉල්ලා සිටිනවා.

මුළු රටේම දකුණු පළාතට වැදගත් වුනු ප්‍රශ්ණයක් ගැන කියන්න කැමතියි. පෙර පාසල් විෂය භාර අධීක්ෂණ නිලධාරීතුමියත් මෙහි ඉන්නවා. මගේ දරුවත් පෙර පාසල් යනවා. පෙර පාසල්වලට දැන් දරුවන් එන්නේ නැහැ. මගේ දරුව යන්නේ ප්‍රාදේශීය සභා පෙර පාසලට ළමුන් 55 ක් සිටින පෙර පාසලෙන් පෙර දිනක ළමුන් 19 ක් විතරයි ඇවිත් තියෙන්නෙ. පසුගිය සතිය පුරාම ළමයි ආවෙ නැහැ. අපි සභාව විදියට කරන්නේ පෙර පාසල් පවත්වා ගෙන යාම, කුණු එකතු කිරීම හා ලයිට් හයි කරන විතරයි. ඒ සඳහා අපි යම් මැදිහත්මක් අවශ්‍යද, වෛද්‍යවරුන් ගෙන්වා උපදෙස් දෙන්න ඕනද, දෙමව්පිය රැස්වීමක් පවත්වන්න ඕනද නැත්නම් පෙර පාසල්වලට ගිහින් අපෙන් විය යුතු දේ සොයා බලා එය ඉටු කරනවාද අඩුම තරමින් රු. 15.00 ට නාසයට දමන මුඛවාඩමක්වත් ලබාදෙනවාද යන්න සොයා බැලිය යුතුයි. පෙර පාසල් ළමුන් කියන්නේ අපිට අදාල කටයුත්තක්. ඒ ගැන අපි කිසිම අවධානයක් යොමු කරලා නැහැ. මමත් මගේ දරුවා පෙර පාසලට යවන්නෙ නැහැ. එම ළමුන්ගේ පෙර පාසල් අවශ්‍යතාවය අපි ඉටු කළ යුතුයි. ඒ සඳහා යම් ක්‍රමවේදයක් හදන්න කියලා මම ඉල්ලා සිටිනවා.

අපට මුද්දර ගාස්තු විදියට ලොකු මුදලක් ලැබිලා තියෙනවා. ඒවායින් යම් මුදලක් දරුවන් වෙනුවෙන් වෙන් කරලා සනීපාරක්ෂක සේවාවන් හෝ උපදෙස් ලබාදීමක් හරි කරන්න කියලා මම යෝජනා කරනවා. පෙර පාසල් සඳහා අවශ්‍ය මූලික පහසුකම් ඇති කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. පසුගිය දිනක අපි කතා කළා වෙරංග මන්ත්‍රීතුමත් දන්නවා. උක්ඕවිට පෙර පාසලේ වැසිකිලිය උතුරා යාම සම්බන්ධව සභාපතිතුමාටත් ඒ ගැන කතා කළා. එතුමා පැය භාගයක් තුළ ලේකම්තුමිය සමග සාකච්ඡා කර තාක්ෂණ නිලධාරිතුමා එතනට යවලා ඒ සම්බන්ධව ගත හැකි ක්‍රියාමාර්ග ගත්තා. වලක් හාරලා ඒක කරන්න හැදුවට අද වෙන කොට ඒක නතර වෙලා තියෙනවා. දැන් එම ස්ථානය අනාරක්ෂිතයි පෙර පාසල් දරුවෙක් වතුර වලට වැටුනොත් ඒක අපි කාටත් හොඳ නැහැ. එතනින් එහා කවුරුවත් සොයන්නේ නැහැ. ඔබතුමන්ට හැම දෙයක්ම හොයන්න බැහැ. ඒ වල වටා වැටක් හරි ගහලා ඒ අනාරක්ෂිත තත්වය ඉවත් කල යුතුයි. ඔබතුමන්ට වැඩ වැඩියි. ඔබතුමන්ගේ විෂයභාර නිලධාරීන් හරි එතනින් එහාට සොයා බලා කල යුතුයි. ඒ සම්බන්ධ අධීක්ෂණයක් කර ඒ අවධානය ඉවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා. කරන වැඩේ හරියට නොකිරීමෙන් අවධානමකට මුහුණ දෙනවා. අදාළ කරුණු කාරනා කෙරෙහි අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමින් සැමට සුභ දිනයක් පතනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. අනිත් මන්ත්‍රීවරුන් පැවසු ආකාරයට මාස 3 ක් ගිහින් තියෙනවා. අපි හැමදාම වාර්තාවට යෝජනා දෙනවා. අන්තිමට සභාපතිතුමා සුනඛයකු වල දාපු එක විතරයි වෙලා තියෙන්නෙ. මම මේ තමුන්නාන්සේට චෝදනා කරනවා නෙවෙයි. ගිය සභා වාරයේදී කොස් ගසක අත්තක් කඩන් වැටිලා අනතුරක් වෙන්න ගිය සිදුවීමක් ගැන මම ප්‍රකාශ කළා. අඩුම තරමින් පරීක්ෂණයක් පවත්වා පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කර

මාසයක් ගිය තැන මේකට ගනිපු තීරණය මේ සභාවට ඉදිරිපත් කරාවි කියලා මම බලාපොරොත්තු වුණා. මම හිතන විදියට මෙතෙක් එහෙම තීරණයක් අර ගෙන නැහැ. නමුත් අපිට පනතට අනුව මේකට වන්දි ගෙවීමේ හැකියාව තියෙනවා. තමුන්නාන්සේ මේ පිළිබඳ දැනුවත් වීම මදි නම් කොමසාරිස්ගෙන් ඒ පිළිබඳව විමසන්න ජීවිත හානියක් සිදු වුන හොත් අලාභය ගෙවීමට අපිට නියෝග කරන්නේ නඩු තීන්දුවක් මගින් නමුත් ජීවිත හානියක් සිදු වුනේ නැහැ. අහිංසක දුප්පත් කෙනෙකුගේ වහල කඩා වැටුණා. ලබන පාරත් මේක කතා කරලා වැඩක් නැහැ. අපි මාසයකට වරක් මෙතනට ඇවිත් රු. 15000.00 ක් ගන්නවා. ඉන්ධන දීමනා ලෙස රු. 3000.00 ක් දෙනවා. දුරකථන දීමනා ලෙස රු. 1000.00 ක් දෙනවා. රු. 19000.00 ක් අරගෙන මසකට සැරයක් මෙතෙනට ඇවිල්ලා කෙනෙකුට අයහපතක් වුනාට පස්සෙ අපේ වගකීම පැහැර හැරලා අපි මෙතනින් නැගිටලා යනවානම් අපි 27 දෙනා කරපු දෙයක් නැහැ. සභාපතිතුමන්ට ලැබී ඇති බලතල අනුව පරීක්ෂණයක් සිදු කරයි කියලා මම හිතුවා. පරීක්ෂණයක් කරන්න කියලා මම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. නැත්නම් කොමසාරිස්තුමාගෙන් විමසා ඒ පිළිබඳ උපදෙස් ලබා ගන්න. ඒ අලාභය වුනු තැනැත්තියට ඒ අලාභය ගෙවන්න අපිට අයිතියක් තියෙනවා. තාක්ෂණික නිලධාරී මහතකු ලවා ඒ සඳහා ඇස්තමේන්තුවක් සකස් කර එය සභාවට ඉදිරිපත් කර ගෙවීම් අනුමත කරවා ගෙන ගෙවීම් කරන්න පුළුවන්. ඒක තමයි අපි බලාපොරොත්තු වෙන්නෙ.

ඕ වගේම පසුගිය සභාවාරයේදී කොඩි කණු පිළිබඳ විමසීමක් කළා. මෙහිදී මෙම කොඩි කණු මෙහේට භාර ගෙන නැහැ කියලා ප්‍රකාශ කළා.නමුත් ඒ වෙනකොට මේ සභාවේ කොඩි කණු 42 ක් තිබුණා. ඒක මගේ වකවානුව පැවතුනා. ඒ පිළිබඳ ගාමිණී සුසන්ත මැතිතුමත් නාගොඩවිතාන සභාපතිතුමත් දන්නවා. අපි කොඩි කණු 104 ක් පැත්තකට දාමු නමුත් ඉතිහාසයේ සිට මේ වන විට පැවති කොඩි කණු 42 ක් මෙහි තිබුණා. 42 ට වුණු දෙයක් නැහැ. මම වගකීමෙන් කියනවා මම කොමසාරිස්තුමාගෙන් අහපු වෙලාවෙ කොමසාරිස්තුමා පැවසුවා කොමසාරිස් හරහා ඇවිත් තියෙන්නේ. ටෙන්ට්

ටෙන්ට් 10 ක් භාර දීලා තිබුණා මේ ටෙන්ට් 10 මේ සභාවට මේ සභාවට විතරක් නොවෙයි ලංකාවේ සෑම සභාවකටම බැසිල් රාජපක්ෂ මහත්තයා නීත්‍යානුකූල තත්වයක් නොමැති විදියට සිය ගණනකින් බෙදු නිසා තමයි එතුමා අධිකරණයට යන්නෙ මම පසුව සොයා බලන විට එම ටෙන්ට් මෙහාට ඇවිත් තියනවා එවකට පාලකයින් දේශපාලන කාලයට දාන්න මේවා දීලා තියෙනවා දුන්නට පසුව මිනිසුන් ගිහින් දුන්නේ නැහැ. එයාලා තියාගත්තා ඒක තමයි සිද්ධ වුනේ නමුත් කොමසාරිස් හරහා නීත්‍යානුකූලව ටෙන්ට් 10 ක් දීලා තියෙනවා තමුන්නාන්සේ මේකට ගෑවිලා නැහැ. පුද්ගලිකව මට කතා කරලා තියෙනවා. පුද්ගලිකව මෙතුමා විරුද්ධයි එදා ඉදලා පක්ෂයේ එකට වැඩ කරගෙන යන නිසා තමයි ඔබතුමා එහෙම හිටියෙ මේ ටෙන්ට් 10 ට වෙච්ච දේ හොයන්න ඕන අද කාලේ පොල් ගෙඩි 02 ක් හොරකම්කරපු ළමයෙක් උසාවියට අරගෙන ගිහින් දඩ ගහලා දින 14 කට උසාවි දැම්මා. ඒකට කීයක් දඩ ගැහුවද කියලා මම දන්නෙ නැහැ. රාජ්‍ය දේපල

මෙච්චර අවභාවිතා වෙලා තියෙද්දී නාගොඩ සභාවෙන් මම අහනවා ඒවට ගනිපු තීරණය මොකද්ද කියලා.

අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය JCB යන්ත්‍රයේ ෆොටෝ ගහලා ෆේස් බුක් පිටුවට දාලා තියෙනවා. ඇත්තටම එය හරි වැදගත්. අපි කවුරුත් එතනට ගියාද එතනට ගිහින් බැලුවම හරි පුදුම හිතෙනවා. වැඩිය ඕන නැහැ. ඔබතුමාලා එතනට ගිහින් බලන්න. වීථි ලාම්පු සවි කරන යන්ත්‍රය එහා පැත්තෙ තියෙනවා. එය මලවුන් අතර වගේ තියෙන්නෙ. ගිහින් බලන්න. සභාපතිතුමාට උදේ හවස පෙනෙනවා ඇති. මේ යන්ත්‍රය පැත්තකට කරලා තියන්න එපා. තව මාසයක් දෙකක් තිබුණට පසුව ඒකත් විකුණලා දාන්න වෙයි. ඔය JCB යන්ත්‍රය ළඟ ඔබතුමිය ඡායාරූප ගත්තට ඕකෙ ඉතිහාසය මෙහෙමයි තියෙන්නෙ ඕක ගිහින් ඔතනට දාන විට ලයිට් වයිපර් මොටර් සියල්ලම තිබුණා හැන්දෑවට මුරකාරයො ඉන්නවා නැවත  මුරකරු වැඩ භාර ගන්නා විට වයිපර් මොටර් දෙක නැහැ ඒවා රූපගත කර පවතිනවා මෙතුමන්ලාගේ ළඟ නැතිවුනාට මම ඒවා බැලුවා ඒක තමයි ඉතිහාසය මුරකාරයො ඉදලා තියෙනවා මුරකාරයෝ වැඩ භාරගෙන තියෙනවා නමුත් මේවායේ කොටස් නැහැ එහෙමනම් අපි මේවට පරීක්ෂණ කරන්න ඕන. උඩුගම උප කාර්යාලයේ මාරු වෙන හැටි අද වන විට ඔබතුමන් දන්නවද වාහනේ යතුර ගලක් යට තියෙනවා ගල යට තියෙන යතුර අරගෙන වාහන අරගෙන යනවා ඔන්න ඕක තමයි තත්වෙ තමුන්නාන්සේට යහමග යන්න තමයි අපි මේවා පෙන්නලා දෙන්නෙ ඒක අපි නොකියා ඉන්නවානම් තමුන්නාසේටත් ප්‍රශ්න ඇති වෙනවා තමුන්නාන්සෙත් අමාරුවෙ වැටෙනවා ඒ වගේ වැඩ හුවමාරුවක් තමයි තියෙන්නෙ දැන් අපි සේවකයන්ගේ පඩි වැඩි කරන්න සේවකයන්ට රැකියාවල් දෙන්න කතා කරනවා. එසේනම් මේ සේවකයින්ගෙන් හරියාකාර සේවයක් වෙනවද කියලා සොයා බලන්න මම හිතන්නෙ එහෙම සිද්ධ වෙන්නෙ නැහැ. තමුන්නාන්සේට පටලැව්ච්ච නූල් බෝලයක් තමයි දීලා තියෙන්නේ තමුන්නාන්සේ කොනක සිට් මේක ලිහාගෙන යන්න ඕන දැනට ලක්ෂ 70 ක් 80 ත් ලැබිලා තියෙනවා කියලා කතාවුණා තව මාස 2 ක් 3 ක් යද්දී මේක වියදම් වෙච්ච ක්‍රමයක් සොයා ගන්න බැරි වෙන්න බැහැ මන්ත්‍රීවරු 27 ක් ඉන්නවා මේ මුදල්වලින් ඔවුන්ගේ යොජනා අරගෙන පුංචිම පුංචි වැඩක් හරි කරන්න තවම අපේ ගම්වලට වීථි ලාම්පුවක්වත් ලැබුනේ නැහැ. අද උදේ මට කණගාටු හිතුණා. වීථි ලාම්පු සකස් කිරීමේදී තමුන්නාන්සේලා 15 දෙනාගෙ නම් විතරයි තියෙන්නේ අනිත් 12 දෙනාට නැහැ මම ලයිට් කණුවක් ගාවට ගිහින් මේක දාන්න කියලා කියන්නෙ නැහැ මගුල් ගෙදරකට තොවිල් ගෙදරකට ගියහම මිනිස්සු කියනවා මන්ත්‍රීතුමා දැන් සභාවට ගියා නේද දැන් වීථි ලාම්පුවක්වත් දාලා දෙන්න කියලා. එහිදී අපි ඉතාමත් අපහසුතාවයට පත්වෙනවා අපි ඔබතුමාගෙන් බලාපොරෙත්තු වුනේ මම පළමු දිනයෙත් ප්‍රකාශ කළා නාගොඩවිතාන කියන්නෙ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් ඔහු සභාපති වුන එක ගැන අපි සතුටු වෙනවා කියලා. එදා අපි පන්ති භේදයක් දේශපාලන භේදයක් දැක්කෙ නැහැ. ඔබතුමන්ට මම හිතවත් ඒ වැඩ ඉතිහාසයේ දැකපු නිසා ඒ වගේ වැඩ කරන්න එපා කියලා මම ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා ඒක දැක්කම අපේ පපුවෙ පුංචි වේදනාවක් ඇති වුණා අපි  12 දෙනෙක් ඉන්නවා. ඒක නිවැරදි කර ගන්න එහෙම

කරනවනම් ඒක අධීක්ෂණය කර අපිටත් එක වීථි පහනක් හරි ලබා දෙන්න. අපි අත උස්සනවා යෝජනා කරනවා සහයෝගය ලබා දෙනවා. එහි ප්‍රතිඵලයක් අපිට තියෙන්න ඕන එහෙම වෙනවනම්, පතිනායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ දිසානායක මාවතේ ඒ ඩොංගා ගස කැඩිලා. අද වෙන විට ඉතාමත් අනතුරුදායක තත්වයට පත්වෙලා තියෙනවා. මම ඔබතුමන්ට ගිය සභාවාරයේදී ඒ ගැන කිව්වා. දිසානායක මාවතේ ටොන් 5 ට වැඩි වාහන ධාවනය තහනම් කියලා බෝඩ් එකක් ගහන්න කියලා නමුත් තවම ඒ බෝඩ් එක ගහලා නැහැ කමියුනිකේෂන් එකකට ගිහින් රු 10 ක් වැය කරලා සේවක මහතකු අතේ යැව්වනම් දැනටමත් බෝඩ් එක ගහලා ඉවරයි මේ ගැන ඊළග සභා වාරයේදීත් කතා කරන්න තියන්න එපා. ලොරියක් කඩා ගෙන බයිසිකල් කාරයෙක් ත්‍රීවිල් කාරයෙක් වැටුනොත් එදාට අපි දෙන්නටම හඩ නගන්න වෙනවා යට පුස්සක්. කොන්ක්‍රීට් එක යටින් දැන් ගලවලා ගිහිල්ලා තියෙන්නෙ එතනින් කඩා ගෙන හැලෙනවා. එවිට තමුන්නාන්සේට තමයි නරක නාමය එන්නෙ. මට මේක පෙන්වා නොදී ඉන්න පුළුවන්. එදාට මටත් විවේචනය කරන්න පුළුවන් ඒ නිසා දැන්වත් ඔබතුමාලා ක්‍රියාත්මක වෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම කම්කරු මහත්වරුන් පසුගිය කාලයේ උඩුගම ප්‍රදේශයමයි හිටියේ අපේ ප්‍රදේශවලට ආවෙ නැහැ ඒ නිසා ඒකටත් නිශ්චිත ක්‍රමවේදයක් හදන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ එදා ආනන්ද අබේවික්‍රම මහතා ලබා දුන් සංගීත භාණ්ඩ පොත් පත්වල නැහැයි කියන්න බැහැ. එහෙමනම් පොත්පත් ගංවතුරට අහුවෙලා තියෙන්න ඕන. මම මේ සභාවෙ ඉන්න කාලෙ ඒ වන විට රු.50000.00 ක් විතර වටින අද වන විට රු. ලක්ෂ 1 1/2 ක් විතර වටිනා සංගීත භාණ්ඩ ගෙනාවා එදා මම ප්‍රශ්ණ කළා. අද වෙනකොට ඒවට මොකද වෙලා තියෙන්නෙ. අපිට එය ප්‍රශ්නයක් ඒවා පැත්තකට කරාද කවුරුත් ගත්තද වෙන්දේසි කලාද යන්න උත්තරයක් අපට ලැබිය යුතුයි. ඒ පිළිබද වාර්තාවක් අපට ලබා දෙන්න මෙය නිකම්ම අහක දාන්න බැහැ එම කරුණුවලින් 50% ක්වත් නිවැරදි කරුණු විය යුතුයි වෙයි කියා මම බලාපොරොත්තු වෙනවා අපි යෝජනා කරනවා ස්ථිර කරනවා ඒකමතිකව සභා සම්මත කරනවා ඊළග සභා වාරයට එනවා වාඩිවෙනවා. ඊළග ඩීසල් බිල් ගේනවා ඒක අත්සන් කරලා දෙනවා රු 15000.00 සාක්කුවෙ දාගන්නවා රු. 3000.00 ක් තව එනවා. 18000.00 ක් වෙනවා. 19000.00 ක් සාක්කුවෙ දාගෙන ගෙදර යනවා. ඒක නොවෙයි අපි බලාපොරොත්තු වෙන්න ඕන. ඊළග මාසයේ අපි ගමට යන විට මේ මන්ත්‍රීවරු 27 දෙනාම වීථි ලාම්පු 2ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා දීම තුළින් වීථි පහන් 54 ක් පත්තු වෙනවා එවැනි සුළු කටයුත්තක්වත් මහජන නියෝජිතයෙක් හැටියට මහජනතාවට ඉටු කිරීමට අපට තමුන්නාන්සේගේ ශක්තිය අවශ්‍ය වෙනවා . ඒ නිසා අද අපි ආඩම්බර වෙන්න ඕන. වෙන සභා වල්වල ගහගෙන තුවාල වෙලා රෝහල් ගත වෙලා. අපි සතුටු වෙන්න ඕන පවතින සමගිය ගැන ඔබතුමන් ආඩම්බර වෙන්න ඕන. මෙවැනි මන්ත්‍රී මණ්ඩලයක් ඔබතුමාට ලැබීම සම්බන්ධව කිසි කෙනෙකුගේ එවැනි ආරවුලක් නැහැ. සියළු දෙනාගේ සහයෝගය ලැබෙනවනම් ඒ සහයෝගය ලබා ගන්න ඔබතුමන් දක්ෂ විය යුතු වෙනවා. ඒක තව මාස 2 ක් 3 ක් ලැබේවි. ඊට

එහා එම සහයෝගය ලබා ගන්න ඔබතුමන් දක්ෂ විය යුතුයි. එම ශක්තිය තමුන්නාන්සේට ලබා ගැනීමට හැකි වේවායි පතමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශිය සභා උප සභාපති ගාමිණී සුසන්ත මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය හා ජනමාධ්‍ය මහතුන්ගෙන්ද අවසරයි. වෙනත් කරුණු යටතේ අදහස් දැක්වීමට බලාපොරෙත්තු නොවුනත් ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා ඉදිරිපත් කල කරුණුවලට අදහස් ඉදිරිපත් කිරීමක් වශයෙන් මම මේ වෙලාව අවස්ථාවක් කර ගන්නවා. එතුමා ගිය සභා වාරයේදී අනාරක්ෂිත ගසක් වැටිලා ඒ ගැටළුවට විසදුමක් දෙන්න කියලා යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ සම්බන්ධව පරීක්ෂණයක් කරලා එතුමාගේ ඉල්ලීම සම්බන්ධව සම්බන්ධව සළකා බැලීමට සහ ඒ පිළිබදව සභාව දැනුවත් කිරීමට සභාවේ ගරු මන්ත්‍රීවරුන් එකගතාවය පළ කළා. අනුමැතිය ලබා දුන්නා. මේ මන්ත්‍රීවරු අපහසුතාවයට පත් නොකර ඔබතුමන් එය අධීක්ෂණය කරා නම් නිලධාරින් යොදවා ඒ පිළිබද සොයා බැලුවා නම් ඒ සම්බන්ධව ඔබතුමන් ගරු සභාව හමුවේ අදහස් ප්‍රකාශ කරන්න. ඔබතුමන් ඒක පෞද්ගලිකව අධීක්ෂණය කළා කියලා මට දැනගන්න ලැබුණා. මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල ආකාරයට එය සොයා බලා ඒ සදහා යම් විසදුමක් ලබා දිය හැකි නම් නීත්‍යානුකූලව එය ලබා දීමට සභාවේ ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාම එකගතාවය පළ කරනවා. එම සිදු වූ අපහසුතාවයට විසදුමක් ලබා දීමට අපි ඔබතුමන්ට අපේ කැමැත්ත නැවත වරක් ප්‍රකාශ කරනවා.

ඒ වගේම ගරු සහබන්දු මහතා ගිය සභා වාරයේදී ප්‍රකාශ කළා මේ සභාවට ලැබුණු කොඩි කණු රෙදි ටෙන්ට් අස්ථාන ගත වී ඇති බව පිළිබදව ඇත්තටම සහබන්දු මහතාම ප්‍රකාශ කළා. එතුමාගේ කාලයේදී මේ කොඩි කණු කාලයක් තිබුණා. අපේත් ගමේත් උත්සව සදහා මේවා අරගෙන ගියා. ඒ උත්සවය සදහා සහයෝගය ලබා ගත්තා. ක්‍රමානුකූලව මේවායේ අස්ථාන ගත වීම් සිදු වෙලා තියෙනවා. ගිය ආණ්ඩුව කාලෙ නෙවෙයි ඊට කළින් සභාව සතු කොඩි කණු අස්ථාන ගත වෙලා තියෙනවා. පන්සල්වලට විවිධ ස්ථානවලට රැගෙන ගොස් නැවත ගෙනත් නොදී අස්ථාන ගත වෙලා තියෙනවා. සභාවාර කිහිපයකදීම හිටපු අයගේ වගකීම තමයි එම භාණ්ඩ ආරක්ෂා කර ගැනීම නමුත් මේ අතුරුදන්වීම පිළිබදව මම දන්නෙත් නැහැ. ඒක සහබන්දු මහත්තයා දන්නෙත් නැහැ. මොන ආකාරයෙන් හො ඒ දේ සිදු වෙලා තියෙනවා. මෑත කාලයේ ලැබුණු කොඩි කණු පිළිබද සෙවීමට ගරු සභාපතිතුමන්ට අපි බලය පැවරුවා. ඒ සම්බන්ධයෙන් අපි පිළිතුරක් බලාපොරෙත්තු වෙනවා. ඒවා භාරගෙන තියෙවනම් ඒවාට වුනේ කුමක්ද දැනට පවතින තොරතුරු අපි බලාපොරෙත්තු වෙනවා. ඒ වගේම හට් භාර ගෙන තිබුන නම් පාවිච්චි කරලා තිබුණනම් කාට හරි භාරදීලා තියෙනවනම් අපේ පොත්පත්වල තියෙනවනම් ගබඩාවෙ තිබුණ නම් ඒ පිළිබදවත් මේ ගරු සභාව දදැනුවත් කරයි කියලා අපි බලාපොරෙත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි මේ මන්ත්‍රීවරු ප්‍රකාශ කරන යම් යම් යෝජනා හා අදහස් හැකි ඉක්මණින් මේ වාරයේදී නැතිනම් ලබන වාරයේදී හෝ ඉදිරිපත් කරන්න. ඔබතුමන් දන්නා කරුණු නිලධාරීන් ලවා

සොයා බලා සභාවට ඉදිරිපත් කිරීම ඔබතුමාගේ යුතුකමක්. ගරු මන්ත්‍රීවරුන් මෙතනින් එළියට යන විට විවිධ චිත්‍රයක් මවා ගෙන යන්නේ. මේවා හොරකම් කරලා වංචාවක් සිදු වෙලා විශේෂයෙන් නවක මන්ත්‍රීවරු වැරදි චිත්‍රයක් මවා ගෙන තමයි එළියට යන්නේ. මේක දූෂිත පාලනයක් ඒ සඳහා අනුබල දුන් මහජන නියෝජිතයන් දූෂිත නිලධාරී මණ්ඩලයක් සිටින ස්ථානයක් ලෙස ඔවුන් සිතනවා. 1991 මේ ප්‍රාදේශීය සභාව පිහිටුවීමෙන් පසුව ඒ කාලයේ සිටම කාලයක් තිස්සෙම දූෂණයට ලක්වුණු ප්‍රාදේශීය සභාවක් බවට මේ සභාව ගැන ගරු මන්ත්‍රීවරුන් වැරදි වැටහීමක් අරගෙන තියෙනවා. යම් යම් දූෂිත ක්‍රියාවන් සිදු වුණා. අපිත් ඒවා පිළිගන්නවා. අපිටත් හෘද සාක්ෂියක් තියෙනවා. අපි බොරු කියන්නේ නැහැ. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු මේවා දන්නවා. නමුත් අපිට මේවා වසන් කරගෙන ඉන්න වුවමනාවක් නැහැ. ඒ කාලවල සිදු වෙලා තියෙනවනම් සොයලා බලන්න. ඒවා සොයාගන්න පුළුවන් නම් සොයාගන්න එක අපේ මන්ත්‍රීවරුන්ගෙ වගකීමක්. තව දුරටත් මේ සභාවේදී ඔය ගැන කතා කරන්න අවශ්‍ය නැහැ. 1991 සිටම කතා කරනවා. ඒ නිසා මේ සභා වාරයේදීවත් මේ ප්‍රශ්නය විසදාගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

තරංග සුදර්ශන මන්ත්‍රීතුමන් මීට අවුරුදු තුන හතරකට කළිනුත් පසුගිය කාලයේදීත් කතා කරා වටවල වැව්ළි සමාගමට අයත්ව සිදුවන දූෂිත ක්‍රියාවන් පිළිබඳව පරිසර දූෂණය පිළිබඳව අපි දීර්ඝ වශයෙන් ඒ සම්බන්ධව කරුණු සාකච්ඡා කළා. ඇතැම් කඳු මුදුන්වල වලවල් හාරලා තියෙනවා. අද වන විට මමදන්න ආකාරයට අධිකරණය මගින් අවසාන නිවේදනයක් නිකුත් කරලා තියෙනවා. කටුපොල් කර්මාන්ත ශාලාව මගින් යම් පරිසර දූෂණයක් සිදු වුනොත් යම් ඇළ මාර්ගයක හෝ වෙනත් ස්ථානයක පරිසර දූෂණයක් සිදු වුනොත් එම කටුපොල් කර්මාන්තශාලාව වහන තීන්දුවකට ඇවිත් තියෙන්නෙ. පරිසර චෝදනාවක් නොවන ආකාරයට කර්මාන්ත ශාලාව පවත්වා ගෙන ලෙස කටුපොල් කර්මාන්ත ශාලා කළමනාකරතුමා ඇතුළු සියළුම දෙනාට නියෝගයක් නිකුත් කරලා තියෙනවා. මම දන්නා තරමින් මහේස්ත්‍රාත් තුමන් හා වෙනත් අයගේ උපදෙස් මත පිරිපහදුවක් සකස් කරලා තියෙනවා. මම කටුපොල් කර්මාන්තශාලාව ගැන කතා කරනවා නොවෙයි. සහබන්දු මන්ත්‍රීතුමා නිශාන්ත මන්ත්‍රීතුමත් මේ මාමණදොල ඇලේ කටුපොල් පාවෙනකොට අපේ සදුන් මන්ත්‍රීතුමාගේ නිවස අසළින් වතුර පාච්චියට අරගෙන රූපවාහිනි නාලිකාව ගෙන්වා ගෙන ඒවා වීඩියෝ කර මාධ්‍යයට දාලා ඒ පරීක්ෂණ සදහා සියළු සහයෝගයන් දීලා කටයුතු කරලා තියෙනවා. අපට ඒ සම්බන්ධව ඒ කාලයේ චෝදනා එල්ල වුණා. අපි ඒවායින් ගණුදෙනු අරගෙන ඒවා යට ගහනවා කියලා. ඒ වගේම අපිත් මේ කටුපොල් කර්මාන්තශාලාව ගැන ඒවා වගා කිරීම පිළිබඳවත් කිසිදු පැහැදීමක් නැහැ. අපි ඒ ගැන පැහැදීමක් නැහැ. මෙයින් පරිසර දූෂණයක් සිදු වන බව අපි දන්නවා. ගරු තරංග සුදර්ශන මන්ත්‍රීතුමනි දැන් ඔවුන්ගේ කටුපොල් අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය තමයි කටුපොල් ශාලාවේ ඉතිරිවන රොඩු අපද්‍රව්‍ය පොහොර බෑග් වලට දාලා ඇළ අයින්වල තියෙන ගස් වටේට ගෙනත් දානවා. එමගින් ගස්වලට පොහොර ලැබෙන බව ඔවුන් ප්‍රකාශ කරනවා. ඒ බව පරික්ෂා කර බලන්න. උඩලමත්තෙත් නාකියාදෙණිය හගරන්වල ඇළ දිගේ තියෙන්නේ මාර්ගයක් ඒ මාර්ගයේ ගිහින් බලන්න. ඇළ

අපවිත්‍ර වෙලා තියෙනවා. ගස් වලේට පොහොර කියලා පවසා මේ අපද්‍රව්‍ය යූරියා බෑග්වලට දාලා ගෙනත් දානවා. එතකොට ක්‍රමානුකූලව තෙල් තට්ටුවක් තමයි යටට බහින්නෙ. මේවා තමයි මේ ඇළට දැන් සෝදාගෙන එන්නෙ දැන් ඒක තමයි ඔවුන්ගේ ක්‍රමවේදය

ඒ වගේම තවත් පරිසර හානියක් සිදුවෙනවා. හෙක්ටයාර 10ක් 15ක් 20ක් එක පාරටම රබර් වගාවන් උගුල්ලලා දානවා. ඒක දැන් සිදුවන පරිසර දූෂණයක්. විශාල යන්ත්‍ර සූත්‍ර දාලා රබර් ගස් කපලා වගාවන් සඳහා ඉඩම් ශුද්ධ කරනවා. ඒ වගේ විශාල ගණනින් ගස් කැපීමේදී ඒ ඇළවල්වලට කොතරම් ප්‍රමාණයෙන් වතුර ගලා ගෙන එනවද උඩලමත්ත යටලමත්ත වැනි ප්‍රදේශවල ජලයට යට නොවුනු ප්‍රදේශ දැන් යටවෙන්න පටන් ගෙන තියෙන්නෙ මේ එළිපෙහෙලි කිරීම නිසා විශාල ජලය ප්‍රමාණයක් මේ ඇළවල් දොළවල්වලට ගලා යන නිසා බව මම කියන්න කැමතියි. එම වැසි ජලය කෙලින්ම පොළවට පතිත වන එක නතර කරලා ඒ සියල්ල මුඩු බිම් කරලා විශාල බිම් ප්‍රදේශයක් එළිපෙහෙලි කිරීම නිසා විශාල පරිසර හානියක් ඒ තුළින් සිදු වෙනවා. කවදාවත් යට නොවුනු ප්‍රදේශවලට ජල ගැලීම් ඇතිවෙලා තියෙන්නේ මේ තත්වය නිසා කියලා මම සිහිපත් කරන්න කැමතියි. මම කියන කරුණු කාරණා තවදුරටත් ඉදිරියට යන්නෙ නැතුව ගරු සභාපතිතුමනි ඔබතුමාගේ කාලය මිඩංගු නොකර මම ප්‍රකාශ කරන්න කැමතියි.

උඩුගම පොළ සම්බන්ධව විසඳුමක් ලබාදෙන්න අපි සාකච්ඡා කළා. තාක්ෂණික නිලධාරීන් සෞඛ්‍ය නිලධාරීන් ඒ වගේම පොළ ලබා ගත් පුද්ගලයාත් එක්කගෙන ගිහින් තාවකාලික ගොඩනැගිලිවලින් ප්‍රධාන ගොඩනැගිල්ලට ඔවුන්ට යන්න කියන්න. එළවළු විකුණන්න සුදුසු ස්ථානයක් නොමෙයි එතන ඔවුන්ට නව ගොඩනැගිල්ලට යන්න ප්‍රතික්ෂේප කරන්න බැහැ. එහෙම අකමැති වුනොත් ඔවුන්ගේ වෙළදාම තහනම් කරන බව කියන්න. එහෙයින් ඔවුන්ට සුදුසු පරිසරයකට ඔවුන්ව යවන්ව කටයුතු කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම අපේ අරමුදලට යම් මුදලක් බැර වී ඇති බවට සමස්ථ සභාවම දැනුවත් වෙලා තියෙනවා. සභාපතිතුමාගේ පාර්ශ්වය මගින් පොදු අරමුදලේ ලක්ෂ 78 ක මුදලක් පවතින බවට ප්‍රකාශ කළා. කොට්ඨාශ සංවර්ධනයට යම් මුදලක් ලැබෙයි කියලා අපේ ගරු මන්ත්‍රීවරුන් විශ්වාස කරනවා. ඒක මම අනුමත කරනවා නොමෙයි. ප්‍රාදේශීය සභාවට යම් මුදලක් උපද්දවන වැඩපිළිවෙලක් සිදු විය යුතුයි. නැතිනම් එම ලැබුණු මුදලින් ඒ වගේ උත්පාදන වැඩපිළිවෙලකට නොගිය හොත් සභාව මහත් පසුගෑමකට ලක් වෙනවා. පසු කාලීනව මේවායේ ප්‍රතිවිපාක අපට විඳින්න සිදු වෙනවා. අපේ ආර්ථික තත්වය වර්ධනය කරන වැඩපිළිවෙලකට මුදල් වලින් යොදවන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල ආකාරයට අපේ ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි පොළවල් රංගන ශාලාවන් වගේ ස්ථාන කෝටි ගණන් වැය කර ඉදිකරත් ඒවා නියම ප්‍රමිතියට නැති බව පේනවා. පසුගිය සභාවාර වලදිත් ගරු මන්ත්‍රීවරු හිටපු සභාපතිවරුන්ට ඒ පිළිබඳව නොයෙක් කරුණු කාරණා ඉදිරිපත් කළා. විවිධ ආකාරයට කිව්වා ශ්‍රවනාගාර ගොඩනැගිල්ල එතනට ගැලපෙන්නේ නැහැ. මෙහි ශබ්දවාහිනිය පිළිබඳ ප්‍රශ්නයක් වෙනවා. මේවායේ ආසන සංඛ්‍යාව ඒ ආකාරයට

දාන්න බැහැ. ඒ කාලයේ විවිධ දේ සාකච්ඡා කලත් එසේ සිදු වුනේ නැහැ. කිසිදු තැකීමක් නොකර එම කටයුතු කරගෙන ගියා. තල්ගස්වල පොළ නිර්මාණය කරද්දිත් කුරුනෑගල කෙනෙක් තමයි. එහි සැළැස්ම සකස් කළේ. එතුමා එහි සිට මුදල් අරගෙන භූ විෂමතාවය පිළිබඳ කරුණු දන්නෙ නැහැ. මිනිසුන්ට යන්න එන්න පුළුවන්ද කියලා සොයා බැලුවෙ නැහැ. බොහොම අපහසුවෙන් සමහර ගොඩනැගිලි වෙනස් කර ගනු ලැබුවා. නමුත් අපට ආධාර උපකාර කල ආයතන නිලධාරීන් අනිත් ඒවා වෙනස් කිරීමට අනුමැතිය ලබා දුන්නේ නැහැ. ඒවා එලෙසම ඉදි කර ගෙන ගියා. අද වන විට බලන්න පොළට ඇතළු වෙන මාර්ගය තිබුණට පොළ මැදින් තමයි මිනිස්සුන්ට ඇතුල් වෙන්න වෙලා තියෙන්නේ. පොළට පාරක් දාන්න ගොඩනැගිලි ටික අනිත් පැත්තට හරවන්න කියලා අපි ඉල්ලීම් කළා. ඒ සියල්ල සිදු වුනේ නැහැ. වර්තමානයේ දැඩි අපහසුතාවයකට පත් වෙලා තියෙනවා. වසන්ත මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල ආකාරයට මේ ගොඩනැගිල්ල ඉදි කරන අවස්ථාවේදීත් ඒ කරුණු සැලකිල්ලට ගෙන කටයුතු කරන්න ඕන. අපේ සහබන්දු මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල ආකාරයට අපේ ට්‍රැක්ටර් රථය අපි අරගත්තෙ බොහොම අමාරුවෙන් අජිත් මහතා සභාපති වෙලා ඉන්න කාලේ. ඒ කාලයේ මුදල් තිබුනේ නැහැ. අපට මේක ලබා දීලා තිබුන තල්ගස්වල ආයතනයක් සමග ගණුදෙනු කිරීම අපට ඊට වඩා අපහසු වුණා. ගරාජවල එවැනි තාක්ෂණය සම්බන්ධ දැනුවත් තාක්ෂණ ශිල්පීන් නොමැති නිසා එහි අඬුත්වැඩියාවක් කරන්න කවුරුත් භාර ගන්නේ නැහැ. අද අපේ රථවාහන පවතින්නෙ විවිධ තැන්වල උප කාර්යාලයේ කොටසක් පවතිනවා. ඒවා සුදුසු පරිදි ගාල් වෙලා නැහැ. ඒ නිසා යම් කාලයක් ගත්තත් කමක් නැහැ සභාපතිතුමනි ස්ථිර ගොඩනැගිල්ලක් හදනවනම් රථගාලක් සහිතව හදන්න. මේ බිම් කඩ අයින් කරලා අපේ නාගොඩ සමෘද්ධි බැංකුව හැදුවා වගේ උඩට වාහන ඒමට හැකි වන සේ තව් කිසිම කෙනෙකුට අඩුපාඩු කීමට  අවස්ථාව ලබා නොදෙන ආකාරයට යම් කොටසක හෝ ගොඩනැගිලිලක් හදන්න ගරු සභාපතිතුමාට ශක්තිය ලැබේවා.

ඒ වගේම ගරු මන්ත්‍රීවරුන් 13 දෙනයි අපේ සභාවෙ හිටියෙ. සමහර වෙලාවට විපක්ෂයට 4 දෙනයි. අපට 9 දෙනයි. නැත්නම් විපක්ෂයට 5 යි අපට 8 යි නමුත් අද 27 දෙනෙක් ඉන්නවා ගැටළු වැඩිවෙලා එහිදී අපේ ගරු සභාපතිතුමන් මහත් අපහසුතාවයට පත්වෙලයි ඉන්නෙ. පසුගිය කාලසීමාව පුරාම වර්ෂාව නිසා වීථි පහන් සවි කරගන්න බැරිවුණා. විදුළි සැර වැදීම යන කරුණුත් තියෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීවරුනි අපි ඉවසීමෙන් කටයුතු කර ගමු. ඔබතුමන්ලා යෝජනා ගේන්න. අපි තව කාර්මික නිලධාරී කෙනෙකු වීථි පහන් සවි කිරීම සඳහා ගමු. උඩුගමින් නාගොඩින් ලෙස වැඩ පටන් ගනිමු නැත්නම් මෙය කවදා ඉටු කරන්නද ඒ වගේම අජිත් මහත්තයා ප්‍රකාශ කල ආකාරයට අක්මීමණ ප්‍රාදේශිය සභාවේ වීථි පහන් ලබා ගන්නේ යම් ආයතනයකින් එවා වගකීමක් ඇතුව ලබාදෙනවා. ඒ වගේ අපිත් අපේ සම්පත්වලින් උපරිම ප්‍රයෝජනයක් ලබා ගමු. පසුගිය කාලයේ අපේ ගරු සභාපතිතුමන්ලා උඩුගම මුතුහෙට්ටිගම ආයතනයෙන් වීථි පහන් ලබා ගත්තා. එහෙම තැනකින් ගත්තම අපට සල්ලි නැතිවුනත් භාණ්ඩ ලබා ගන්න පුළුවන්. එහෙම

වැඩපිළිවෙලකට අප යායුතුයි. එසේ නොමැතිව අප සභාවේ පවතින ප්‍රශ්ණවලට විසදුමක් ලබා දීමට නොහැකිබව අපේ ගරු මන්ත්‍රීවරුන්ට ප්‍රකාශ කරන්න මම කැමතියි.
අපි සැවොම සාකච්ඡා කරලා තියෙන ප්‍රශ්න දිගට යාමට ඉඩ නොදී මේ සභාවෙන් ඉවර කර ගමු. නව දැක්මකට අපි හැමෝටම හැකියාවක් ලැබේවායි පතමින් මම නිහඩ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ගයාන් මධුෂංඛ  මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම ඉදිරිපත් කල යෝජනා අතරින් එකක් තාක්ෂණ නිලධාරී මහතකු ලවා අධීක්ෂණය කරලා තියෙනවා. ඒ නිසා එම පාලම් දෙක ගැන කතා කිරීමට කාලය ගන්නේ නැහැ. මලාමුර මහ ඇළ මාර්ගය සුනිල් නාරංගොඩ මහතාගේ නිවස අසළ සිට ගිංගග දක්වා ශුද්ධ කිරීමට මම යෝජනා කරනවා. මලාමුර කොට්ඨාශයේ ප්‍රධාන ආදායම් මාර්ගය වන තේ වගාව ඇළ අවහිර වීම නිසා නිතරම යට වෙනවා. එම නිසා එම හිර වී ඇති ඇළ ශුද්ධ කර දීමට ක්‍රියාමාර්ගයක් ගන්න කියා මම ඉල්ලා සිටිනවා. ඒ වගේම පරණතානායම්ගොඩ අලුත් ඉහළ අලුත්තානායම්ගොඩ හා පරණතානායම්ගොඩ යා කරන පාලමේ ඇණ බොහොමයක් ගැලවී තියෙනවා. ඒ සදහා ලොකු වියදමක් යන එකක් නැහැ. වියදම් වැඩිවීමට පෙර ඒ ගැන අවධානය යොමු කර ඇණ සවි කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන මෙන් ඉල්ලා සිටිනවා.
කොළඹ කඩේ මංසන්ධියේ මලාමුර ප්‍රදේශයට ඇති පාලම අසළ ඇළට ගම්වාසීන් කුණු කසල බැහැර කරනවා. ඒ නිසා එම ස්ථානයට කසළ බදුන් තියන්න කියලා මම ඉල්ලා සිටිනවා. සභාපතිතුමන් පවසන ආකාරයට කසල බදුන් තැබීමත් ප්‍රශ්නයක් වෙනවා. නැතිනම් කුණු දැමීම තහනම් යනුවෙන් බෝඩ් එකක් හරි ගහන්න කටයුතු කරන්න.
වත්තෙ මාර්ගයේ බර වාහන තවමත් එලෙසම ගමන් කරනවා. මම ඒ ගැන ගරු සභාපතිතුමාටත් ලේකම්තුමියටත් දැන්වුවා. ඒ පිළිබද ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගන්න. ඒ සම්බන්ධව ඊයෙත් අදත් මට පැමිණිලි ආවා. ඒ පාර පාවිච්චියට ගන්න බැරි වෙයි කියලා මිනිස්සු චෝදනා කරනවා. හෙටම පුලුවන් නම් ඒ සදහා බෝඩ් එකක් දමන්න. මදුරුදූව හරහා ඇටගහවිල මාර්ගය එහාට වෙනකම්ම ලොකු අවධානමක් තියෙනවා. සභාපතිතුමන් ගිහින් සාකච්ඡා කරලා ඒ අය ලවා එතැන කැඩුණු බෝක්කුව අපි ප්‍රතිසංස්කරණය කළා. නමුත් තවමත් සමහර වාහන එනවා. අපි ඒ ගැන හෙව්වෙ නැහැ කියලා අපට චෝදනා කරනවා. ඒ නිසා ඉතා කඩිනමින් එම පුවරුව සවි කරන්න කියලා යෝජනා කරමින් මම නිහඩ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමා ඇතුළුද මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමියගෙන්ද ජනමාධ්‍ය මහතුන්ගෙන්ද අවසරයි. මම ගිය සභාවෙදිත් මාපලගම මංසන්ධියෙ වීථි ලාම්පු අක්‍රීය වීම ගැන කතා කළා. ඊට පෙරත් කතා කළා. මාපලගම මංසන්ධයෙ ඇති ලොකු ලාම්පු 3 හරි ඉක්මනින්

සකස් කර දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. හවසට මාපලගම මංසන්ධියේ දැඩි අඳුරක් පවතිනවා. බස්නැවතුම්පලේ ලයිට් ටික දැම්මම තමයි ටිකක් හරි එළියක් ලැබෙන්නෙ. ඒක මම මේ වෙලාවෙ සිහිපත් කරනවා.

ඒ වගේම මාපලගම වෙළඳ සංකීර්ණයේ උඩුමහලේ කඩ කාමරය අපි ටෙන්ඩර් කරලා කුලියට දීලා තියෙනවා. ඇත්තටම එම කඩ කාමර කුලියට ගත්ත අයගේ බදු මුදලක් දැන් එකතු වෙලා තියෙනවා. ඒ කඩකාමර පවත්වා ගෙන යාමට ඔවුන්ට හැකියාවක් නැහැ. ලේකම්තුමිය ඇතුළු තාක්ෂණික නිලධාරීන් ගිහින් තෙමෙන වහළ සකසා දීමට ඔවුන්ට පොරොන්දුවක් ලබා දී තියෙනවා. තවම ඒ කටයුත්ත සිදු වුනේ නැහැ. ඒ නිසා වහල හදලා දෙන්න. ඒවා ගත්තු අයට එම කඩකාමරය පවත්වාගෙන නොයන නිසා ඔවුන්ට බදු මුදල් ගෙවන්නත් බැහැ. දවස කඩයට දීපු කාමරය පාවිච්චි කරන්නේ නැහැ. බදු මුදල් ගෙවන ලෙස සභාවෙන් ඔවුන්ට ලිපි යවනවා. ඒ මිනිසුන්ට කුමක් හෝ බදු සහනයක් ලබා දිය යුතයි. ඒ පිළිපදව ඔබතුමන්ගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින අතර එම කඩ කාමරයේ දොරෙක ප්‍රශ්ණයක් ඇති බැවින් සභාවට හැකි ලෙස එම දොර සාදා දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

වෙළඳ සංකීරණයට අයත් වසා දමා ඇති වැසිකිලිය නැවත විවෘත කිරීම පිළිබඳවව කතා කළා. එහෙම කලොත් විශාල ගැටළුවක් ඇති වෙනවා. පසුගිය කාලයේ කොමසාරිස් පාලනය යටතේ ලේකම්තුමියට විශාල ගැටළු ඇති වුණා. එසේ විවෘත කරනවා නම් ඉදිරිපස දොරවහලා පිටුපසට උළුවස්සක් දාලා දොරක් දාලා ඒක ප්‍රතිසංස්කරණය කරන ලෙස මා දැඩි ලෙස ඉල්ලීමක් කරන්න කැමතියි. පියල් මන්ත්‍රීතුමන් එතනට යාමට මාරගයක් නැති බව ප්‍රකාශ කළා. වෙළඳ සංකීර්ණය පිටුපසින් ඕනතරම් ඉඩ තියෙනවා. නමුත් රාත්‍රී කාලයට පමණක් වැසිකිලි භාවිතා කරන්නන්ට විශාල ප්‍රශ්ණයක් මතු වෙනවා. ඒ සඳහා ලාම්පුවක් යොදා ආවරණය කිරීම මගින් ගැටළුව මගහරවා ගන්න පුළුවන්. එතන තියෙන කඩ කාමර රාත්‍රී 8.00 වන තෙක් ඇරලා තියෙන නිසා කාන්තාවන් වුනත් තනිව ගමන් නොකරන නිසා පිටුපසට දොර දැමීම ගැටළුවක් නොවේ. ඒ නිසා ඉදිරිපසින් දොර විවෘත කලොත් විශාල ගැටළුවකට මුහුණ දෙන බැවින් පිටුපසින් දොර විවෘත කරන ලෙස දැඩි ඕනෑකමින් ඉල්ලා සිටිනවා. කළිනුත් වැසිකිලිය අළුත්වැඩියා කර සභාවෙන් දාන්න හදන ද්‍රවිඩ පුද්ගලයම පෙර අවස්ථාවේදීත් දැම්මා . ඒත් එය අසාර්ථක වුණා. අපි පිටුපසින් දොරක් දාලා ඒ ආකාරයට ක්‍රියාත්මක කරමු. ඇයි ඔබතුමන්ලාට ඒක කරන්න බැරි. ඒ සම්බන්ධව ජනතාවගේ දැඩි ඉල්ලීම් තියෙනවා. නැවත තියෙන ආකාරයටම එය අළුත්වැඩියා කලොත් අපි එයට විරුද්ධ වෙනවා. ජනතාවට යම් ගැටළුවක් ඒ මගින් එන නිසා අපි ඔවුන් වෙනුවෙන් පෙනී සිටිනවා. අපි මෙච්චර කලක් ඔබතුමන් සමග එකගතාවයෙන් මේ ගමන ආවා. ඉදිරියටත් එහෙමයි. ඒ වගේම මාපලගම සිරිසුනන්ද විද්‍යාලයෙන් ඉල්ලීමක් ආවා. ළමුන් 2500 ක් පමණ පාසලේ ඉගෙන ගන්නවා. වර්ෂාව වෙලාවෙදි දැඩි ලෙස අබලන් වූ වැටි මාර්ගයකට කැටගල ටිකක් අල්ලන්න අවශ්‍ය නිසා කැටගල් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරලා තිබුනේ. පසුගිය සභාව තියෙන කාලයේ

හේමචන්ද්‍ර විලේගේ සභාපතිතුමන් ට්‍රැක්ටර් 6 කින් එතන තියෙන කැටගල් අරගෙන ගියා. මම තමයි එතනදි විරුද්ධ වුනේ. ඒ වුනාට තවම

ඒක ප්‍රශ්ණයක් වුනේ නැහැ. උප කාර්යාලයේ තියෙනවද කියලා දන්නෙ නැහැ. සභාවෙ ට්‍රැක්ටරයෙන් ගමන් 6 ක් අරගෙන ගියා.

මහා මාර්ග අධිකාරියේ කවුරුවත් විරුද්ධ වුනේ නැහැ. මම පොලීසියෙ OIC මහත්තයා ගාවට ගිහිල්ලයි නවත්ත ගත්තෙ . ඒ නිසා ඉස්කෝලෙට කැටගල් ටිකක් දෙන්න. ඒක මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියෙ බූදලයක් නෙවෙයි. රජයේ ෂල්ලිනෙ ඒ නිසා ඔබතුමන්ට ඒ ඉල්ලීමට කටයුතු කරන්න පුළුවන්. සභාපතිතුමා හැටියට ඔබතුමා කෙලින් තීරණයක් ගන්න. ගෙදර ගිනියනවනම් ඉස්කෝලෙට දුන්නම මොකුත් වෙනවද.

මුලන වාඩියකන්ද මාර්ගයේකොළඹ ගෙදර ආසන්නයේ නන්දසේන මහතාගේ නිවස ඉදිරියෙන් පසුගිය වර්ෂා කාලයේදී පාර යටින් හොදගෙන ගිහින් තියෙනවා. බෝක්කුව තුළ හෝදාගෙන ගිය ලොකු කවුළුවක් පවතිනවා. මේක සභාවට අයිති පාරක්. කොයි වෙලාවෙ හරි කොන්ක්‍රීට් එක කඩාගෙන යනවා. ඒ නිසා මේ පිළිබද පරීක්ෂණයක් සිදු කර ඒ සදහා කල හැකි දෙයක් තියෙනවානම් ඉටු කරන ලෙස මම ඉල්ලාසිටිනවා.

තල්ගස්වල පොළ පිළිබදව කතා කිරීමට බොහොම කණගාටුයි. ඒ සම්බන්ධව විශාල වශයෙන් කතා කිරීමට මම බලාපොරොත්තු වෙනවා. බොහෝ මන්ත්‍රීවරු මේ ගැන කතා කළා. මම පසුගිය දිනක පොළ කර ගෙන යන බදු කරු සමග තපාළේ පිටුපස පැත්තට ගියා. එහි වැසිකිළි පද්ධතියේ මොකුත් නැහැ. මිනිස්සු ඒවා ඔක්කොම ගලවගෙන ගිහින්. සභාවට වැඩි ආදායමක් ලබා දෙන්නෙ තල්ගස්වල පොළෙන් නමුත් මෙහි නඩත්තුවටවත්ල පොළේ කිසිදු සංවර්ධනයකටවත් නාගොඩ සභාවෙන් අවධානය යොමු කරලා නැහැ. ඇත්තටම සුසන්ත මන්ත්‍රීතුමනි මම ඔබතුමාට ගරු කරනවා. පසුගිය ආණ්ඩුවෙන් කරන ලද අසාර්ථක ව්‍යාපෘති හින්දා තමයි අපි අද අපහසුතාවයට පත් වෙලා තියෙන්නේ. ඔබතුමන් පිළිගන්නෙ නැහැ. ඒවා පසුගිය ආණ්ඩුවෙ අසාර්ථක ව්‍යාපෘති කියලා අපි ඔය පොළවල් කොන්ත්‍රාත් කරන කොට ඒවට කතා කළා. ඔබතුමන් එතකොට හිටියා.

අපේ ධර්මසිරි මන්ත්‍රීතුමන් මහින්ද රාජපක්ෂ මැතිදුන්ට බනින්න එපා කියලා ප්‍රකාශ කළා. අද ඔබතුමන්ලා සතුටු වෙන්න ඕන අද සභාව පවතින්නෙ වෙනත් තලයක වුවත් ලක්ෂ 70 ඔබතුමන්ලාට එවලා තියෙනවා. එහෙනම් මුදල් නොඑවන්න තිබුණා. අද සභාවට සල්ලි ගලාගෙන එනවා. දේශපාලන මතිමතාන්තර මොනවා වුනත් රනිල් වික්‍රමසිංහ මැතිතුමයි අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමයි සල්ලි එවලා තියෙනවා. ඉදිරියේදීත් ඔබතුමන්ලා යෝජනා ගේන්න. ඒ ඕනදේකට මුදල් එවයි. මන්ත්‍රීවරු 27 දෙනෙකුගේ යෝජනා වක් ඇති වෙනවා.

සියළු යෝජනා අරගෙන දැන් වැඩ කරන්න පුළුවන් ගරු සභාපතිතුමනි තව අවුරුද්දක් පමණ වන විට මේ පළාතෙ ගම් පෙරළියත් ඇති කරන්න පුළුවන් ඒ ගම් පෙරලිය තමයි දැන් ඇතිවෙමින් යන්නෙ ගම්පෙරලිය ඇති වන විට මේ කොට්ඨාශයේ සියළු අඩුපාඩු සම්පූර්ණ කර ගත හැකි බව ප්‍රකාශ කරමින් මම නිහඩ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අද දීර්ඝ වශයෙන් මන්ත්‍රීවරුන් ගරු සභාවේදී සාකච්ඡා කළා. අපි කොට්ඨාශ මට්ටමින් යම් වැඩපිළිවෙලක් හදලා මෙහි සිටින සියළුම නිලධාරීන් කොට්ඨාශවලට මන්ත්‍රීවරුන් සමග බෙදලා මේ කටයුතු ආරම්භ කරමු කියලා ගෞරවණීය මතක් කිරීම පළමුවෙන්ම කරනවා.

දකුණු පලාතේ ඉතා දරුණු උණ වසංගත රෝගයක් පැතිර යනවා. පසුගිය වකවානුව තුළ හා මේ වන විටත් එය ක්‍රියාත්මක වෙනවා. මේ හේතුවෙන් දරුවන් විශාල පිරිසක් මියගියා. රජයේ රෝහලට ඒ සදහා පවතින එන්නත් ලබා ගැනීමට නොහැකි වුනත් සෑම ෆාමසියකම එම ප්‍රතිශක්තිකරණ එන්නත මුදල් ගෙවා ලබා ගැනීමේ හැකියාව පවතිනවා. ඒක ඉතාම කණගාටුදායක තත්වයක්. ඒ නිසා එම තත්වය වෙනුවෙන් අපගේ බලවත් කණගාටුව මේ වෙලාවේ ප්‍රකාශ කර සිටිනවා. අද ඊයේ ඒ සදහා ක්‍රියාමාර්ග ගත්තද දන්නෙ නැහැ. සියල්ලම සිදුවුනාට පසුව තමයි එය නිවැරදි වෙලා තියෙන්නේ. ඒ ක්‍රියාව සම්බන්ධව අපේ බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා.

අලුත් මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් මේ සභාවේ ඉන්නවා. සභාව තුලටම පැමිණියත් එම මන්ත්‍රීවරු සදහා පළාත් පාලන කොමසාරිස් තුමන් නිකුත් කරන නියමිත හැදුනුම්පතක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරලා නැහැ. ඒ නිසා ඒ හැදුනුම්පත ලබා දීමට අවශ්‍ය කටයුතු ඉතා කඩිනමින් සිදු කර ඔවුන්ගේ අන්‍යන්‍යතාවය හෙළි කර ගැනීමට එය ඉදිරිපත් කිරීමට අවශ්‍ය පහසුකම් සළසා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

ඉනෝකා මන්ත්‍රීතුමිය ප්‍රකාශ කල ආකාරයට පසුගිය දිනවල මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා සභාවේ වාහනයෙන්ම තියෙන කසල පාරට ගෙනත් දාන්න, කුණු එකතු කර ගෙන යන බව පවසමින් ජනතාව දැනුවත් කරමින් ප්‍රචාරණයක් කරගෙන ගියා ඒ පිළිබදව ගරු සභාපතිතුමන් සහ ලේකම්තුමියට මම කිහිප වරක් දැනුවත් කළා. සමහර විට මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් සභාවේ වැඩ පිළිවෙල පිළිබද දැනුවත් නැතුව ඇති එසේ සිදු කිරීමේදී ඔවුන් දැනුවත් කර ඒ සදහා යම් වැඩපිළිවෙලක් ඇති කරන ලෙස මම සභාපතිතුමන්ට ප්‍රකාශ කර සිටිනවා. මේ වන විට ඉතා විශාල කුණු ප්‍රමාණයක් පාරවල් අයින්වල පවතිනවා. ඒ සදහා යම් වැඩ පිළිවෙලක් හදලා එය කළා නම් එසේ කුණු ගොඩ වන්නේ නැහැ.

ඒ වගේම ශ්‍රී රාහුල පෙර පාසලේ සහය පාලිකාව ලිපියක් මගින් ඉල්ලීමක් ඉදිරිපත් කළා. ඇය සෑහෙන කාලයක් තිස්සේ පෙර පාසලෙහි සේවය කරන අතර ඇය කොන්ත්‍රාත් පදනම මත සේවයට බදවා ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා.

උඩවැලිවිටිය ගමේ අපේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සංවර්ධන කටයුතු අපි සිදු කරන්න ඕන. ඒ පිළිබද කිසිම භේදයක් නැහැ. පළාත් පාලන පනත අනුවත් අපි පත්වෙලා ඉන්නෙ ජනතාවට සේවය කරන්න. උඩවැලිවිටය ප්‍රදේශයේ පවතින එකම රජයේ ඉඩම තමයි මේ. අපේ තැපැල් කන්තෙතා්රුව තවම පවතින්නෙන් පෞද්ගලික ස්ථානයක් ඒ වගේම පුස්තකාල පහසුකමත් අපට ඒ ගමේ කොහේවත් නැහැ. ඉදිකිරීමට ඉඩමකුත් නැහැ. ඒ වගේම පාසල් භූමිය ඇරුණම රැස්වීමක් පැවැත්වීමට කිසිම ඉඩමක් උඩවැලිවිටිතලාව ප්‍රදේශයේ නැහැ. සංවර්ධන කමිටුවේදීත් මේ පිළිබදව කතා කළා. රජයේ කුමන හෝ වැඩ පිළිවෙලක් පවතිනවා. කුමක්ද කියා මා දන්නේ නැහැ. මේ ඉඩම දැනටමත් වෙන් කරලා තියෙන්නෙ. උඩවැලිවිටිය මහා විද්‍යාලයට වෙන් කරපු ඉඩම හැටියට තමයි මෙය තියෙන්නෙ. ඒ සම්බන්ධව විද්‍යාලයේ ලොග් සටහනක් පමණයි පවතින්නේ. මෙහි අයිතිය තියෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමියට. අපි ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් ප්‍රාදේශීය සංවර්ධන කමිටුවෙදි ඉල්ලීමක් කළා. අපිට අක්කර 01 ක ප්‍රමාණයක් මේ ප්‍රාදේශීය සභාවට පවරා දෙන්න කියලා ඉල්ලීමක් කළා.

අප ගරු සභාපතිතුමාගෙනුත් ප්‍රාදේශීය ලේකම්තුමියගෙනුත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී අපට අක්කරයක භූමි ප්‍රමාණයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියා. ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලෙස ඉල්ලා සිටියා. අඩුම තරමින් මධ්‍යම බෙහෙත් ශාලාවක් හෝ නිලධාරීන් සියල්ල එක තැන සිටින සේවා පියසක් නිර්මාණය කර ගැනීම සදහා. තැපැල් කන්තෝරුව සියළු රාජ්‍ය ආයතන කිසිම එකක් සදහා ඉඩම් කොටසක් මේ වන විට මේ ප්‍රදේශයේ බිහිවෙලා නැහැ. සභාපතිතුමාගේ අත්සනින් යුතු ඉඩම් කොටසක් පවරා දෙන්න. මේ සදහා ලේකම්තුමිය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා. නාගොඩ ප්‍රදේශීය කොට්ඨාශයට අනතුරුදායක යෝජනාවක් ගැන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා වුණා. මා ඒ අවස්ථාවේදී තමයි ඒ පිළිබද දැනුවත් වුනේ. සියළුම අවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල සදහා අවශ්‍ය ඉඩම් තොරා ගැනීම සිදු කරන්නේ අපේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඉඩම්වලින් අපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පෝෂක කොට්ඨාශයක් ලෙස තොරා ගෙන අනිත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ඉඩම් නැති අයට ඉඩම් අපේ කොට්ඨාශයෙන් ලබා දෙන්න බලාපොරොත්තු වෙන්නේ. ඉඩම් නැති අයට ලාංකික පුද්ගලයන් ලෙස ලංකාවේ ඕනෑම ස්ථානයක ජීවත් වීමේ අයිතිය තියෙනවා. ඒකෙ ප්‍රශ්ණයක් නැහැ. නමුත් අපි අපේ නාගොඩ ප්‍රදේශවාසීන්ට ඉඩම් ලබා දීමෙන් අනතුරුව තමයි පිට ප්‍රදේශවල ජනතාවට ඉඩම් ලබා දිය යුතුයි කියලා මම විශ්වාස කරනවා. ඒක මම අනතුරක් ලෙස දුටුවා. ඒ ගැන මම වැඩිදුරට සාකච්ඡා කරන්නේ නැහැ. ජාතික අවශ්‍යතාවයන් යුතුකමක් ලෙස ඒ කාර්‍යය සදහා අපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවතින රජයේ ඉඩම් ටික බෙදා දීම සුදුසු නැහැ. ඇත්තටම එසේ වුනොත් නාගොඩ ප්‍රදේශයේ වැසිකිලියක්වත් සාදා ගැනීමට තැනක් නැහැ. ඒ වගේම තලාව ප්‍රදේශයේ පවතින ඉඩමත්, අනිත් ප්‍රදේශයේ පවතින ඉඩනුත් මේ ආකාරයෙන් අත්තනෝමතික ආකාරයෙන් පිරිස් අතර බෙදා දීම සිදු කල හොත් ඉදිරියේදී බොහෝ භයානක තත්වයක් නිර්මාණය වෙන්න පුළුවන්. ඒ නිසා උඩවැලිවිටය එම ඉඩමෙන් අක්කරයක

ප්‍රමාණයක් සංවර්ධන කටයුතු සඳහා යොදවා ගැනීමට පවරා ගැනීමට ගරු මන්ත්‍රීවරුන්ගේ හා සභාවේ ඒකමතික එකගතාවය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. පොදු කටයුතු සඳහා එය යොදා ගත හැකි නිසා එම යෝජනාව ඉටු කර දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගිය සභාවෙදිත් මා පවසන ලද කරුණක් වන බල ප්‍රදේශයේ පවතින මාර්ග හඳුනාගෙන ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය තවම ආරම්භ කර නැහැ. මේ දිනවල මැනීම් කටයුතු සිදු කර නියම ආකාරයෙන් මාර්ගයන්හි ප්‍රමාණයන් ලකුණු කරනවා. මේ පාරවල්වල ප්‍රමාණයන් නියම ආකාරයෙන් පෙන්වා දීමට එම පාරවල් ගැසට් කර තිබුනොත් අනවසර ඉදිකිරීම් කරන අවස්ථාවන්හිදී ඒවා තහනම් කරන්න පුළුවන්. අපේ පාරවල් ප්‍රාදේශීය සභාවට පවරා නොගැනීම නිසා අනාගතයේදී මහත් ගැටළුවලට මුහුණ දෙන්න පුළුවන්. අපි අදටත් මේ පාරවල් සම්බන්ධ නඩු වලට යනවා. මේ පාරවල් පවරා නොගැනීම නිසා නඩුවලදී අපි අසරණ වෙනවා. ඒ නිසා හැකි ඉක්මණින් මේ පාරවල් සභාවට පවරා ගැනීමට කටයුතු කරන මෙන් මම ගරු සභාපතිතුමාගෙන් හා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.

අපි මේ මන්ත්‍රීවරුන් සියළුම දෙනාම අපේ ජීවිතයේ කටයුතු පසෙකලා තමයි මේ සභාවේ රාජකාරිවල නිරත වී ඉන්නේ. ඒ නිසා මේ ගෞරවයෙන් ලැබෙන දීමනාව පිළිබඳව දිගින් දිගටම විවේචනය කරන්න එපා. අපට විශාල කාර්යභාරයක් පැවරී තියෙනවා. පක්ෂ භේදයකින් තොරව ගත්තොත් සියළුම නායකයන්ගේ කාර්යයන් ඉටු කරන්න පැවරී තියෙන්නේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට. ඒ නිසා මන්ත්‍රීවරුන්ට ලොකු කාර්යභාරයක් පැවරී තියෙනවා.

මේ ප්‍රාදේශීය සභාවේ ආදායම අඩු වුනත්, විශාල මන්ත්‍රීවරු පිරිසක් මෙහි සිටිනවා. මේ ආණ්ඩුවත් එක්ක සෘජුවම සම්බන්ධ 14 ක් ඉන්නවා. මේ රජයෙන් ලබා ගත හැකි උපරිම ශක්තිය අරගෙන ප්‍රාදේශීය සභාවේ මුදල් නැති වුනත්, ඔබගේ ශක්තියෙන් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සළස්වන්න. ඒ වගේම අපේ පස්වන අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පාලනය කරන කාලයේ තාක්ෂන නිලධාරීන් ඇස්තමේන්තු කර ගත නොහැකි අති විශාල මුදල් ප්‍රමාණයක් සභාවට පමණක් නොමෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් ගෙනවිත් විශාල වැඩ කොටසක් කළා. ඇත්තටම එතුමන් කල සේවාව ඉතාම සුවිශේෂයි. ඒ කාර්යය භාරය මම නැවතත් සිහිපත් කරනවා.

උඩවැලිවිටිය ප්‍රජා ශාලාව සම්බන්ධ යම් පිළිතුරක් ලැබිලා තිබුණා. ඒ ඉඩමේ තොරතුරු අපි සතුව පවතින අතර එය ඉදිරිපත් කිරීමට හැකියාව පවතිනවා. අජිත් එඩ්රිංආරච්චි සභාපතිතුමන් සිටින කාලයේ සභා අරමුදලින් රු. 35000.00 ක් වැය කරලා තමයි ඒ ඉඩමේ මැණුම් කටයුතු සිදු කළේ. එවකට සිටි ප්‍රාදේශීය ලේකම්තුමන් වන ලීලානන්ද මහතා අපට එවන ලද ලිපියේ පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස සඳහන් වෙනවා.

උඩවැලිවිටිය ප්‍රදේශයට පෙර පාසලක් නැහැ. ඒ සම්බන්ධව මට යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. අපට තියෙන්නේ ගම්මැද්දේගොඩ පෙර පාසලයි. අපේ ගමේ දරුවන් කැප්පිටියගොඩටත්, බුදපනාගමටත්, රෑකඩහේන ප්‍රදේශයේ පෙර පාසල් සඳහා තමයි යන්නේ. ඒ නිසා ප්‍රජා ශාලාව තුළ පෙර පාසලක් ඇති කර දෙන ලෙස ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී විපිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලෙන් අවසරයි. මම හිතන ආකාරයට දීර්ඝ වශයෙන් කතා කිරීම අවශ්‍ය නැහැ. වැඩියෙන් යෝජනා ඉදිරිපත් කර වාර්තා පුරවා වැඩක් නැහැ. ඉදිරිපත් කල යෝජනා ක්‍රියාත්මක කර ගත හැකි නම් දැනට යෝජන ඉදිරිපත් කිරීම හොඳටම ප්‍රමාණවත් බව මගේ අදහසයි.

ගිය සභා වාරයේදී මම ඔබතුමන්ට වීථි ලාම්පු පිළිබඳ යෝජනා ඉදිරිපත් කළා. මෙය පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියළුම මන්ත්‍රීවරුන්ට තියෙන ප්‍රශ්ණයක්. ඒ සියළුම මන්ත්‍රීවරුන් වීථි ලාම්පු ගැන කතා කළා. අනතුරුදායක ස්ථානවල වීථි ලාම්පු සවි කර ගන්න සිංහල අවුරුද්දටත් බැරි වුණා, වෙසක් පෝයටත් බැරි වුණා. එන පොසොන් පොහොයටවත් ප්‍රධාන ස්ථානවල වීති ලාම්පු සවි කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. සභාපතිතුමනි ඔබතුමා වීථි පහන් සවි කරන්න කියලා ඔබතුමා කාර්මික නිලධාරි මහතා එවනවා. නමුත් ඔහු දිනකට වීථි ලාම්පු කීයක් සවි කරනවාද කියා සොයා බලන්නේ නැහැ. දිනකට 10 ක් සවි කිරීමට නියමිත වුනත් අපේ ප්‍රදේශයේ එක වීථි පහනක් සවි කර ගියා. මේ නිසා කොන්ත්‍රාත් පදනම යටතේ හෝ කාර්මික නිලධාරියෙකු ගෙන ප්‍රදේශයේ ප්‍රධාන ගැටළුවක් වන වීථි ලාම්පු සවි කිරීම විධිමත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම කටුපොල් ප්‍රශ්ණය ගැන අපේ තරංග සුදර්ශන මන්ත්‍රීතුමා, උප සභාපති ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා කතා කළා. එතුමන්ලා දක්වන ලද අදහස්වලට මමත් එකග වෙනවා. එය අනුමත කරනවා. අප ප්‍රදේශයේ කටුපොල් වගා කිරීම සම්පූර්ණයෙන්ම නතර කර දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගවයන් අයාලේ යන ප්‍රශ්ණය ගැන කතා කලොත් නාගොඩ ප්‍රදේශයේදී ඊයේ රාත්‍රියේත් අයාලේ යන ගවයෙක් මගේ බයිසිකලයේ හැප්පීමට ගියා. මෙම ප්‍රශ්නය මුළු නාගොඩ ප්‍රදේශයටම දැඩි ප්‍රශ්ණයක් වන හෙයින් ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

අපේ වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමා ගම් පෙරළියක් ගැන කතා කළා. ඇත්තටම දැන් ගම් පෙරලියක් වෙලා ඉවරයි. ඒ ගැන කතා කරන්න දෙයක් නැහැ.

ඒ වගේම අපේ ධනංජය විලේගේ මන්ත්‍රීතුමන්ගේ සහොදර කළන විලේගේ සහෝදරයාගේ අභාවය පිළිබඳව අප සියළු දෙනාගේම ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

ඒ වගේම අපි ඉදිරිපත් කල යෝජනා පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. එමෙන්ම ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන්ට ජනතාවට සේවය කරන්න බලය ලැබුණා. ඒ වගේම ප්‍රභාකරන්ටත් බලය තිබුණා. මහින්ද මහත්තයා එතුමන්ගේ බලය උපයෝගී කර ගනිමින් ප්‍රභාකන්ගේ සුජාත නොවන අවජාතක බලය විනාශ කර දැමුවා. එතුමාට එම ශක්තිය තිබුණා. සභාපතිතුමනි, ඔබතුමාටත් ජනතාවගේ බලය තියෙනවා. ක්‍රියාත්මක කරන්න. ඒ නිසා

තමුන්නාන්සේලාට ලැබුණු බලතල ප්‍රයෝජනයට අරගෙන සභාපති ලෙස සභාවේ වැඩ කටයුතු කරවන්නැයි ඉල්ලමින් සැමට සුභ අනාගතයක් පතමින් මම නිහඩ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන්ද, ලේකම්තුමියගෙන්ද, ජනමාධ්‍ය මහතාගෙන්ද අවසරයි.

ඒ වගේම හිටපු සභාපති හේමචන්ද්‍ර විලේගේ මැතිතුමන්ගේ පුත්, අමර ධනංජය මන්ත්‍රීතුමන්ගේ සහෝදර කලන විලේගේ මහතාගේ අභාවය පිළිබදව අපේ බලවත් ශෝකය මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා. අවමංගල්‍ය අවස්ථාවට සභාව නියෝජනය කරමින් අපි සියළු දෙනාම සහභාගී වු අතර මන්ත්‍රීවරු 27 දෙනාම අපිට ලබා දිය හැකි උපරිම සහයෝගය ලබා දුන්නා. ඒ පිළිබදව මම නැවත වරක් අපේ බලවත් ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

ඒ වගේම මේ වෙන කොට අවසන් කටයුතු සිදු කරනු ලබන කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ උපසභාපතිතුමන් නොහික්මුනු අයගේ වෙඩි පහරින් හදිසියේම ජීවිතක්ෂයට පත් වුණා. එතුමා වෙනුවෙනුත් අපි අපගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා. එම ශෝකී පණිවිඩය කරන්දෙණිය ප්‍රාදේශීය සභාව වෙත දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලය අද දින පැමිණ මේ සභාව පවත්වා ගෙන යාමට සහයෝගය ලබා දුන්නා. ඔබතුමන්ලා කියන දේ වලට මම සවන් දුන්නා. අපි සභාව පටන් ගත්තේ අප්‍රේල් 04 වෙනිදා, එදා සිට අද දක්වා සභා වාර 03 ක් එනම් මාස 03 ක කාලයක් ගත වුණා. එම මාස තුනක කාලය තුළ අපට ශක්‍රදේවේන්ද්‍රයා වගේ වැඩ කරන්න බැහැ. අවුරුදු 03 ක කාලයක් පුරාවට දේශපාලන ශක්තියක් නොමැතිව සභාව පවත්වා ගෙන ගියා. ඒ කාලය තුළ ඉල්ලීම් හා යෝජනා විශාල වශයෙන් ආවේ නැහැ. නමුත් ලැබිය යුතු මූල්‍ය ප්‍රතිපාදන ලැබෙනවා. එම මූල්‍ය ප්‍රතිපාදන වලින් බලපෑමකින් තොරව කටයුතු කිරීමට හැකිවෙනවා. වර්තමානයේ මන්ත්‍රීවරුන් 13 දෙනා 27 දෙනෙක් බවට පත් වුනා. 27 දෙනාගේ ප්‍රශ්න , ඉල්ලීම් හා යෝජනා වැඩියි. ඒවාට ඇහුන්කන් දිය යුතුයි. ලක්ෂ 70 ක් ලැබුනත්, මම මේක වියදම් නොකර ඉන්නෙ ගෙදර ගෙනියන්න නෙමෙයි. මේ මුදල් අයතා ලෙස පරිහරණය කලොත් අවශ්‍ය දේට මුදල් ප්‍රමාණවත් නැතැයි පවසා ඔබතුමන්ලාම මට දෝෂාරෝපණය කරාවි. මම මෙතෙන්ට පත්වෙලා ආවේ යම් දෙයක් කිරීමේ අරමුණින් පසුගිය කාලයේ සිදුවීම් දෙස බැලුවම අපට විවිධ කාලීනව ඇතිවන අවස්ථාවන්ට මුහුණ දෙන්න සිදු වුනා. අපි වැඩ භාර ගැනීමෙන් පසුව සිංහළ අලුත් අවුරුද්ද, වෙසක් උත්සවය, මැයි දින, ගංවතුරු උවදුරු වගේ අවස්ථාවන්ට මුහුණ දෙන්න සිදු වුණා. ඒ නිසා අපේ වැඩ ගොඩගැසුනා. මන්ත්‍රීවරුන්ගේ විශාල බලපෑමක් ඇති වෙලා තියෙන්නෙ වීථි ලාම්පු සවි කර ගැනීම පිළිබදවයි. අපි අපේ විදුලි කාර්මික ලෙස්ලි මහතාට තම රාජකාරිය නිසි ලෙස ඉටු නොකරන බව පවසමින් නිතර දොස් නගනවා. නමුත් විදුළි කාර්මික ශිල්පී හැටියට ඉතා අවධානම් රැකියාවක් කරනවා. ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල ආකාරයට උදව් කරන්න ගිහින් ඔහුටත් විදුලි සැර වැදුනු බව පැවසුවා. බල ප්‍රදේශයේ සියළුම වීථි පහන් සවි කිරීමට ඉන්නෙ එක කාර්මික ශිල්පියයි. පසුගිය දිනවල පැවති වර්ෂාව නිසා ඔහුට එම කාර්යය නිසි ලෙස ඉටු කර ගන්න බැරි වුණා. මන්ත්‍රීවරුන් මට දොස් නගද්දී මම විදුළි කාර්මික මහතාට දොස් නගනවා. ඔහු කරන්නෙ අවධානම් රැකියාවක් ඒ නිසා මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධව දැනුවත් වෙන්න. අපි ඔහුට වීථි පහන් 10 ක් සවි කරන්න භාර දෙනවා. ඔහු වීථි පහන් සවි කර නැවත පැමිණෙන අතර මම ඔහුගේ පිටුපසින් ඒවා අධීක්ෂණය කිරීමට යන්නෙ නැහැ. සභාව තුළ වීථි පහන් සවි කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වූ අතර එම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේදී ගැටළුවලට මුහුණ දුන්නා. එහිදී වීථි පහන් දැමීමේ ප්‍රමාදයක් සිදු වුණා. උදාහරණයක් ලෙස අද යටලමත්තට ගියොත් නැවත යටලමත්තට එන්නේ සති 2 කින් විතර නමුත් මන්ත්‍රීවරුන් ඒ ක්‍රමය පිළිබද

පැහැදීමක් නොදක්වපු නිසා වර්තමානයේ කොට්ඨාශ 15 ට වීථි පහන් සවි කිරීමට ක්‍රමවේදය නැවත සකස් කළා. මාපලගම , කැප්පිටියගොඩ, පරණතානායම්ගොඩ, උනන්විටිය, ගෝණදෙනිය, ඌරල, යටලමත්ත, ගම්මැද්දෙගොඩ, උඩලමත්ත, උඩුගම මලාමුර, අලුත්වත්ත, උඩවැලිවිට්තලාව, හෝමදොල, නාගොඩ, යන ප්‍රදේශවලට යන ආකාරයට ක්‍රමවේදයක් සකස් කළා. දැන් එම ක්‍රමය ක්‍රියාත්මක වෙනවා. අද උනන්විටිය ප්‍රදේශයට ගියා. අද මන්ත්‍රීතුමන් නැති නිසා එම ස්ථානයට යාමට නොහැකි ලෙස ප්‍රකාශ කරත් නැවත උනන්විටියට පැමිණෙන්නේ අනුපිළිවෙලට බැවින් ඒ සඳහා කාලයක් ගත වන නිසා මන්ත්‍රීතුමන්ගේ නියෝජිතයකු සමග අදාළ කටයුතු කරන ලෙස උපදෙස් දුන්නා. කරුණාකර ගරු මන්ත්‍රීවරුන් මේ ක්‍රමවේදයට අනුව වීථි පහන් සවි කර ගැනීමට කටයුතු කරන්න. විජිත් සහබන්දු මන්ත්‍රීතුමා ප්‍රකාශ කලා වෙසක් උත්සවයට ලයිට් හදාගන්න බැරි වුනා කියලා නමුත් වෙසක් උත්සවයට සියළුම පන්සල්වල ලයිට් සාදා දුන්නා. 2018/04/09 වන දින සිට 2018/06/04 දක්වා ඌරල, යටලමත්ත, උඩවැලිවිට්තලාව, තල්ගස්වල, මාපලගම, ගෝණදෙනිය, ගෝණලගොඩ, මලාමුර , උක්ඹිවිට, උඩුගම ආදී ප්‍රදේශවල වීථි පහන් සවි කිරීමට ගොස් ඇති බව ලේඛනවලින් තහවුරු වෙනවා. මම කුහක දේශපාලඥයෙක් නෙමෙයි. මට මන්ත්‍රීවරු සියළු දෙනාම එක හා සමානයි. මෙය එදා සිට පැමිණි ක්‍රමවේදයක්. එක්සත් ජාතික පක්ෂයේ අය හිටියොත් ඔවුන්ගේ කර ගන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය හිටියොත් ඒ අය කර ගන්නවා. ඒක තමයි සත්‍ය තත්වය. කොට්ඨාශ 15 ට මන්ත්‍රීවරු 15 දෙනෙක් ඉන්නවා. අපිට ඒ මන්ත්‍රීවරු ප්‍රධාන කර ගන්න වෙනවා. හැබැයි අනිත් මන්ත්‍රීවරු 12 දෙනා මම අතහරින්නේ නැහැ. මට මේ 27 දෙනාම සහෝදරයන් වගේ. මම කවුරුත් අපහසුතාවයට පත්වන්න ඉඩ තියන්නේ නැහැ.

ඔබතුමන් මූලාසනයේ ඉන්න විට අනිත් හැමෝටම එක හා සමානව කටයුතු කිරීම ඔබතුමන් විසින් කල යුතුයි යන්න රංජිත ජයවීර මන්ත්‍රීතුමාත් චන්ද්‍රා සහබන්දු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කරන ලදී. අනෙක් සියළුම මන්ත්‍රීවරුන් සභාපතිතුමන් ලෙස එවැනි ප්‍රකාශයක් බලාපොරොත්තු නොවූ බවත් ඔවුන් ප්‍රකාශ කරන ලදී.

අපි 12 දෙනාගේ සහයෝගය නැතිව ඔබතුමන්ට මේක කරගෙන යන්න බැහැ. ඉතිහාසයේ එවැනි දේ සිදු වූ බවත් තරංග සුදර්ශන මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ලදී. 9 දෙනා සහ 4 දෙනා ඉදිද්දී අපි එක හා සමාන වූ බවද එතුමන් ප්‍රකාශ කරන ලදී.

ඒ වගේම චන්ද්‍රා සහබන්දු මහතා ප්‍රකාශ කල ආකාරය කොස් ගහේ අත්ත වැටුණු එක ඇස්තමේන්තු කිරීමට තාක්ෂණ නිලධාරී මහතා ගිය අතර එම කටයුතු සිදු කරමින් පවතිනවා. ඇත්තටම එම ගස කැපීම අපේ වගකීමක්. ඒ නිසා තාක්ෂණ නිලධාරී මහතා එම කටයුතු කර ගෙන යනවා.

කුණු එකතු කිරීම මේ දිනවල විධිමත් ආකාරයට සිදුවනවා. ඇප්තොප්වත්තේ පොහොර පිළිබඳව වෙරංග ලක්මාල් මන්ත්‍රීතුමා ප්‍රකාශයට පත් කළා. ඉදිරියේදී ඒ සම්බන්ධ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට නියමිත වෙනවා.

ඒ වගේම ගරු මන්ත්‍රීනී අරුණ ශාන්ති මහත්මිය පොළවල් පිළිබඳව කතා කළා. පොළවල් ගැන කතා කරද්දී අපි පොළවල් සංවර්ධනයට අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර එය අනුමැතියට ඉදිරිපත් කර තියෙනවා. නමුත් තවම ඒ සම්බන්ධව අනුමැතිය ලැබිලා නැහැ. ඒ නිසා ඉදිරියේදී එම කටයුතු සිදු කිරීමේ හැකියාව පවතිනවා.
ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා සිලින්ඩර් ලබා දෙන ලෙස ඉල්ලීම් කළා. ලක්ෂ 70 ක් අපට ලැබුණු අවස්ථවේදී මන්ත්‍රීවරුන්ටත් යම් ප්‍රතිපාදනයක් වෙන් කල යුතුයි. කොට්ඨාශ 15 කට බෙදිලා එම ගම්මාන 15 ට බැකෝ පැය 15 බැගින් ලබා දීමට මම බලාපොරොත්තු වෙනවා.

ඔබතුමන්ලා වැඩ කලේ නැහැ කියා ප්‍රකාශ කලාට පසුගිය දිනවල ගංවතුර අවස්ථාවේදී අපි ළිං 100 කට එහා ප්‍රමාණයක් ඉසීම සිදු කළා. ඒ වගේම වතුර බවුසරය ලබා දී ජල පහසුකම් ලබා දුන්නා.

ඇත්තටම අපි මුලින්ම තීරණය කර ගත්තා මන්ත්‍රීවරුන් තම කොට්ඨාශය තුල ශ්‍රමදාන මට්ටමින් යම් කටයුත්තක් කරන අවස්ථාවලදී සභාවෙන් ලබා දිය හැකි සහයෝගය ලබා දෙන බවට පොරොන්දු වුණා. මන්ත්‍රීවරුන් දෙන්නෙක් තුන්දෙනෙක් ශ්‍රමදාන සංවිධානය කරලා තිබුණා. ඉදිරියේදී ශ්‍රමදාන සංවිධානය කර මන්ත්‍රීවරු යෝජනා ලබා දෙන්න. අපි ඒ සඳහා ප්‍රාදේශීය සභාවෙන් ලබා දිය හැකි උපරිම සහයෝගය ලබා දෙනවා.

ඒ වගේම ඇටගහවිල පාර සම්බන්ධව ගයාන් මධුසංඛ මන්ත්‍රීතුමා කතා කරද්දී ඇටගහවිල පාරත්, මාමනදොළ මාර්ගයේ පවතින ප්‍රශ්ණත් එක හා සමානයි. ඇටගහවිල පාරේ රබර් කොන්ත්‍රාත්කරුවන්ගේ බර වාහන ගමන් කිරීම නිසා මාර්ගය අබලන් තත්වයට පත් වෙලා. මාමනදොළ මාර්ගයත් එහෙමයි. ඇටගහවිල මාර්ගයේ බෝක්කුව කැඩිලා. පසුගිය දිනවල අපි කොන්ත්‍රාත් කරුවන් ලවා බෝක්කුව සාදා ගත්තා. ඉදිරියේදී ටොන් 10 ට වැඩි බර වාහන තහනම් ලෙස බෝඩ් ගැසීමට අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා ප්‍රකාශ කල ආකාරයට දිසානායක මාවතේ බෝඩ් ගැසීම අපි ඉතාම කඩිනමින් සිදු කරනවා. ඒ වගේම දිසානායක මාවතේ ගස පිළිබඳ අපිව දැනුවත් කරන්න.

ඒ වගේම ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ප්‍රකාශ කල ආකාරයට තම බල ප්‍රදේශයේ තමාට අයත් කොට්ඨාශයේ පවතින පාරවල් සහ සභාවට අයිති යම් දේපලක් පවතී නම් ඒ පිළිබඳව සභාවට තොරතුරු ඉදිරිපත් කරන ලෙස මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. එවිට අපට සභාව සතු දේපල පවරා ගැනීමට කටයුතු කරන්න පුළුවන්. තමාට අයත් කොට්ඨාශය තුල ප්‍රාදේශීය සභාව සතු වත්කම් සම්බන්ධව මන්ත්‍රීවරුන් දැනුවත් නිසා මේ කටයුත්ත ඉතා පහසුවෙන් සිදු කර ගත හැකි බව දන්වා සිටින අතර ඊට අවශය සහයෝගය ලබා දෙන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිනවා.

ඒ වගේම අපේ ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා ප්‍රකාශ කල ආකාරයට මාපලගම වෙළඳ සංකීර්ණයේ වැසිකිලිය සඳහා පෙර සිටම විශාල මුදලක් වැය වෙලා තියෙනවා. වැසිකිලි ප්‍රශ්නයට ප්‍රධානම හේතුව වුනේ එහා කඩේ හෝටලයක් පැවතීම හා හොටෙල් අයිතිකාරිය ප්‍රධාන වෙලා එය වැසීමට කටයුතු කිරීමයි. ඉදිරියේදී අලුත් වැසිකිලියක් සෑදීමට මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියෙන් කටයුතු කරන නිසා දැනට පවතින වැසිකිලිය පවතින තත්වයෙන්ම අළුත්වැඩියා කර පවත්වා ගෙන යාමටත්, එලෙස පවත්වා ගැනීම අපහසු නම් ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කල ආකාරයට පිටුපසින් දොර විවෘත කර පවත්වා ගෙන යාමටත්, ඉදිරි කටයුතු කරන බව ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, මාස 03 ක් වැනි කෙටි කාලයක් තුළ අපට විශාල දෙයක් කිරීමට අපහසුයි. මමත් ප්‍රාදේශීය සභාව තුල අවුරුදු 17 ක් පමණ නියෝජිතයෙක් ලෙස කටයුතු කරලා තියෙනවා. ඒ කාලය තුළ වාර්තා බැලුවොත් අපේ යෝජනා දහස් ගණනක් ඇති. නමුත් අපේ යෝජනා එකක් හෝ දෙකක් තමයි ඉටු වෙලා තියන්නෙ. ඇත්තටම යෝජනා ඉදිරිපත් කිරීම හොඳයි නමුත් ඉටු කර ගත හැක්කේ සුළු ප්‍රමාණයයි. වර්තමානයේ ඉසුරු දොඩංගොඩ මැතිතුමා පමණයි අපට ලක්ෂ 02 ක ප්‍රතිපාදනයන් එවලා තිබෙන්නේ. ඒ නිසා මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් තමන් දන්නා මන්ත්‍රීවරුන්ට කියලා ප්‍රතිපාදන ලැබීමට සලස්වන මෙන් ඉල්ලා සිටිනවා. එම ප්‍රතිපාදන ලබා ගැනීම තුල අපට පුළුවන් ඔබතුමන්ලාගේ යෝජනා ඉටු කරන්න.

ඒ වගේම මේ ප්‍රදේශයට දැඩි අවශ්‍යතාවයක්ව පවතින්නේ ආදාහනාගාරයක් ඉදි කිරීමයි. ඒ ජනතා කැමැත්ත අනුව ආදාහනාගාරයක් ඉදි කිරීමට බලාපොරොත්තු වන අතර ඊට අවශ්‍ය ඉඩම් ලබා

ගැනීමට කටයුතු කරන අතර ඊට අදාළ අමාත්‍යතුමන් හමු වී ඒ සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.
ඒ වගේ ප්‍රාදේශීය සභා ප්‍රධාන ගොඩනැගිල්ල ඔබතුමන්ලා ප්‍රකාශ කල ආකාරයට යම් වෙනසක් සිදු කර ගැනීමට බලාපොරොත්තු වෙනවා.
ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා ප්‍රකාශ කල ආකාරයට ඔබතුමන් මෙහි හිටපු සභාපතිතුමෙක්, ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරයෙක් 1991 සිට මේ සභාවල සිදු වූ කටයුතු පිළිබදව ඔබතුමන්ලා දන්නවා. 2003 ගංවතුරෙදි අපට ආධාර විශාල ලෙස ලැබුණා. නමුත් මේ වන විට ඒ භාණ්ඩ වල අස්ථාන ගතවීමක් තියෙනවා. එම භාණ්ඩ පිළිබදව උත්තර සැපයීමට දැන් කිසිවෙක් නැහැ. මේ අවස්ථාවේ ඒ භාණ්ඩ පිළිබද විස්තර ඇතුලත් වාර්තාවක් ඊළග සභාවට ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. අපි භාරගත්තු දින සිට එවැනි කටයුතු සිදු නොවීමට මම වග බලා ගන්නවා.
මගේ වචන ඉදිරිපත් කිරීම තුල යම් කිසි සිත රිදීමක් සිදු වුනා නම් ඒ පිළිබදව වරදවා හිතන්න එපා. ඔබතුමන්ලා මට විරුද්ධ නොවන බව මම දන්නවා. අද දින ධනංජය විලේගේ මන්ත්‍රීතුමන් හැර අනික සියළුම ගරු මන්ත්‍රීවරුන් පැමිණ සිටිනවා. අපි ධනංජය විලේගේ මන්ත්‍රීතුමාගේ අද දින නිවාඩුව අනුමත කරනවා. අද දින මන්ත්‍රීවරුන් වෙලාවට පැමිණ තම අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධව ගෞරවණීය ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා. සියළු දෙනාට සුභ අනාගතයක් පතමින් සභාවේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනවා.

සභාපති,

නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී.　　　　　දිනය:- ................................

I. උඩලමත්ත මීපෙ ගෙදර ලග ඒදණ්ඩ නැවත සකස් කිරීම සදහා අවශ්‍ය පොල් ගස් හා අනෙකුත් ද්‍රව්‍යයන් ලබා දීම. ඒ සදහා අවශ්‍ය ශ්‍රමය සදහා සෘජු ශ්‍රමික පදනමින් ගෙවීම් සදහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස යෝජනා කරමි.

II. උඩලමත්ත මීපෙ ගෙදර ඒදණ්ඩ වෙනුවට එච්අයන් යොදා අඩිපාලමක් සකස් කිරීමට ඇස්තමේන්තුවක් සකස් කිරීමට යෝජනා කිරීම

III. උඩලමත්ත කන්දඋඩදෙනිය මාර්ගය පිළිසකර කිරීමට වීරකෝන් මහතාගේ නිවස අසලට කොරිපස් කියුබ් කිහිපයක් ලබා දෙන ලෙෂ යෝජනා කරමි. ඒ සදහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස ඉල්ලමි.

IV. බණ්ඩාරනායකපුර මහවල වංගුව අකුලහේන මාර්ගය සදහා සිළිංඩර ලබාදීමට ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස ඉල්ලා සිටිමි.

V. උඩලමත්ත තල්පෙගෙදර වත්ත මාර්ගය සදහා පැති බැම්මක් සකස් කිරීමට ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස ඉල්ලා සිටිමි.

VI. බණ්ඩාරනායකපුර බංඩිහේන මාර්ගයට J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීමට ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස ඉල්ලා සිටිමි.

VII. විලමාවත I පටුමග සඳහා J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීමට ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස ඉල්ලා සිටිමි.

VIII. උඩලමත්ත දිමුතු වෙළදසැල මයියොක්කාහේන මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා සකස් කිරීමට යෝජනා කරමි.

මන්ත්‍රී යෝජනා සභාවේ ඒකමතික එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.